වාර්ෂික වාර්තාව

2019

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව -2019

පටුන **පිටුව**

දැක්ම හා මෙහෙවර	4
ඓතිහාසික පසුබිම	5-9
2019 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය	10
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	11-12
2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය	13
අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන	14
2019 විගණන කමිටු වාර්තාව	15-16
ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම්	17-19
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල -2019	20

01 -කොටස **පාලන වාර්තාව**

පළමුවැනි පරිච්ඡේදය	**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම**	**(22-39)**
	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සංයුතිය හා කර්තව්‍යයන්	22-23
	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය	24
	මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය	25-37
	සැලසුම් හා මෙහෙයුම් අංශය	38
	අභ්‍යන්තර විගණන අංශය	38-39

දෙවැනි පරිච්ඡේදය	**තාක්ෂණ සේවා අංශය**	**(40-67)**
	කාර්යභාරයන්	40
	ව්‍යාපෘති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම	40-45
	පහල නිම්න සංවර්ධන අංශය	40
	ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්	44-45
	ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය	46-49
	මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය	50-53
	ජල කළමනාකරණ ලේකම් කාර්යාලය	54-57
	ඉඩම් පරිහරණ සැලසුම් අංශය	58-61
	වන හා පරිසර සංරක්ෂණ අංශය	62-67

පටුන		පිටුව
තුන්වැනි පරිච්ඡේදය	**සංවර්ධන අංශය**	**(68-104)**
	ඉඩම් අංශය	68-70
	කෘෂිකර්ම සංවර්ධන අංශය	71-75
	ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය	76-84
	ආයතන සංවර්ධන අංශය	85-89
	ව්‍යාපාර සංවර්ධන අංශය	90-96
	මානව සම්පත් සංවර්ධන අංශය	98-102
	පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය	103-104
සිව්වැනි පරිච්ඡේදය	**මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය**	**(105-127)**
	පිරිස් හා පාලන අංශය	105-108
	නීති අංශය	109-110
	මුදල් අංශය	110-111
	මහවැලි ආරක්ෂක බලකාය	112-116
	මහවැලි කේන්ද්‍රය	117-124
	ප්‍රවාහන අංශය	122-127
පස්වැනි පරිච්ඡේදය	i කොටස ශ්‍රී ල.ම.අ.යටතේ පිහිටුවනු ලැබූ සමාගම්	128
	ii කොටස වාර්ෂික ගිණුම්	129-146
	iii කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව	147-164
	iv කොටස විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම	165-180
	v කොටස ශ්‍රී ල.ම.අ. සමස්ථ කාර්ය සාධන වාර්තාව හා ආයෝජන සැලැස්ම -2019	181-197

දැක්ම

තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

මෙහෙවර

මහවැලි ප්‍රජාව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය දායක කර ගනිමින් නවීන තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදක හා තිරසාර කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා මෙහෙයවීම.

ඓතිහාසික පසුබිම

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ.ටො. මිලියන 1.8ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ.ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ත පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුල සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක බෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංගා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහනයට ගෙන වියළි කලාපය මැදින් මුහුදු වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංගාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියලි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියලි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම

අධ්‍යයනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපේ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපේ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.

නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

<u>මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)</u>

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එච් කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එච් කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යෑම ප්‍රධාන ගැටළුවක් විය. රට තුල සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක්

වූ අතර 31% ක් ආනයනය මත රඳා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී.

විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය.

මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

<u>මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)</u>

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධනය කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙලින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත්, පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවෙට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත් ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී.

1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන පෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැලසුම් (තෙවන සංවර්ධන අදියර)

මහවැලි සංවර්ධන වැඩසටහන රටේ සිව් දෙස ව්‍යාප්තවීමේ අදියර ලෙස තෙවන සංවර්ධන අදියර හැඳින්විය හැකිය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය හරහා උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ, මධ්‍යම පළාත්වල කුඩා පරිමාණ වැව් 1200 කට ජලය සැපයීමේ අරමුණින් මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ඇලහැර ප්‍රදේශයේ කුඹුරුවලට, පොළොන්නරුව ප්‍රදේශයේ සියලු ජලාශ වලට හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන ජලාශ වලට වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් ලබා දී නව වගා ඉඩම් හෙක්. 81,000 සඳහා ජලය සම්පාදනය කරමින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීම මගින් දැය ස්වයංපෝෂිත කිරීමට දායකවීමත්, එහි විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙ.වො. 25 ක ධාරිතාවක් එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායකවීමත් මෙහි මූලික අරමුණු අතර වේ. එමෙන්ම ව්‍යාපෘතිය හරහා අවතැන් වූ ජනතාවට අවශ්‍ය ජනාවාස ඉදිකර දීමෙන් නොනැවතී, සියලු යටිතල පහසුකම් සපිරි ලග්ගල නගරය අලුතින්ම ඉදිකර ජනතා අයිතියට පත් කිරීමේ මහඟු මෙහෙවරද මේ වන විට සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මස අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් අතරින් තවත් එක් පියවරක සාර්ථක නිමාවක් දකිනු ඇත.

මහවැලි සංවර්ධන අධිකාරිය තම කර්තව්‍ය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ මගින් උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය වැලිමඩ ප්‍රදේශයේ ඉදිකළ ජලාශය දෙකක එක්රැස් කර, දිවයිනේ ප්‍රථමවරට කි.මී. 15.6 ක උමං මාර්ගයක් ඔස්සේ කිරිඳිඔය ද්‍රෝණියට හරවා යැවේ. එමගින් ආසියාවේ විශාලතම භූගත විදුලි බලාගාරය හරහා මෙ.වො. 120 ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත්, අතිදුෂ්කර ඌව පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම හා ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම යන තම මූලික අරමුණු කරා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ගමන් කරමින් සිටී. මෙම ව්‍යාපෘතිය 2019 අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සක්‍රීය ජල කළමනාකරණ ව්‍යුහයට අන්තර්ගත වනු ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත ජලාශ හා අනෙකුත් ජලාශ පිරිසිදු ව්‍යාපෘතියක් මෙන්ම ජල පෝෂක ප්‍රදේශ, ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී.
සුනිත්‍ය බල ශක්ති වැඩසටහන යටතේ මහවැලි ජලාශවල පාවෙන සූර්ය බලශක්ති පද්ධති සවි කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී ලෙස ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත් ඒ මගින් විශාල ආදායම් උත්පාදනයක් සිදුකිරීම හරහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නව උපායමාර්ගික අදායම් මාර්ග හඳුනා ගනිමින් සිටී.
මේ අතරම මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වලව කලාපය, රඹකැන්ඔය, මහවැලි බී කලාපය, මහවැලි එච් කලාපය යන කලාප ආශ්‍රිතව තවත් දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තෙවන සංවර්ධන අදියරේ සියලු මූලික අරමුණු ඉටුකර ගැනීමේදී රටේ සිව් දෙස ව්‍යාප්ත වෙමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික, වාරිමාර්ග හා පශු සම්පත්, බලශක්ති උත්පාදනය, පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍ර වලින් උපරිම දායකත්වය ලබා දීමේ අදියර වෙත ක්‍රම ක්‍රමයෙන් ගමන් කරමින් සිටී.

2019 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අනු අංකය	නම / තනතුර	කාලය
01	ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	(2018 නොවැම්බර් 2019 දෙසැම්බර්)
02	ඉංජි.බී.ඒ සුනිල් එස්. පෙරේරා මහතා අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	2019 දෙසැම්බර් සිට
03	එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා අධ්‍යක්ෂ ජනරාල් මුදල් අමාත්‍යාංශය	2018 මාර්තු සිට 2019 දෙසැම්බර්
04	ඉංජි. එස්. මෝහන රාජා මහතා අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	2018 ජනවාරි සිට 2019 දෙසැම්බර්
05	ඉංජි. සී. එච්. දේවේන්ද්‍රා මහත්මිය අතිරේක ලේකම් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	2018 ජනවාරි සිට 2019 ජුනි
06	ඩී. ජීවනාදන් මහතා අතිරේක ලේකම් 1 (පාලන) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	2019 අගෝස්තු සිට 2019 දෙසැම්බර්
07	තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික	2018 ජනවාරි 2019 දෙසැම්බර්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය.

අනු අංකය	තනතුරු නාමය	නම
1	අධ්‍යක්ෂ ජනරාල්	ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා (2018.11.09 - 2019.12.02 වන දින දක්වා)
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	එම්.එච්.ජී. බණ්ඩාර මහතා (2018.08.28 - 2019.01.14 වන දින දක්වා)
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)	එම්.එච්.ජී. බණ්ඩාර මහතා (වැ.බ.) (2018.11.15 - 2019.01.14 වන දින දක්වා)
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)	ඉංජි. පී.ජී. ගුණපාල මයා (2019.04.19 වන දින සිට මේ දක්වා)
4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)	-
5	අධ්‍යක්ෂ (පිරිස් හා පාලන)	එම්.එච්.ජී. බණ්ඩාර මහතා (වැ.බ.) (2018.11.15 - 2019.01.14 වන දින දක්වා)
		ටී.ඩී. ප්‍රියන්ත මයා (රාජකාරී ආවරණය) (2019.01.25 වන දින සිට 2019.03.31 වන දින දක්වා)
		එච්.කේ.ජී. නිරෝෂණා මහත්මිය (2019.04.01 - 2020.02.12 වන දින දක්වා
6	අධ්‍යක්ෂ (මුදල්)	ටී.ඩී. ප්‍රියන්ත මයා
7	අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	කේ.ඒ.එම්.සී.එම්. පිරිස් මිය (2017.04.24 - 2018.12.31 වන දින දක්වා (වැ.බැ.), 2019.01.01 වන දින සිට 2020.10.01 වන දින දක්වා (ස්ථීර))
8	අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය)	අරුණ ප්‍රභාත් ලේකම්ගේ මයා (2016.03.10 - 2019.03.10 වන දින දක්වා (කොන්ත්‍රාත් පදනම මත)
9	අධ්‍යක්ෂ (කෘෂිකර්ම)	ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා (2017.03.15 වන දින සිට මේ දක්වා)
10	අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්)	එම්.ජී.ටී. ප්‍රියදර්ශනි මිය (2018.12.20 වන දින සිට මේ දක්වා)
11	අධ්‍යක්ෂ (ඉඩම්)	ඩී.ඒ.ඒ.යූ. ගුණසේකර මයා 2019.01.31 වන දින සිට මේ දක්වා (ද්විතියන පදනම මත)
12	අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන)	එම්.එල්.ඩී.සී. අබේවර්ධන මයා (රාජකාරී ආවරණය)
13	අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන)	ඩී.කේ.එච්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ආර්. සෙනෙවිරත්න මිය (2019.06.25 වන දින සිට මේ දක්වා)
14	අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්)	ඉංජි. ටී.එම්. අතපත්තු මිය (2016.05.18 වන දින සිට මේ දක්වා)
15	අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන)	ඉංජි. පී.ජී. ගුණපාල මයා (2017.06.01 වන දින සිට මේ දක්වා)
16	අධ්‍යක්ෂ (මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු)	ඉංජි. එස්.ආර්.කේ. අරුප්පොල මයා (2017.02.01 වන දින මේ දක්වා)
17	අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ)	ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය
18	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)	ජේ.එම්.අයි.එච්. ජයවර්ධන මිය (රාජකාරී ආවරණය)

19	අධ්‍යක්ෂ (වන හා පරිසර)	ඒ.එම්.කේ.බී. අත්තනායක මයා
20	අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය)	ඉංජි. ජී.කේ.ටී. සමරතුංග මෙය
21	අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන)	බී.එල්.බී. සේනාරත්න මයා (රාජකාරී ආවරණය)
22	අධ්‍යක්ෂ (පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති)	ඩී.කේ.වී. විජයවීර මිය
23	අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)	ජේ.ආර්. බෝපිටිය මයා (රාජකාරී ආවරණය) (2019.11.15 වන දින සිට මේ දක්වා)
24	අධ්‍යක්ෂ (ආරක්ෂක)	මේජර්. එල්.ඒ.පී. ජයවර්ධන මයා (2019.01.29 වන දින දක්වා)
25	අධ්‍යක්ෂ (නීති)	ආර්.එල්. රාජපක්ෂ මිය
26	නේවාසික ව්‍යාපාර කළමනාකාර (බී කලාපය)	එස්.ටී. දන්තනාරායන මයා (වැ.බැ.)
27	නේවාසික ව්‍යාපාර කළමනාකාර (සී කලාපය)	කේ.ඒ.සී.වී මල් කුමාර මයා (වැ.බැ.)
28	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඩී කලාපය)	ජේ.පී. ජයතිලක මයා (රාජකාරී ආවරණය)
29	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එල් කලාපය)	එච්.කේ.පී. ජයනාද මහතා (2019 අප්‍රේල් දක්වා) පී.ජී.එන්. ජයසිරි මයා (රාජකාරී ආවරණය) (2019.02.28 - 2020.02.10 වන දින දක්වා)
30	නේවාසික ව්‍යාපාර කළමනාකාර (ජී කලාපය)	ඒ.ජී.ටී. හේමන්ත ජයසිංහ මයා (රාජකාරී ආවරණය)
31	නේවාසික ව්‍යාපාර කළමනාකාර (එච් කලාපය)	අයි.එම්.යූ.කේ. කුමාර මහතා 2016.04.29 - 2018.06.04 වන දින දක්වා (වැඩ බැලීම) 2018.06.05 වන දින සිට මේ දක්වා (ස්ථිර)
32	නේවාසික ව්‍යාපාර කළමනාකාර (වික්ටෝරියා කලාපය)	ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා 2018.06.05 වන දින සිට මේ දක්වා
33	නේවාසික ව්‍යාපාර කළමනාකාර (හුරුළුවැව කලාපය)	ඊ.එච්. ජයරත්න මයා (රාජකාරී ඉටු කරන)
34	නේවාසික ව්‍යාපාර කළමනාකාර (රඹකැන්ඔය කලාපය)	එච්.එම්. විජේරත්න මයා (2018.11.01 වන දින සිට මේ දක්වා)
35	නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය)	ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා (2019.08.31 වන දින දක්වා (වැඩ බැලීම) හා 2019.09.24 වන දින සිට මේ දක්වා (ස්ථිර)

2019 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය.

මහවැලි සංවර්ධන බහුකාර්ය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. දැනට ශ්‍රී ලංකාවේ 1/3 කට අධික භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින මහවැලි බල ප්‍රදේශ තුල වාසය කරන ජනගහනය දශ ලක්ෂයකට ආසන්නය. මහවැලි සංවර්ධන වැඩසටහනේ ආරම්භක අරමුණු අතර වියළි කලාපයේ කෘෂිකාර්මික, ධීවර්, විදුලිබල, පශු සම්පත් යනාදි ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම, ගංවතුර පාලනය, නව රැකී රක්ෂා ජනනය ඇතුළුව බත බුලතින් රට සශ්‍රීක කිරීම ආදිය විය.

දැනට මහවැලි ප්‍රදේශවල පවතින ඵලදායිතාව වැඩිකිරීම සඳහා කෘෂිකාර්මික, කෘෂි ව්‍යාපාරික, ජල පාලන, සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලියන් සහ සුනිත්‍ය බලශක්ති නිෂ්පාදනය සඳහා ව්‍යවසායකයන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතනවල මැදිහත්වීම ලබා ගැනීමට සැළසුම් කොට ඇත. මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. දැනට මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කරගෙන යනු ලබන පර්යේෂණ කටයුතු වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන එයින් ඉදිරියේදී මහවැලි නිෂ්පාදන වල ඵලදායිතාවය වැඩි කර ගැනීමට ද බලාපොරොත්තු වේ. ඒ අනුව ක්‍රියාත්මක කරගෙන යනු ලබන ලිහිණියාගම, කොත්මලේ පටක රෝපණ ආයතනයේ කටයුතු වල සාර්ථක ප්‍රතිඵල ද මෙම මහවැලි කලාප වල කෘෂි ආදි ක්ෂේත්‍රවල ඵලදායිතාව වැඩි කර ගැනීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියාත්මක කෙරෙන පර්යේෂණ ව්‍යාපෘතීන් අතර වේ.තරුණ කණ්ඩායම් කෘෂිකර්මාන්තයට යොමු කිරීම සඳහා දිරි ගැන්වීමක් ලෙස ඉදිරියේදී කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘති හා නව තාක්ෂණ ක්‍රමද හඳුන්වා දීමට කටයුතු කර ඇත.

දැනට මහවැලි ව්‍යාපාරය යටතේ රටේ විශාල වපසරියක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති වාරි පද්ධතිය මගින් රටේ විශාල ප්‍රදේශයක් සඳහා කෘෂි ජලය, පානීය ජලය මෙන්ම විදුලි උත්පාදනයටද විශාල දායකත්වයක් සපයනු ලැබේ. එහෙත් ඉදිරියේදී පවතින විශාල ජල ඉල්ලුම හමුවේ යම් යම් ජල හිඟතා ඇතිවන ප්‍රදේශවලට, විශේෂයෙන්ම තද වියළි කාලගුණ තත්ත්ව වලදී හිඟතාවයකින් තොරව ජල සැපයුමක් ලබා දීමේ අරමුණින් (කැළණි ගඟ) කෙහෙල්ගමු ඔය ඉහළ ජාලාධාර ප්‍රදේශයෙන් හරවා මහවැලි ගඟේ ජල ධාරිතාවය වැඩි කර උපරිම ඵල නෙලා ගැනීමට ඇති හැකියාව පිළිබඳ මූලික විමර්ශන කටයුතු දැනටමත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉංජිනේරුවරුන් මගින් සිදුකෙරෙමින් පවතී. තවද මේ මගින් කොත්මලේ ජලාශයේ ජල ධාරිතාව ඉහළ නැංවීමටද අවශ්‍ය මූලික සැලසුම්/ පරීක්ෂණ කටයුතු අරඹා ඇත.

මේ වන විට දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස විශාල ජලාශ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් හා ජල පෝෂක ප්‍රදේශ ගංහා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බස්නාහිර පළාත හැර දිවයිනේ අනෙක් සෑම පළාතකම ව්‍යාප්ත වෙමින් දැවැන්ත වැඩසටහනක්ව ක්‍රියාත්මක වේ.

ඉහත කාර්යයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන දර්ශනය, මහ පෙන්වීම සහ උපදේශකත්වය සපයන මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග, ග්‍රාමීය සංවර්ධන හා අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාව හා පාරිභෝගික සුබසාධන ගරු අමාත්‍යතුමන් වන ගරු වමල් රාජපක්ෂ මැතිතුමාගෙන් ලැබෙන ධෛර්යය ඉතා අගය කොට සලකමි. එමෙන්ම ගරු මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා, ආමාත්‍යාංශ ලේකම්තුමාගේ මෙන්ම රාජ්‍ය ලේකම්තුමාගේ ද මෙහෙයවීම් මත ඉහත ඉලක්ක සාර්ථකව ජය ගැනීම සඳහා කටයුතු කරන සමස්ථ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්ය මණ්ඩලය හා සමස්ථ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



කීර්ති.බී.කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2019-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමඟ කාරුණිකව ඉදිරිපත් කරමු.

වර්ෂය පිළිබඳ සමාලෝචනය.

අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර්ගත කර ඇත.

එසේම සංවිධානයේ වත්කම්, සුරැකීම්, වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොය බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිළිබඳ මනා කළමනාකාරිත්වයකින් කටයුතු කර ඇත.

තවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කාර්ය මණ්ලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.



එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා

අධ්‍යක්ෂ ජනරාල්

මුදල් අමාත්‍යාංශය



ඉංජී.එස්. මෝහනරාජා මහතා

අධ්‍යක්ෂ ජනරාල්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව



ඩී.ජීවනාදන් මහතා
අතිරේක ලේකම් - 1 (පාලන)



තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික

2019 විගණන කමිටු වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය:

මහවැලි අධිකාරියේ ඵලදායි කාර්ය සාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය හා කාර්ය සාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2019 වර්ෂය තුල විගණන කමිටු උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන සැලැස්මක් ඔස්සේ අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ අතර, අකාර්යක්ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කරමින්, වංචා දූෂණ සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා මෙම අංශය තුලින් පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

2019 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය

- අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ වර්ෂය තුළ විගණන වාර්තා 22 ක් නිකුත් කිරීම.
- විමර්ශන 03 ක් පවත්වා විමර්ශන වාර්තා ලබා දීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
- විගණන විමසුම් සඳහා ලබාදුන් පිළිතුරු පසුවිපරම් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එහි සභාපතිත්වය මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරියෙකු විසින් දරනු ලබයි.

වර්ෂය තුළ විගණන කමිටු සාමාජිකත්වය:

- හේමාල් කස්තුරිආරච්චි මහතා - කමිටු සභාපති - භාණ්ඩාගාර නියෝජිත
- තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික
- ඉංජී. සී. එම්. දේවේන්ද්‍ර මිය - සාමාජික

කමිටුව සඳහා සහභාගිත්වය:

- අධ්‍යක්ෂ (මුදල්)
- අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රජයේ විගණන අධිකාරි
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක
- අවශ්‍යතාවය අනුව කැඳවුම් ලබන අනෙකුත් අදාල නිලධාරීන්

<u>කමිටුවේ කාර්යභාරය:</u>

- ❖ අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිසංවිධානය සඳහා උපදෙස් ලබාදීම හා වාර්ෂික විගණන සැලසුම කෙරෙහි අවධානය යොමු කිරීම.
- ❖ විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා පිළිබඳ අවධානය යොමු කර විගණන විමසුම් ආශ්‍රයෙන් අධිකාරියේ පවතින ගැටළු හඳුනා ගැනීම හා ගැටළු විසඳීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ❖ 1971 අංක 38 දරණ මුදල් පනතේ 142(ඇ) අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් මතු කර ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකර අධිකාරියේ අභ්‍යන්තර පාලන කටයුතු විධිමත් කිරීමට උපදෙස් ලබාදීම.
- ❖ ආයතනික කාර්ය සාධන වාර්තා කාර්තුමය වශයෙන් සමාලෝචනය.

<u>නිර්දේශය:</u>

ඉහත කරුණු වලදී හඳුනාගත් ගැටළු නිවැරදි කිරීමට උපදෙස් දෙමින් කමිටුව විසින් සැපයූ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් ආයතනයේ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත.

ඉකුත් වසර 07 ක වත්කම් හා වගකීම්

	2019	2018	2017	2016	2015	2014	2013
	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ පිරියත හා උපකරණ	4,972,468	4,675,657	4,116,187	4,195,724	4,294,893	4,259,208	4,549,301
ආයෝජන	166,299	171,313	187,531	178,556	152,577	175,359	166,731
ප්‍රාග්ධන නොනිමි වැඩ	47,482	84,947	78,552	41,301	74,286	62,506	48,362
මුළු ජංගම නොවන වත්කම්	**5,186,249**	**4,931,917**	**4,382,270**	**4,415,581**	**4,521,756**	**4,497,073**	**4,764,394**
ජෙව වත්කම් - ප්‍රාග්ධන	219,777	167,027	134,578	101,940	-	-	-
යෝජිත කපා හැරීම්	-	-	859	859	-	-	-
ජංගම වත්කම්							
භාණ්ඩ තොග	170,983	180,342	184,815	168,173	157,428	180,900	174,028
ජෙව වත්කම් - වෙළඳ	47,178	26,312	15,875	22,630	-	-	-
ලැබිය යුතු - වෙළඳ හා අනෙකුත්	2,997,661	2,032,715	2,084,069	1,730,015	1,307,077	1,274,329	1,150,958
අස්ථිර ගිණුම	-	-	-	-	-	-	-
	-					-	

කලින් ගෙවීම්		4,767	3,896	8,754	5,172		38
බැංකු ඇපකර	374	6,292	6,164	4,153	1,372	837	905
අන්තර් සමාගම් ජංගම ගිණුම් ශේෂයන්	-	-	-	-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ	258,877	312,702	343,312	312,750	429,588	190,391	140,950
ජංගම වත්කම් වල එකතුව	3,475,073	2,563,130	2,638,131	2,246,475	1,900,637	1,646,457	1,466,879
වත්කම් වල එකතුව	**8,881,100**	**7,662,074**	**7,155,838**	**6,764,855**	**6,422,393**	**6,143,530**	**6,231,273**
බැරකම්							
ජංගම බැරකම්							
ගෙවිය යුතු	968,185	651,986	879,967	376,737	341,286	491,622	528,482
ඵලායන්ස් ෆිනෑන්ස් සමාගමේ කල් බදු	-	-	2,153	3,080			
උපචිත වියදම්	211,909	102,067	175,733	122,286	46,159	207,705	87,145
අන්තර් ආයතන ජංගම ගිණුම් ශේෂයන්	-	-					
ජංගම බැරකම්වල එකතුව	**1,180,094**	**754,053**	**1,057,853**	**502,103**	**387,445**	**699,327**	**615,627**
<u>ජංගම නොවන</u>							
<u>**බැරකම්**</u>							
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්	1,371,814	1,379,494	1,388,101	1,489,288	1,551,379	1,311,876	1,157,688

බැංකු ණය	-	-		2,455			
කල් බදු	-	219	271	2,653	11,247	14,329	6,243
විලම්බිත බදු	612	612	612	612	612	612	612
ජංගම නොවන බැරකම් වල එකතුව	**1,372,426**	**1,380,325**	**1,388,984**	**1,495,008**	**1,563,238**	**1,326,817**	**1,164,543**
බැරකම් වල එකතුව	**2,552,520**	**2,134,378**	**2,446,837**	**1,997,111**	**1,950,683**	**2,026,144**	**1,780,170**
ශුද්ධ වත්කම්වල එකතුව	**6,328,579**	**5,527,696**	**4,709,001**	**4,767,744**	**4,471,710**	**4,117,386**	**4,451,103**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය							
සමුච්චිත අරමුදල	1,837,751	24,649,830	24,407,260	24,066,161	23,702,950	23,383,849	23,224,435
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය	(657,528)	(24,040,551)	(23,755,208)	52,121	53,992	67,466	53,560
ආදායම් සංචිත - සමාගම්	48,288	50,865	4,006,082	4,019,027	4,021,721	3,837,266	3,851,627
ප්‍රත්‍යාගණන සංචිත	5,100,069	4,867,551	50,865	(23,369,566)	(23,276,474)	(23,171,205)	(22,678,520)
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව	**6,328,580**	**5,527,696**	**4,708,999**	**4,767,743**	**4,502,189**	**4,117,376**	**4,451,102**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය - 2019

අනු අංකය	සමාගම්	සභාපති	අධ්‍යක්ෂ මණ්ඩලය	ප්‍රධාන කාර්යාලීය ලිපිනය
01.	සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම		1. පරාක්‍රම අබේවර්ධන මයා 2. එඩ්වඩ් ද මැල් මයා (අධ්‍යක්ෂ) 3. ඔස්මන් ද සිල්වා (අධ්‍යක්ෂ)	අංක 260/20, බෙස්ලයින් පාර, කොළඹ 09
02.	සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය	වෛද්‍ය හර්ෂ සමරවීර මයා	1. කේ.එල්.එස්.සහබන්දු මයා 2. ඉංජි එල්.ආර්.එච්.පෙරේරා	අංක 11, ජාවත්ත පාර, කොළඹ 05
03.	ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම	ඉංජි.ඒ.ඒ.වී. ඩයස් මයා	1. ඉංජි.බී.ඩබ්.එන්.ඩබ්.සෙනෙවිරත්න බණ්ඩා මයා. 2. .එන්.එම්.කේ.බී.අත්තනායක මයා 3. එල්.එම්.ධර්මසිරි මයා 4. .එම්.ජී.අබේරත්න බණ්ඩාර (සමාගම් ලේකම්)	වේල්ල පෙදෙස, පොල්ගොල්ල, මහනුවර

පාලන වාර්තාව

I කොටස

පළමු පරිච්ඡේදය

1.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය.

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍ර, ස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැඟීම. එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායී වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුබසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජන ක්‍රමය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන රජයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

1.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම් මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම.
- වත්කම් නඩත්තුව හා පරිපාලනය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුලින් වත්කම් අපහරණය කිරීම.
- කාලරාමුවකට අනුව මොරගහන්ද කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම.
- බී කලාපය දකුණු ඉවුර හා එල් කලාපයේ වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යයනයක් සිදුකිරීම.
- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කෘෂිකාර්මික ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදන වැඩසටහන් දියුණු කිරීම හා රටේ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- වාරි පද්ධති නඩත්තුව හා කළමනාකරණය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිලිබඳ නිලධාරීන් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම.
- ‘‘සමෘද්ධිමත් දැයකට මහවැලි සත්ත්ව නිපැයුම්’’ තේමාව යටතේ මහවැලි ජානපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.
- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජානපදිකයන්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.
- සියළුම මට්ටම් වල නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිසනක ගත කර ඊ-මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.
- රේඛීය ආයතන සමඟ සාකච්ඡා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුළින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලි නිෂ්පාදනය හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා ජලය වෙන් කර දීම.
- බී, සී, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව, වලව, වික්ටෝරියා සහ නව කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගීකරණය, සමාජ හා ආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.
- ජල කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය කෘෂිකාර්මික සංවර්ධනය පස සහ ජලය සංරක්ෂණය දියබෙත්ම කලමනාකරණය පාරිසරික දූෂණය හා ජල දූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රධාන ජලාශවල හැරවුම නිර්මිත සුරක්ෂිතාවය සිදු කිරීම සඳහා සඵලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ගොවි සංවිධාන දැනුවත් කිරීම.

1.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය.



1.4 මහවැලි කලාප - ව්‍යුහය, පරිපාලනය හා වර්තමාන තත්වය

මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇති කරන ලද ජනාවාස පරිපාලනය වාරි පද්ධති මෙහෙයවීම නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නය ආශ්‍රිතව බී, සී, ඩී, එච්, මොරගහකන්ද, වික්ටෝරියා, හුරුළු වැව යන කලාපද උඩවලව, වැලිඔය (එල් කලාපය) සහ රඹුක්කන්ඔය කලාප වැනි විශේෂ කලාප ද මෙසේ ආරම්භ කර ඇත.

මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමනාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.
එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ, ඉඩම්, කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරීන් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාස කළමනාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාස කළමනාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු, ආයතන සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියලු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරීම හා එක් එක් ඒකකයකට එක් ඒකක කළමනාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් 250-300 අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරීම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදුකරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුව ය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ පසු කටයුතු ද සිදු කරනු ලැබේ. මීට අමතරව වාණිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේ ද, මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම් ලබා දීම ද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමනාකරණය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව, කළමනාකරණය හා වැඩි දියුණු කිරීම ද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය ගොවිපල සංවර්ධනය, පුහුණු හා ආදර්ශ කටයුතු ද පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු ව්‍යාපෘති සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම, වාණිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපීය පරිපාලනය යටතේ සිදු කෙරේ.

මහවැලි කලාප - සිතියම



බී කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම:

මහවැලි බී කලාපය මාදුරු ඔය ජලාශය යටතේ පහළ නිම්නයේ මුළු දළ බිම් ප්‍රමාණය හෙක්. 75,441.5 ක පැතිරි පවතින අතර පොළොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්ක යටතට ගැනෙන විශාලතම ව්‍යාපෘතිය ලෙස හැඳින්විය හැකිය. වාරිමාර්ග කළමනාකරණ අභිප්‍රාය පෙරදැරිව ව්‍යාපෘති ප්‍රදේශය පරිපාලන කොට්ඨාස 08 ට බෙදා ඇත.

මහවැලි "බී" කලාපයේ 1983 න් පසුව වූ ජනාවාසකරණය

අංක	විස්තරය	1990	2007	2018
1	පවුල් ඒකක	14,872	25,225	32,545
2	ජනගහනය	68,411	130,130	149,125

මහවැලි "බී" කලාපය සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2019 වර්ෂය

අ.අ.	අංශය	2019 වර්ෂය සඳහා වෙන්කර ඇති (රු. මී.)	මූල්‍ය ප්‍රගතිය 2019.12.31 දිනට
01	තාක්ෂණ සේවා අංශය	86.00	102.86
02	පාලන අංශය	03.15	03.15
03	ප්‍රවාහන අංශය	07	07.02
04	ව්‍යාපාර සංවර්ධන අංශය	03.50	03.20
05	ආයතන සංවර්ධන අංශය	13	15.88
06	ඉඩම් අංශය	35.70	43.82
07	ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය	01	0.850
08	වන හා පරිසර අංශය	09	09.80
09	මහවැලි කේන්ද්‍රය	06.65	06.66
	එකතුව	165.00	193.221
නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීමේ වැඩසටහන 2018 ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම්			
10	කෘෂිකර්ම සං. අංශය	29.00	29.52
11	ධිවර හා පශු සම්පත් සං. අංශය	05.53	05.58
	මුලු එකතුව	199.53	228.32

සී කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ නව සංවර්ධන කලාපයක් ලෙස ආරම්භ වූ " සී" කලාපය බස්නාහිරින් මහවැලි ගඟෙන් ද, නැගෙනහිරින් උල්හිටිය ජලාශ රක්ෂිතය හා මාදුරුඔය වනෝද්‍යානයෙන්ද, උතුරින් මහවැලි බී කලාපයද, දකුණින් මහියංගන ප්‍රදේශය ද මායිම්ව බදුල්ල, අම්පාර හා පොලොන්නරුව යන පරිපාලන දිස්ත්‍රික්ක 03 ට අයත්ව පිහිටා ඇත. මෙම කලාපයෙහි දළ භූමි ප්‍රමාණය හෙක්. 30,760 කි.

කලාපයේ මූලික තොරතුරු:

- කෘෂි දේශගුණික කලාප - $DL_1/DL_2/IL_2$
- වගා කරන බිම් ප්‍රමාණය හෙක්. - 22,406
- සංවර්ධනය කරන ලද ගෙවතු - 35,640
- කලාපයේ ජනගහනය - 185,356
- වගා කරන ප්‍රධාන බෝගය - වී
- සංවර්ධනය කරන ලද ගෙවතු - 35,640
- කලාපයේ ජනගහනය - 185,356
- දියවර සැපයෙන ප්‍රධාන ජලාශ - උල්හිටිය, රත්කිඳ
- ජලය රැස් කරන ජලාශ - 56

මහවැලි " සී " කලාපයේ 2019 වර්ෂයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	අංශය	2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය 2019.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය	සමස්ත මූල්‍ය ප්‍රගතිය
			(රු.මි)	(%)
1	තාක්ෂණ සේවා අංශය	114.00	110.05	97%
2	ඉඩම්	18.00	16.39	91%
3	ඉඩම් පරිහරණ සැලසුම්	1.00	0.49	49%
4	ආයතන සංවර්ධන	16.30	11.26	69%
5	ව්‍යාපාර සංවර්ධන	3.50	3.02	86%
6	ක්‍රීඩා හා සංස්කෘතික	5.20	5.83	112%
7	වන හා පරිසර	5.50	9.26	168%
8	පාලන	5.50	4.43	80%
9	ප්‍රවාහන	7.00	7.27	104%
උප එකතුව - ආයතනික ප්‍රාග්ධනය		176.00	167.99	95%
10	කෘෂිකර්ම	13.00	13.32	102%
11	පශු සම්පත් සංවර්ධන	4.50	4.18	93%
12	විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම	10.00	6.93	69%
උප එකතුව - ව්‍යාපෘති		27.50	24.43	89%

ඩී කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කල මැදිරිගිරිය ප්‍රදේශයේ 2004 වර්ෂයේ ස්ථාපිත කර ඇති මහවැලි ඩී කලාපය කොට්ඨාශ 02 කින් යුක්ත වේ. ඒ බිසෝපුර සහ සූරියපුර වේ. බිසෝපුර කොට්ඨාශය මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලැබූ පළමු ජනපද පුරවරයයි. බිසෝපුර කොට්ඨාශය ඒකක 04 කින් සමන්විත වේ. උතුරින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශය දක්වාත්, නැගෙනහිරින් සේරුවිල ප්‍රදේශය දක්වාත්, දකුණින් හා බටහිරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර, හිඟුරක්ගොඩ ප්‍රදේශය දක්වාත් විහිදි පවතී.

විශේෂ ව්‍යාපෘති

කම්හලක් (Mini Garment) ආරම්භ කිරීම, මහවැලි පැළ තවාන ආරම්භ කිරීම සහ විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘතිය ආරම්භ කිරීම සිදු කරන ලදි. කලාපය මඟින් සිදුකරන ලද ව්‍යාපෘතියකට අනුව එක්සත් ජාතින්ගේ සංවර්ධන අරමුදල (UNDP) මඟින් මූල්‍ය ප්‍රතිපාදන මේ සඳහා සපයා ඇත.
මේ තුලින් කලාපයේ රැකියා විරහිත කාන්තාවන් සඳහා රැකියා අවස්ථාවන් ලබා දීමට හැකිවීම, ස්වයං රැකියා මට්ටමේ සිටි ගොවීන් සුළු පරිමාන ව්‍යාපාරික මට්ටමට ගෙන ඒමට හැකිවීම, ඔවුනගේ පවුල් ඒකකයේ ආදායම් තත්වය ඉහළ නැංවීමට හැකි වීම හා රටේ ආර්ථික වර්ධනයට යම්තාක් දුරට දායකත්වයක් ලබා දීමට හැකිවීම වැදගත් වේ.

ඩී කලාපයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2019-12-31 දිනට

අනු අංකය	අංශය	මූල්‍ය වෙන් කිරීම් රු.මිලියන	කාරණය	භෞතික ප්‍රගතිය
01.	තාක්ෂණ සේවා අංශය	31.440	වැව් වැඩි දියුණු කිරීම - වැව් 01	100%
			ඇනිකට් සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම	100%
			බිසෝපුර කොට්ඨාශ කාර්යාලයේ සූර්ය බල පද්ධතියක් ඉදිකිරීම	100%
			<u>මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම</u> කෘෂි මාර්ග පද්ධතිය - කි.මී.5.5 පෙට්ටි බෝක්කු - 04 බෝක්කු 02	100%
			<u>කඳවුරු නඩත්තුව</u> නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය, සංචාරක බංගලාව, කොට්ඨාශ කාර්යාල 02	100%

			<u>ගොඩනැඟිලි</u> සූරියපුර කොට්ඨාශයේ වැසිකිලි පද්ධතිය - 01 සූරියපුර කොට්ඨාශයේ සාද නිවාස - 01 සූරියපුර කොට්ඨාශ කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම	100%
අනු අංකය	අංශය	මුල්‍ය වෙන් කිරීම් රු.මිලියන	කාරණය	භෞතික ප්‍රගතිය (වැඩටහන්)
02.	ආයතන සංවර්ධන අංශය	5.00	ආයතන සංවර්ධනය ගොවි සංවිධාන සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්,අත්දැකීම් හුවමාරු , භාණ්ඩ බෙදා දීම, ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා සංස්කෘතික වැඩසටහන්	51
			ප්‍රජා සංවර්ධන වැඩසටහන් සුජාත දරුවෝ, සෞඛ්‍ය සායන, විභාග සම්මන්ත්‍රණ, ජාත්‍යන්තර දින සැමරුම්	22
			කාන්තා හා තරුණ කටයුතු ආහාර තාක්ෂණ පුහුණු වැඩසටහන්, ගෘහ ආර්ථික කළමනාකරණ වැඩසටහන්, කාන්තා කුඩා කණ්ඩායම් දැනුවත් කිරීම්	10
			ජනපදික පුහුණු වැඩසටහන් ඉදල් කොසු, ඇඳුම්, බෑග් සහ සපත්තු පුහුණු වැඩසටහන් පැවැත්වීහ	06
03.	ව්‍යාපාර සංවර්ධන අංශය	2.06	සුළු පරිමාන ව්‍යාපාරිකයින් මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් දක්වා වර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම	03
			50% දායකත්වය මත උපකරණ ලබා දීම වැසිකිලි, මැෂින්, ජංගම අලෙවි කුටි	05

<u>ඊ කලාපය</u>

කලාපය පිළිබඳ හැඳින්වීම

මෙහෙවර

පරිසර හිතකාමී නව තාක්ෂණය යොදගත් කෘෂිකාර්මික හා සංවර්ධන ක්‍රියාදාමයන් තුලින් ආර්ථික, සමාජීය වශයෙන් තිරසාර සෞභාග්‍යමත් කලාපයක් බිහිකිරීම.

ප්‍රධාන අරමුණු

මහවැලි ඊ කලාපය 2019 වර්ෂයේ ගැසට් මගින් ප්‍රකාශ කරන ලදී. කොත්මලේ - පොල්ගොල්ල වේල්ල - වික්ටෝරියා - රන්දෙණිගල - රන්ටැඹේ ජලාශ ඉදිකිරීම නිසා අවතැන් වන පවුල් මහවැලි කලාපවල පදිංචිකරවීම වෙනත් කලාප වලටයෑමට කැමැත්තක් නොදැක්වූ පවුල් මෙම ප්‍රදේශ තුල නැවත පදිංචි කිරීම, ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, සංවර්ධන කාර්යයන්ට හා මහවැලි ඉහල ජල පෝෂක සංරක්ෂණය කිරීමෙන් ජල සුරක්ෂිතාව ඇතිකිරීම මෙහි ප්‍රධාන අරමුණුයි.

ඊ කලාපයට අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මිණිපේ හා විල්ගමුව. මිණිපේ කොට්ඨාශය වර්ග අක්කර 61548 වන අතර පවුල් 17829 ජීවත්වේ. විල්ගමුව කොට්ඨාශය වර්ග අක්කර 24131 වන අතර පවුල් 14098 ජීවත්වේ.
රන්දෙණිගල වන ජීවී කලාපයෙ ප්‍රකාශයට පත් කිරීමේදි එම ප්‍රදේශ වල පදිංචිව සිටි පවුල් හා අනු පවුල් 5000 ඉඩම් අයිතිය නිත්‍යානුකූල කිරීම.ප්‍රදේශයේ පදිංචි හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම්

නොමැති පවුල් විධිමත් ඉඩම ලබාදීම.අති දුෂ්කර මෙම කලාපය අනෙකුත් රාජ්‍ය ආයතන වලට ඒකාබද්ධකර සිග්‍ර සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනක් ඇති කිරීම. යැපුම් කෘෂිකර්මාණ්තයේ නියුතු ගොවි පවුල් වාණිජ කෘෂි කර්මාන්ත වලට යොමු කිරීම.රු මිලි 1000 ආයෝජන ව්‍යාපෘතියක් විම.

ජී කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

මහවැලි ජී කලාපය ඇලහැර යෝධ ඇලෙන් පෝෂණය වන අතීත වාරි ශිෂ්ඨාචාරයක උරුමය පවතින භූමි ප්‍රදේශයකි.
ජන ශූන්‍ය වීම නිසා වල් වැදී ගිය ඇළහැර යෝධ ඇල නැවත ගරු අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන් විසින් 1947 ඉඩම් ලාභීන් පදිංචි කරවීම සිදු කරන ලදි. එයින් නව ජනාවාස බිහිවීම ආරම්භ විය. 2001 වසරේ මහවැලි බී කලාපය යටතේ කොට්ඨාස කලමනාකාර ප්‍රදේශයක්ව මෙම ප්‍රදේශය පාලනය කෙරුණි. පසුව 2004 වර්ෂයේ සිට නැවත මහවැලි ජී කලාපය ලෙස පරිපාලන කටයුතු ආරම්භ කරන ලදි.

2012 වසරේ මුල් භාගයේදී මොරගහකන්ද කළු ගඟ ජලාශ ඉදිකිරීම ආරම්භ වීමත් සමඟ එම ජලාශ වලට යට වන ඉඩම් වල පදිංචි පවුල් ඉවත් කර නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරමින් ගුරුවෙල හා වැල්ලේවෙල නමින් කොට්ඨාස කළමනාකාර කාර්යාල දෙකක් ආරම්භ කරන ලදි. 2013 වර්ෂයේදී මෙම කොට්ඨාස දෙකෙහි ගොවි පවුල් පදිංචි කර වීම සමඟ කොට්ඨාස කළමනාකාරවරුන් 4 දෙනෙකු යටතේ බකමූණ, අත්තනකඩවල, ගුරුවෙල, වැල්ලේවෙල නමින් කොට්ඨාස හතරක් මගින් පාලන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

2019 වර්ෂය තුළ නව පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව

2019 වර්ෂය තුළ නව පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව

කොට්ඨාසය	ගොවි පවුල්	ගොවි නොවන පවුල්	වෙනත්
බකමුණ	-	50	-
වැල්ලෙවෙල	147	-	-
ගුරුවෙල	-	69	මෙම අය සඳහා වාරි ඉඩම් තේරී ඇති නමුත් ඉඩම් බැහැර කර නොමැත.

2019 වර්ෂය තුළ අළුතින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව

2019 වර්ෂය තුළ නව පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව

කොට්ඨාසය	ස්ථිර	අර්ථ ස්ථිර	තාවකාලික
බකමුණ	50	-	-
අත්තනකඩවල	5	4	-
වැල්ලෙවෙල	09	22	37
ගුරුවෙල	-	38	21

එච් කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

කලා වැව කේන්ද්‍ර කොටගෙන 1977 - 1978 කාලයේ පවුල් 31500 කට මඩින් අක්කර 2½(හෙක්. 01)ද, ගොඩින් අක්කර ½ බෙදා දෙන ලද මහවැලි යෝජනා ක්‍රමයේ සුවිශේෂී කලාපය මහවැලි "එච්" කලාපයයි. මෙහි කෘෂි බිම් අක්කර ලක්ෂයක් (වාරි හා ගොඩ) පමණ පවතී.

බටහිරින්, අනුරාධපුර - පුත්තලම් මහා මාර්ගයත් , උතුරින් දකුණු ඉවුරු ඇලත් දකුණින් , බලලු වැව ඉවුරු උස්ගල සියඹලන්ගමුව ඔස්සේ රාජාංගන ඉවුරු ඇලෙනුත් සීමාවී පවතින අතර අමතර වශයෙන් කාගම කටියාව හා උස්ගල සියඹලන්ගමුව වැනි පැරණි ජනපද ප්‍රදේශ වලින් සමන්විත වේ.

කෘෂි බෝග සංවර්ධන අංශයේ මහවැලි එච් කලාපයේ දායකත්වය:

බෝගය	ජාතික නිෂ්පාදනයට දායකත්වය	විශේෂ කරුණු/ජයග්‍රහණ
වී වගාව	4-7%	ලංකාවේ ඉහළම සාමාන්‍ය වී නිෂ්පාදනය ලබා ගන්නා ප්‍රදේශ 2 අතර සිටීම (6400mt/ha ට වැඩි)
සෝයා බෝංචි වගාව	80%	ලංකාවේ වැඩිම සෝයා බෝංචි නිෂ්පාදන හා ඉහලම සාමාන්‍ය නිෂ්පාදිත ප්‍රදේශය (2.7-3mt/ha)
ලොකු ළූණු	5-10%	
මිරිස් හා අනෙකුත් අතිරේක බෝග	3-5%	
එළවළු(පහතරට)	7-10%	
අළු කෙසෙල්	35-40%	ජාතික නිෂ්පාදනයෙන් 1/3 ක් මහවැලි එච් කලාපය
පේර	20-22%	ජාතික නිෂ්පාදනයෙන් 1/5 ක් මහවැලි එච් කලාපය
කෙසෙල් පැපොල්	2-4% 2%	

ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය - 2019

අංක	ක්‍රියාකාරකම	ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
1	කිරි ගව පාලන වැඩසටහන	2490	2430.49
2	කුකුළු පාලනය	830	827.75
3	මිරිදිය ධීවර සංවර්ධන වැඩසටහන	345	195.44

4	එළු පාලනය	80	80.00
5	ධාරිතා සංවර්ධන වැඩසටහන්	115	33.74
7	කළමණාකරණ කටයුතු	147	126.00
8	නීරාවිය ගොවිපල (2018)	693	693.00
9	හොඳම කිරි ගොවියා තේරීමේ තරඟය	200	200.00
10	විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන	100	100.00
	එකතුව	5000	4686.43

<u>එල් කලාපය</u>



කලාපය පිළිබඳ හැඳින්වීම

1984 වර්ෂයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ජනාවාසකරණ කටයුතු ආරම්භ කර ඇති මෙම ප්‍රදේශය 1988 වර්ෂයේදී 562 දරණ ගැසට් නිවේදනය මගින් මහවැලි කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. හෙක්. 163,000 ක් වන මෙම කලාපයේ භූමි ප්‍රදේශය උතුරටත්" මුලතිව් වව්නියා ප්‍රධාන මාර්ගයද" නැගෙනහිරින් මුලතිව් මුහුදු වෙරළ තීරයෙන්ද, දකුණින් පුල්මුඩේ කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගයෙන්ද බස්නාහිරින් සිංහයා උල්පතහින්න ත්‍රිකෝණමිතික ස්ථානය ඔස්සේ මහහෙට්ටියාවහින්න කඳුවැටිය ඔස්සේ රේඛාව පුලියන්කුලිම වව්නියාව මාර්ගයෙන්ද සීමා වෙන ප්‍රදේශයක් පුරා විහිදි ඇත.

මූල්‍ය ප්‍රගතිය 2019

මුදල් වෙන් කිරීම .මී.රු - 220.00 **මුල්‍ය ප්‍රගතිය .මී.රු - 179.00**

අංශය	ඉලක්කය රුමී.	ප්‍රගතිය රුමී.	ප්‍රතිශතයක් ලෙස
තාක්ෂණ සේවා	131.34	107.15	82%
කෘෂිකර්ම හා සත්ත්ව පාලන	28.97	23.42	8%
පරිසර අංශය	13.08	11.21	8%
සංවර්ධන	9.10	9.01	9%
ඉඩම්	12.20	10.24	84%
ඉඩම් පරිහරණ සැලසුම්	1.00	1.00	100%
ප්‍රවාහන	15.40	10.65	69%
පාලන	8.90	6.33	71%
එකතුව	220.00	179.00	81%

හුරුළුවැව කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997-07-16 වන දිනැති අංක: 984/5 දරණ නිවේදනය මගින් හුරුළුපෝෂිත ඇලෙහි ජල කළමනාකරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරන ලද අතර 1998-05-09 වන දින හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය දඹුල්ල පැල්වෙහෙරෙහි ස්ථාපිත කරන ලදි.
ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව, පලාගල හා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අයත් ග්‍රාම නිලධාරී වසම් 49 ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල හා නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 32 ක් ද, ගල්කිරියාගම, මඩාටුගම, පළඟස්වැව, කළුන්දැව හා සීගිරිය යන කොට්ඨාස පහට අයත් වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු.

- පොල්ගොල්ලෙන් බෝවතැන්න වෙත හරවා එවන මහවැලි ජලය ලෙනදොර උමං පිටවුමේ සිට කි.මී.33 ක් දිගැති හුරුළුපෝෂිත ඇල සහ යාන් ඔය ඔස්සේ බාධාවකින් තොරව හුරුළුවැව වෙත ගෙන යාමට සැලැස්වීම.
- හුරුළුපෝෂිත ඇල දෙපස විශාල ලෙස කරනු ලබන අතිරේක බෝග වගාව සඳහා ක්‍රමවත්
- හුරුළුපෝෂිත ඇල බලප්‍රදේශය තුල කරනු ලබන වගාවන් ක්‍රමවත්ව හා උපරිම ඵලදායීතාවයක් ලබා ගන්නා අයුරින් කෘෂිකර්ම හා ප්‍රජා සංවර්ධන කටයුතු කිරීම.
- කණ්ඩලම ජලාශයෙන් හා දඹුලුඔය ජලාශයෙන් මඩාටුගම හා ගල්කිරියාගම කොට්ඨාස වෙත සැපයෙන දියවරයෙන් උපරිම ඵලදායීතාවය කරා ගොවීන් යොමු කර ඔවුන්ගේ ආර්ථිකය ඉහල නැංවීමට වාරි මාර්ග, ඉඩම්, කෘෂිකර්ම කටයුතු හා ප්‍රජා සංවර්ධන මෙන්ම පරිසර කටයුතු වලට දායක වීම.

2019.12.31 දිනට කලාපීය භෞතික හා මූල්‍ය ප්‍රගතිය - හුරුළුවැව කලාපය

අ/අ	අංශය	2019 වසර සඳහා වෙන්කර ඇති අයවැය (රු.මිලි)	2019.12.31 දිනට මූල්‍ය වියදම් (රු.මිලි)	මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)	භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%)
1	තාක්ෂණසේවා අංශය	40.811	35.26	85%	91%
2	පාලන අංශය	0.55	0.4	83%	95%
3	ප්‍රවාහන අංශය	3	2.2	73%	80%
4	කෘෂිකර්ම අංශය	6	5.16	91%	95%
5	සත්වපාලන අංශය	2.3	1.64	83%	90%
6	ව්‍යාපාර සංවර්ධන	1	0.99	99%	100%

	අංශය				
7	ආයතන සංවර්ධන අංශය	5.6	5.26	99%	100%
8	ඉඩම්අංශය	3.01	1.68	56%	80%
9	ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය	1.27	1.23	97%	100%
10	වන හා පරිසර අංශය	4.548	3.99	88%	90%
11	මහවැලි කේන්ද්‍රය	3.911	3.68	94%	95%
12	RMMIS	14.95	14.95	100%	100%
	එකතුව	86.95	76.44	87%	93%

<u>රඹකැන්ඔය කලාපය</u>



කලාපය පිළිබඳ හැඳින්වීම

1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනතේ 3/1 වගන්තිය යටතේ විශේෂ ව්‍යාපෘති ප්‍රදේශයක් ලෙස 2000-05-07 දින අංක1130(13) දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද කලාපයකි. ඒ අනුව 2010-09-01 දින සිට මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පවතින ජලය සහ අනෙකුත් ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදුකරන බවට ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ප්‍රදේශයේ පවතින දිළිඳුභාවය තුරන් කිරීම සහ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ නැංවීම උදෙසා සකස් කර ඇති මෙම සංවර්ධන වැඩසටහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ රේඛීය ආයතන හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.මේ අනුව රඹකැන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වාරි ඉඩම් සංවර්ධන කටයුතු සහ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඉටු කරනු ලබයි.

2019 වර්ෂයේ ඉටු කල කාර්යයන්

- ඉඩම් කච්චේරි පැවැත්වීම.
- රජයේ ඉඩම් ආඥා පනත යටතේ භුක්තිය භාර දීම.
- රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලින බදුකර ලබාදීම.
- ඉඩම් මැනුම් කර මායිම් ගල් දැමීම.
- රඹකැන්ඔය ජලාශය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වූ අයවළුන් සඳහා වන්දි හා පොලී ගෙවීම
- රජයේ ආයතන විසින් පරිහරණය කරනු ලබන ඉඩම් එම දෙපාර්තුමේන්තු සඳහා බැහැර කිරීම 07 යි.
- රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග.

වලව කලාපය



කලාපය පිළිබඳ හැඳින්වීම

උඩ වලව බහුකාර්ය යෝජනා ක්‍රමය 1963 ජූලි මස 12 වැනිදා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර ඇති අතර, උඩ වලව ජලාශය ඉදි කිරීමත් එය සමගාමීව ජනාවාසකරණය සහ ගොවි බිම් සංවර්ධනය 1981 දක්වා ක්‍රියාත්මක කරන ලද්දේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගිනි.

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 3(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව1981/04/16 දින අංක 137 දරන ගැසට් පත්‍රය මගින් ගරු ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යවරයා වූ ගාමිණී දිසානායක මැතිතුමා විසින් වලව කලාපය වලව විශේෂ බල ප්‍රදේශය පත් කරනු ලැබ ඇත. ඒ අනුව 1982-01-01 දින සිට වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත් වී ඇත.

වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත්ව දැනට වසර 34 ක් ගතවී ඇති අතර, මෙම කාලය තුළ කලාපය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. අඟුණකොළපැලැස්ස, මුරවැසිඟේන, සූරියවැව, මයුරපුර, චන්ද්‍රිකා වැව හා කිරිඉබ්බන්වැව යන කොට්ඨාස 06 කින් සමන්විත වන අතර, ඒකක 39 කට බෙදී ඇත.

උඩවලව ජලාශයෙන් පෝෂණය වන මුළු බිම් ප්‍රමාණය සහ ඇල පද්ධතීන් පිළිබඳ තොරතුරු

දකුණු ඉවුර යටතේ,

- දකුණු ප්‍රධාන ඇලේ දිග - කි.මී. 40.874
- අතු ඇලවල්වල මුළු දිග - කි.මී. 75.74
- බෙදුම් ඇලවල්වල මුළු දිග - කි.මී. 197.582
- කෙත් ඇලවල්වල මුළු දිග - කි.මී. 617.114
- වගා කරන භූමි ප්‍රමාණය - හෙක්ටයාර් 11,547.83

වම් ඉවුර යටතේ,

- වම් ප්‍රධාන ඇලේ දිග - කි.මී. 49.993
- අතු ඇලවල්වල මුළු දිග - කි.මී. 46.133
- බෙදුම් ඇලවල්වල මුළු දිග - කි.මී. 216.00
- කෙත් ඇලවල්වල මුළු දිග - කි.මී. 657.00
- වගා කරන භූමි ප්‍රමාණය - හෙක්ටයාර් 11,952.00

2019-12-31 දිනට මූල්‍ය ප්‍රගතිය - කලාප වශයෙන්

අ.අ	කලාපය	2019 වර්ෂයට වෙන් කල මුදල (රු.මිලි.)	2019-12-31 දිනට වියදම් කල මුදල (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය%
1	බී	474.53	344.48	73%
2	සී	203.50	192.43	95%
3	ඩී	79.30	76.63	97%
4	ඊ	60.50	61.23	101%
5	ජී	82.85	76.74	94%
6	එච්	227.90	213.82	94%
7	හුරුළුවැව	86.95	76.44	88%
8	උඩවලව	230.85	223.45	97%
9	රඹකැන්ඔය	170.00	128.96	76%
10	එල්	220.00	179.00	81%
	එකතුව	**1,836.38**	**1,573.16**	**86%**

අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකරණය වන අංශ

1. සැලසුම් හා නියාමන අංශය
2. අභ්‍යන්තර විගණන අංශය

01. සැලසුම් හා නියාමන අංශය

කාර්යභාරයන්

- ආයතනයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරීම.
- විශේෂ ව්‍යාපෘති වාර්තා සැකසීම හා ආර්ථික සාමාජීය සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරීම. ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධීකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරීම.
- තාක්ෂණ වාර්තා, ශක්‍යතා වාර්තා මෙහෙයුම් හා ඇගයීම් වාර්තා සංරක්ෂණය හා භාවිතයට ලබා දීම.
- මහවැලි පරිගණක ජාලය මෙහෙයවීම නඩත්තුව හා නිල වෙබ් අඩවිය ස්ථාපිත කිරීම. යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ සහාය පැතීම.
- බලපෑමට ලක්වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධීකරණය කිරීම.

02. අභ්‍යන්තර විගණන අංශය

මහවැලි අධිකාරියේ ඵලදායි කාර්යසාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය කාර්යසාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2019 වර්ෂය තුල විගණන කළමනාකරණ කමිටු උපදෙස් හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ පරිදි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් අභ්‍යන්තර විගණන සැලැස්ම ඔස්සේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන අතර අකාර්යක්ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරමින් වංචා, දූෂණ හා වැරදි සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

කාර්යභාරයන්

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර ප්‍රතිපත්ති චක්‍ර ලේඛන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍යමය විධිවිධාන හා මුදල් සහ ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති සහ

නීති රීති ව්‍යවස්ථා හා කළමනාකරණ තීරණ වලට අනුකූලව අභ්‍යන්තර විගණන විෂය පථය සකස් වී ඇත.

- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ඨි කෝණයකින් මෙන්ම කළමනාකරණ දෘෂ්ඨි කෝණයකින් ද යුතුව ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම. විගණනය හා වාර්තා කිරීම.
- වැඩ යෝජනා ක්‍රම ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩසටහන් නියමිත කාල රාමුව තුළ කොතෙක් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත්දැයි නිරන්තරව ඇගයීම් කිරීම.
- අදාළ කාලවකවානුව තුළ සිදුකළ යුතු වැඩ ක්‍රියාත්මක වීම ප්‍රමාද වීමට තුඩු දෙන ගැටළු සහගත ක්ෂේත්‍රයන් පිළිබඳ යාවත් කාලීනව ස්ථානීය විමර්ශනයක් පැවැත්වීම.
- මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීමෙහිලා භාවිතා කරනු ලබන කළමනාකරණ ක්‍රමවේදය සහ පාලනයන් ඇගයීම හා සමාලෝචනය කිරීම.

දෙවන පරිච්ඡේදය

2.1 තාක්ෂණ සේවා අංශය

කාර්යභාරයන්:

1. සංයුක්ත සැලැස්ම/වාර්ෂික සැලැස්මට අනුව නව අංගයකින් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.
2. තාක්ෂණික සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මගපෙන්වීම හා මෙහෙයවීම.
3. ප්‍රධාන වේලි හා ජල හැරවුම් මාර්ග හා පහළ නිම්න ප්‍රදේශයේ වාරි පද්ධතිය ඇතුළු භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් සැකසීම.
4. ජලාශ හා වාරිපද්ධති හරහා කෘෂිකාර්මික කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සඳහා ඇති ජල ප්‍රමාණය නිසි කලට සපයා දීම සඳහා විධිමත් සැලසුම් පිළියෙල කිරීම.
5. ව්‍යාපෘති සැලසුම් කිරීම ශක්‍යතා ඇගයීම, මෙහෙයවීම හා ප්‍රගතිය සමාලෝචනය.

මූලික වශයෙන් ඉහත දැක්වූ ප්‍රධාන ක්‍රියාවලීන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ සේවා අංශය කටයුතු කරනු ලබයි. ඒ අනුව 2019 වසර තුල මෙම අංශය මගින් ඉහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

ව්‍යාපෘති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම

අලුතින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා

- ඒකාබද්ධ ගංගාද්‍රෝණි සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRM).
- මහකම්බිලියාව වැව සහ වැලිඔය වාරිමාර්ග වැව් සංවර්ධන ව්‍යාපෘතිය (2020, L කලාපය).
- කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය (2020, L කලාපය).
- මාදුරුඔය දකුණු ඉවුර (RB) සංවර්ධන ව්‍යාපෘතිය (2020, B කලාපය).
- රඹකැන්ඔය වාරි පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය.
- මැදිරිගිරිය වාරිමාර්ග වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.
- මහවැලි කලාප වල ගොවීන් 3000 ක් සඳහා සූර්ය බලශක්ති විසුරුම් ජල සම්පාදන ව්‍යාපෘති
- පාවෙන සූර්ය බලශක්ති බලාගාර හා හිස් ඉඩම් වල සූර්ය බලාගාර

ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම

- වාණිජ සැපයුම් සඳහා මුදල් අයකිරීම.
- ජලාශ හා වැව් වල රොන්මඩ/ වැලි සඳහා මුදල් අයකර ගැනීම

2.1.1 පහළ නිම්න සංවර්ධන අංශය

මහවැලි බල ප්‍රදේශයන්හි ඇති වාරි පද්ධති මෙහෙයවීම සහ නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු කිරීම සහ කලමනාකරණය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාල ඉදිකිරීම්, ඇස්තමේන්තු කිරීම, ඉදිකිරීම් තත්ව පාලනය කිරීම් සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

2019 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඒ ඒ කලාපය සඳහා වෙන් කල ප්‍රතිපාදන වැය කිරීම් පහත පරිදි වේ.

වාර්ෂික මුදල් වියදම් වාර්තාව (ප්‍රගතිය)

I. ව්‍යාපෘති යටතේ

අ/අ	ව්‍යාපෘතිය	2019 වර්ෂයේ තා.සේ.අංශයට වෙන් කල මුදල රු.මි.	2019 වසරේ මූල්‍ය ප්‍රගතිය රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	2019 වසරේ භෞතික ප්‍රගතිය රු.මි.	භෞතික ප්‍රගතිය %
1	රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	55.01	37.75	69		93
2	රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය	51.37	36.35	71		94
3	වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	131.34	107.15	82		90
4	ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය	209.40	106.11	51		95
5	මාදුරුඔය දකුණ ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය	43.70	43.25	99		70
6	කුඩා හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	100.00	82.46	82		90
	උප එකතුව 1	**590.82**	**413.07**	**70**		**89**

II. ආයතනික ප්‍රාග්ධනය යටතේ

අ/අ	කලාපය /අංශය	2019 වර්ෂයේ තා.සේ.අංශයට වෙන් කල මුදල රු.මි.	2019 වසරේ මූල්‍ය ප්‍රගතිය රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	2019 වසරේ භෞතික ප්‍රගතිය රු.මි.	භෞතික ප්‍රගතිය %
1	බී කලාපය	85.75	77.78	91		92
2	සී කලාපය	114.00	108.67	95		98
3	ඩී කලාපය	31.44	29.88	95		98
4	ජී කලාපය	31.50	31.50	100		100
5	එච් කලාපය	103.46	103.38	100		100
6	එල් කලාපය	-	-	-	-	-
7	වලව කලාපය	103.95	104.70	101		100
8	හුරුළුවැව කලාපය	40.81	35.26	86		90
9	රඹකැන්ඔය කලාපය	0.47	0.56	119		100
10	වික්ටෝරියා කලාපය	34.88	37.92	109		100
11	ප්‍රධාන කාර්යාලය (තා.සේවා)	17.00	7.21	42		50
12	යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම	3.50	3.91	112		100
13	ගංගා ද්‍රෝණි කළමනාකරණ අංශය	0.92	0.99	108		100
14	ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය	256.00	254.97	100		100
	උප එකතුව 2	**823.68**	**796.73**	**97**		**100**
	මුළු එකතුව (උප එකතුව 1+2)	**1,414.50**	**1,209.80**	**86**		**95**

2.1.2 ඉදිකරමින් පවතින කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වල ප්‍රගති වාර්තාව (2019/12/31දිනට)

මහවැලි ගඟ හා ඊට සම්බන්ධ අතු ගංගා වල ජලය උපයෝගී කොට ගෙන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ක්‍රියාත්මක වේ. මෙයින් ජනනය කරන විදුලිය ලංකා විදුලි බල මණ්ඩලය යටතේ ඇති ජාතික විදුලිබල පද්ධතියට (National Grid) සපයනු ලැබේ. මාස්පතා සපයනු ලබන මෙම විදුලි ඒකක ප්‍රමාණය අනුව ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය විසින් එම සැපයූ විදුලි ඒකක ප්‍රමාණයට ගෙවීමක් එම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ ආයෝජකයාට ගෙවනු ලබන අතර ආයෝජකයා විසින් ප්‍රතිශතයක් මහවැලි ගඟේ ජලය භාවිතා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවනු ලැබේ.

මේ දක්වා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 12 ක වැඩ නිමවා ඇති අතර එයින් මෙගාවොට් 39.85 ක ප්‍රමාණයක් ජාතික විදුලි පද්ධතියට තම දායකත්වය සපයයි. එමගින් මහවැලි අධිකාරියට මහවැලි ජල හැරවුම් අයිතිය වෙනුවෙන් ගෙවනු ලබන බද්ද ලෙස යම් ප්‍රතිශතයක් හිමි වේ.

මීට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය සහිතව කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 9 ක් ඉදිකරමින් පවතී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිව රහිතව ඉදිකරන ලද කුඩා පරිමාණන ජල විදුලි බලාගාර 46 ක් දැනට වාර්තා වී ඇති අතර තවත් ජල විදුලි බලාගාර ඉදිවෙමින් පවතී

අ/අ	ව්‍යාපෘතියේ නම	ආයෝජකයා ගේ නම	ධාරිතාවය / MW	අපේක්ෂිත ජල පෝෂක කළමනාකරණ ගාස්තුව%	ප්‍රගතිය
1	උකුවෙල	Onyx Hydro Power Company (Pvt) Ltd.	2.2	16.2	ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවෙන් ජනන බලපත්‍රය (Generation License) ලබා ගැනීමේ කාර්යය සිදු කරමින් පවතී.මේ වනවිට විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (Power Purchase Agreement) අත්සන් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. එය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
2	දිග්ගල	Escas Diggala Power (Pvt) Ltd.	4.4	10	මූලික ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.
3	කිවුල	Escas Kiula Power (Pvt) Ltd.	2.8	10	සැලස්ම වෙනස් කිරීම නිසා නව පාරිසරික බලපෑම් ඇගයීමක් (EIA) කරමින් පවතී.

අ/අ	ව්‍යාපෘතියේ නම	ආයෝජකයා ගේ නම	ධාරිතාව ය / MW	අපේක්ෂිත ජල පෝෂක කළමනාකරණ ගාස්තුව%	ප්‍රගතිය
4	නායක්කුබුර	Ralic Hydro Power Generation (Pvt) Ltd./ N.G.P. Panditharathna	0.5	10	මෙම ව්‍යාපෘතිය සඳහා ආයෝජකයින් දෙදෙනෙකු ඉදිරිපත්ව ඇති බැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීමට නීතිපති උපදෙස් ලබාගැනීම සඳහා යොමු කරන ලදි. රැලික් හයිඩ්‍රෝ පවර් ජෙනරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත මෙම ව්‍යාපෘතිය ලබා දීම සුදුසු බවට නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) වෙතින් තාවකාලික අනුමැතියේ (Provisional Approval) දින දීර්ඝ කර ගැනීමට කටයුතු යොදා ඇත.
5	චන්ද්‍රිකාවැව	Mahaweli Consultancy Bureau (Pvt) Ltd.	0.63	10	පාරිසරික බලපෑම් ඇගයීම (EIA) අවසන් කර ඇත.මෙම ආයතනය ඈවර කිරීමට සලකා බලමින් පවතී. එබැවින් මෙම ව්‍යාපෘතියේ අනාගතය අවිනිශ්චිතය.
6	කුබලෝලුව I	Noorwood Hydro Power (Pvt) Ltd.	2.4	10	මෙම ව්‍යාපෘති දෙක සුදු ගඟෙහි ආසන්නව පිහිටා ඇති බැවින් ව්‍යාපෘති දෙකම එකවර ක්‍රියාත්මක කරවීමේ ගැටළුවක් පවතී.
7	කුබලෝලුව II	Kumballoluwa Hydro Power (Pvt) Ltd.	1	10	ව්‍යාපෘති දෙකෙහි ශක්‍යතාවය අධ්‍යනය කිරීම සඳහා බිම් මැනුමක් (Survey) සිදු කිරීමට කටයුතු කළත් ගම්වාසීන්ගේ විරෝධතාවයක් නිසා එය නතර කිරීමට සිදු විය. මෙම බිම් මැනුම සිදු කිරීම පිළිබඳ සාකච්චා කරමින් පවතී.
8	Maduruoya offtake of LBL3	Nippon Knit (Pvt) Ltd.	0.15	10	පාරිසරික බලපෑම් ඇගයීම (EIA) සිදු කරමින් පවතී.ලංකා විදුලි බල මණ්ඩලයේ අභිප්‍රාය ලිපිය (Letter of Intent) බලාපොරොත්තුවෙන්

අ/අ	ව්‍යාපෘතියේ නම	ආයෝජකයා ගේ නම	ධාරිතාව ය / MW	අපේක්ෂිත ජල පෝෂක කළමනාකරණ ගාස්තුව%	ප්‍රගතිය
					සිටී. දැනට මෙම ලිපිය නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවාඇත.
9	මොරගල්ල කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	Zhejiang Young Energy Co. (pvt) Ltd.	2.1	10	පාරිසරික බලපෑම් ඇගයීම (EIA) සිදු කරමින් පවතී.ලංකා විදුලි බල මණ්ඩලයේ අභිප්‍රාය ලිපිය (Letter of Intent) බලාපොරොත්තුවෙන් සිටී. දැනට මෙම ලිපිය නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවාඇත.

2.1.3 ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය

ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංවර්ධනය කරන ලද, ක්‍රියාත්මක වෙමින් පවතින සහ යෝජිත ව්‍යාපෘතිවල ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබයි.

පහත කාර්යභාරයන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

- මහවැලි ජල සම්පත් සැලැස්ම යාවත්කාලීන කිරීම.
- රාජ්‍ය හා පුද්ගලික ව්‍යාවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ජල ව්‍යාපෘති යෝජනා හා සැලසුම් විශ්ලේෂණය.
- ක්‍රියාත්මක වන ජල සම්පත් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වල නිර්මාණ හා සැලසුම් සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම.
- නිර්මාණ හා සැලසුම් වලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තු හා ප්‍රමාණ බිල්පත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සකස් කිරීම.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගත් තත්වයන්ට අනුව ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳව නවක ඉංජිනේරුවරුන් පුහුණු කිරීම.

2.1.4 ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය යටතේ 2019 වර්ෂයේ කල කාර්යයන් සැලසුම් සහ ඇස්තමේන්තු කිරීම්

1. වන සංරක්ෂණ කාර්යාල ගොඩනැගිල්ල - අඹන.
2. සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල - ලග්ගල.
3. රැස්වීම් ශාලාව - ලග්ගල පාසල.
4. පුස්තකාල ගොඩනැගිල්ල - අඹන.
5. කුඹියන්ගහ ඇල පාසැල් ගොඩනැගිල්ල.
6. බිසෝපුර - බස් නැවතුම්පොල.
7. කොට්ඨාස කළමනාකරණ කාර්යාලය - බකමූණ.
8. කොට්ඨාස කළමනාකරණ කාර්යාලය - මීගලෑව.
9. අඹන පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය.
    (a) ජල සුළං කටනය (Aerator)
    (b) වැලිපෙරහන (Slow Sand Filter)
    (c) භූගත පිරිසිදු ජල ටැංකිය (Clear Water Sump)
    (d) බෙදාහැරීමේ නල පද්ධතිය (Distribution Pipe Network)
    (e) ජලය ඇතුළුවීමේ නිර්මිතය (Raw Water Intake)
    (f) පොම්පාගාරය (Pump House)
    (g) අවසාදිත ටැංකිය (Sedimentation tank)
    (h) නිල නිවාස - II ශ්‍රේණිය (Grade II Quarters)
    (i) විදුම් පත්ල (Drying Bed)
    (j) සලකුණු කිරීමේ සැලැස්ම (Setting Out Plan)
10. මැදිරිගිරිය - කන්තලේ මාර්ගයේ පේරමඩුව ඔය හරහා පාලම.
11. කුඹියන්ගහ ඇල පාසලේ කළුගල්ල ඇල හරහා පාලම.
12. LC 03 ඇල වාන් දොරටුව - කළුගග දකුණු ඉවුර.
13. LO 04 ඇල වාන් දොරටුව - කළුගග දකුණු ඉවුර.
14. වලව දකුණු ඉවුර ඇල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සමාලෝචනය.
15. මැදිරිගිරිය වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තාව සමාලෝචනය.

2.2 ගංගාද්‍රෝණි කළමනාකරණ කාර්යාලය

හැඳින්වීම:

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය, මඩාටුගම මහවැලි පරිශ්‍රයේ පිහිටා ඇති අතර අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) යටතේ ක්‍රියාත්මක වේ. ගංගා ද්‍රෝණි කළමනාකරණ සංකල්පයට අනුකූලව පාරිසරික හා ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලවන කාර්යයන් ඉටු කිරීම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් හා නඩත්තු කාර්යයන් ප්‍රමිතිය පරීක්ෂා කිරීම මෙම කාර්යාලයේ මූලික වගකීම වේ.

ඒ අනුව මෙම කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ජල තත්ව විද්‍යාගාරය මඟින් මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහසම්බන්ධ ගංගා ද්‍රෝණිවල පිහිටි ජල ප්‍රභව වල ජලයෙහි ගුණාත්මය පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර එම දත්ත ඇසුරින් ජලයේ ගුණාත්මය ස්ථානීයව හා කාලීනව වෙනස් වන අයුරු අධ්‍යයනය කිරීම සිදු කරනු ලැබේ.

ඒ යටතේ,

- කලාවැව, කණ්ඩලම, දඹුළු ඔය, බෝවතැන්න, උඩවලව සහ චන්ද්‍රිකා වැව යන මහවැලි ජලාශ වල ජලයේ ගුණාත්මය පිළිබඳව මාසිකව පරීක්ෂා කිරීම.
- මහවැලි කලාපයන්හි ඇති තෝරාගත් කුඩා වැව්වල ජලයේ ගුණාත්මකභාවය මාසිකව පරීක්ෂා කිරීම.
- මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහසම්බන්ධ තෝරාගත් ජල දහරා වල ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.





- එසේම මහවැලි කලාප හා ඉන් බාහිර ප්‍රදේශ වල භාවිතා කරන පානීය ජල ප්‍රභවයන් වල ජල නියැදි පරීක්ෂාවට ලක් කරන අතර පානීය ජලයේ ගුණාත්මය පිලිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලබයි.
- ඊට අමතරව ජලයේ ගුණාත්මය හා ඊට අදාල ප්‍රමිතීන් මිනුම් කිරීම පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩ සටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ.

- අප අංශය සතු ජල තත්ව විද්‍යාගාරය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත විද්‍යාගාරයක් බැවින් කරමාන්ත සඳහා වන පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කර ගැනීමේදී එම ආයතන හරහා පරිසරයට මුදා හරින අප ජලයේ තත්වය පරීක්ෂා කර නිර්දේශයන් ලබා දීමද සිදු කරනු ලැබේ. මෙහිදී එම ආයතන හිමියන්ගෙන් කෙරෙන ඉල්ලීම් වලට අනුව පරීක්ෂණ සිදුකර අප ජලයෙහි සංයුතිය පිළිබඳ වාරතා ලබා දෙන අතර ඒ සඳහා ගාස්තු අයකරනු ලැබේ.

- මීට අමතරව බාහිර ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් අනුව ජල සාම්පල පරීක්ෂා කරනු ලබන අතර ඒ යටතේ විශේෂයෙන් ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතියෙහි ඉල්ලීම මත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ තෝරාගත් ජල මූලාශ්‍ර වල ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කරනු ලබයි.

- ඒ අනුව, 2019 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ මඟින් රු. 927,999.00 මුදලක් උපයා ගන්නා ලදී.

- තත්ව පාලන පරීක්ෂණාගාරය මඟින් මහවැලි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කෙරෙන ඉදිකිරීම් වල ප්‍රමිතිය උසස් මට්ටමක පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. එහිදී මහවැලි කලාප වල සිදු කරන ඉදිකිරීම් සඳහා භාවිතා කරන ඉදිකිරීම් ද්‍රව්‍ය වල යෝග්‍යතාවය පිරික්සීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ සිදුකිරීමද එම ඉදිකිරීම්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමද කලාප කාර්යාල වලින් ඉල්ලීම් ලැබෙන පරිදි කරනු ලබයි. එම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදුකරන්නේ නම් පරීක්ෂණ කටයුතු සඳහා ගාස්තු අයකරනු ලැබේ. එම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදුකරගන්නේ නම් පරීක්ෂණ කටයුතු සඳහා ගාස්තු අයකරනු ලැබේ. එලෙස සිදුකරන ලද පරීක්ෂණ මඟින් 2019 වර්ෂයේදී රු. 359,760.00 ක මුදලක් උපයා ගන්නා ලදී.





- එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) විසින් විශේෂිතව දැනුම් දෙන අවස්ථාවලදී මහවැලි කලාප කාර්යාල මඟින් සිදුකරන ඉදිකිරීම් වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමද සිදු කරයි.

2.2.1 ඉහත රාජකාරි වලට අදාල 2019 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රගතිය

අ/අ	විස්තරය	වෙන් කිරීම් (රු. මි.)	ප්‍රගතිය (රු. මි.)
1	ප්‍රාග්ධන වියදම්	3.300	3.300
2	පුනරාවර්තන වියදම්	25.864	19.878

2019 වර්ෂයේ තැබූ ඉලක්ක හා අත්පත් කරගත් ප්‍රගතිය



2.2.2 ජාතික ආර්ථිකයට හා සමාජයට ලබාදුන් දායකත්වය

- ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය මගින් සැලකිය යුතු මූල්‍යමය ඉපයීමක් සෘජු ලෙසම සිදු නොකරන නමුත් ජාතික ආර්ථිකය සහ සමාජීය ප්‍රගමනය කෙරෙහි වක්‍ර දායකත්වයක් ලබා දෙයි.
- ජල තත්ව විද්‍යාගාරයේ ක්‍රියාත්මක වීම මගින් පාරිසරික වශයෙන් ජලයේ සිදුවන ගුණාත්මකභාවයන්හි විචල්‍යයන් පහසුවෙන් හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇති අතර මෙම විචල්‍යයන්ගේ දීර්ඝ කාලීන හැසිරීම් අධ්‍යනය කිරීම තුළින් පරිසරයට මූලිකව එකතුවී ඇති පරිසර දූෂකයන්ද නිගමනය කිරීමේ හැකියාව ලැබේ. එය වඩාත් නිවැරදිව හඳුනාගැනීම තුළ ඊට නිසි ක්‍රියාමාර්ගයන්ට එළඹීමේ හැකියාවද ලැබෙන අතර එය අනාගත පරපුර සඳහා වන පාරිසරික ආයෝජනයක්ද වේ.
- සෞඛ්‍ය සම්පන්න සමාජයක් උදෙසා ජලයේ ගුණාත්මකභාවය පවත්වාගැනීමේ අවශ්‍යතාවය, ජල දූෂණය වලක්වාගැනීමේ අභිශය වැදගත්කම හා ඒ සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිලිබඳව ප්‍රජාව හා විශේෂයෙන් පාසල් සිසුන් දැනුවත් කිරීම හරහා ආකල්පමය වෙනසක් තුලින් ජල මූලාශ්‍ර වල පවිත්‍රතාවය රැකගැනීමට දායකත්වය ලැබේ. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් බොහෝ විට ග්‍රාමීය හා වකුගඩු රෝගයන්ගෙන් පීඩා විඳින්නා වූ ප්‍රදේශයන් තුළ දියත් කිරීම

මගින් එම ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන් නගා සිටුවීමට ප්‍රබල පිටිවහලක්ද සපයනු ලැබේ.

- තත්ව පාලන පරීක්ෂණ සිදුකිරීම මගින් ප්‍රමිතිය නියමිත මට්ටමට නොමැති ඉදිකිරීම් හඳුනාගැනීමට හැකිවන අතර ඒවා යථාවත් කිරීම සඳහා ඒ අවස්ථාවේදීම පිලියම් යෙදීමට මග පාදාගත හැකිවේ. එමගින් නිර්මිත වල ආයුකාලය සැලසුම් කල පරිදි පවත්වාගත හැකිවන අතර වරින්වර අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය අවම කරවයි. එනිසා ඒවායේ ප්‍රතිලාභ ප්‍රජාව වෙත අඛණ්ඩව ලබාදීමට හැකියාව ලැබෙන අතර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දැරිය යුතු පිරිවැය අවම කරගැනීමටද හැකියාව ලැබේ. එය රටෙහි නිෂ්පාදන ආරථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

- උණ පැල සිටුවා ඉවුරු ආරක්ෂා කිරීම මගින් ජල දහරා වල ගමන් මග නිසි ලෙස පවත්වාගත හැකිවන අතර වගා බිම්ද ඇතුළු යාබද භූමි ප්‍රදේශ බාදනය වීම අවම කරගත හැකිවේ. එමෙන්ම ඉවුරු සංරක්ෂණය සඳහා නිර්මිත ඉදිකිරීම අවම කර ඒ සඳහා වෙන්කරන මූල්‍ය ප්‍රතිපාදන ඉතිරි කරගැනීමට මෙමගින් අවස්ථාව ලැබේ. මේ සඳහා ප්‍රජාවේ, පාසල් සිසුන්ගේ සහ සිවිල් සංවිධාන වල දායකත්වය ලබාගැනීම හරහා ඔවුන් තුලද පරිසරය සුරැකීමේ වගකීම පිලිබඳව ධනාත්මක හැඟීමක් ජනිත කරවීමට හැකියාව ලැබේ.

2.3 මුලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය

හැඳින්වීම:

මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදිකරනු ලැබූ ප්‍රධාන ජලාශ, වේලි හා අමුණු වැඩිදියුණු කිරීම, ක්‍රියාකරවීම් හා නඩත්තු කිරීම් උදෙසා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුල 1985 දී පිහිටුවා ස්ථාපිත කරන ලද අංශය මූලික වැඩ පාලන ක්‍රියාකරවුම්, මෙහෙයුම් හා නඩත්තු අංශය නමින් හැඳින්විය. මහජනතාවගේ හඳුනා ගැනීමේ පහසුව සඳහා 2019 වර්ෂයේ සිට මෙම අංශය **"ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය"** නමින් හඳුන්වා දී ඇත.

2.3.1 මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන්

පරිපාලනය - වේලි හා ජලාශ වල ජලදේහය, ස්වාරක්ෂක කලාපය(100m Buffer zone) හා ඊට අයත් රක්ෂිත ආරක්ෂා කර ගැනීම උදෙසා වූ රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ජලාශ හා රක්ෂිත වලට අයත් බල ප්‍රදේශ පරිපාලන කටයුතු කිරීම.

ක්‍රියාකරවීම - ජල කළමණාකරණ ලේකම් කාර්යාලයෙන් නිතිපතා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ සොරොව් ගේට්ටු ක්‍රියාත්මක කිරීම හා ජලාශවල ඉහල සහ පහල නිම්නවල ගංවතුර අවම කරලීම පිණිස ගංවතුර පාලනය සඳහා ගේට්ටු ක්‍රියාකරවීම.

නඩත්තුව - ජලාශ හා එම ජලාශ වලට අනුබද්ධිත වේලි,ගේට්ටු, ජලාශ පර්යන්ත ප්‍රදේශ හා ජලාශයට අනුබද්ධිත සියලු නිර්මිතයන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව (ICOLD) නඩත්තු කිරීම මෙන්ම වැඩිදියුණු කිරීම.

2.3.2 ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයෙන් පාලනය වන ජලාශ

ජලාශ	නඩත්තු කරනු ලබන අංගයන්
කොත්මලේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පොල්ගොල්ල හැරවුම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ උමං මාර්ග
බෝවතැන්න	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
දඹුලු ඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කණ්ඩලම	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
කලාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
වික්ටෝරියා	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
රන්දෙනිගල	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ

රන්ටැඹේ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මිණිපේ අමුණ	සොරොව් ගේට්ටු, වාන්දොරටු, අන්තර් නිම්න ඇල, බදුලු ඔය ජල පාලම, උමං මඟ සහ ජල පැන්නුම් වල නිර්මිත
ලොග්ගල්ඔය, හෑපොල ඔය හා දිහබාන ඔය මට්ටම් පැන්නුම්	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උල්හිටිය-රත්කිඳ	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මාදුරුඔය	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
උඩවලව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
චන්ද්‍රිකාවැව	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
මොරගහකන්ද	වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ
පුහුල්පොල	ව්‍යාපෘතියේ වැඩ නිමකර නොමැති අතර නඩත්තු කාර්යන් භාරගෙන නොමැත. අප අංශයේ කාර්ය මණ්ඩලයේ කීපදෙනෙකු ස්ථාපිත කර ඇත.
ඩයරබා	

2.3.3 ජලාශ ආශ්‍රිත පරිසර සංරක්ෂණ කටයුතු

අනු අංකය	විස්තරය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය රුපියල්
01	ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන් දිගන, නිලගම සහ කාර්යාල පරිශ්‍රය	06	33,697.00
02	වික්ටෝරියා සහ පොල්ගොල්ල ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත්කිරීමේ ශ්‍රමදාන වැඩසටහන්	02	10,348.00
03	වික්ටෝරියා ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත් කිරීමේ මාසික වැඩසටහන්	12	180,000.00
04	ජලාශ රක්ෂිතයේ උණපැල සිටුවීම	1500	50,000.00
05	ජලාශ රක්ෂිතයේ වනවගා පැල සිටුවීම්	4645	389,350.00
06	කාර්යාල පරිශ්‍රවල ගෙවතු වගා කිරීම්	1000	206,050.00
07	කර්මාන්ත හා පරිසර දූෂණ ආයතන සහ ස්ථාන සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවන්	100	69,745.00
08	ඩෙංගු කමිටු, පරිසර කමිටු සහ සම්බන්ධීකරණ කමිටු සඳහා සක්‍රීය දායකත්වය සැපයූ වැඩසටහන්	50	35,000.00
09	අපජල විශ්ලේෂණ වාර්තා සහ පරිසර බලපත්‍ර ගාස්තු		23,075.00
	එකතුව		**997,265.00**

2.3.4 ජලාශ රක්ෂිත ආරක්ෂාව වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග

අනු අංකය	විස්තරය	ඉලක්කය	ප්‍රගතිය
01	මීටර් 100/60 රක්ෂිතයේ අනවසර ඉවත් කිරීම් මහේස්ත්‍රාත් අධිකරණ නඩු	55	50
	මහේස්ත්‍රාත් අධිකරණ නඩු		36
	අභියාචනා නඩු		04
	දිසා අධිකරණ නඩු		03
	නෙරපීම් ක්‍රියාත්මක කර නොමැති ඇස්කිසි නැවත ක්‍රියාත්මක කිරීම		25
02	නඩු පැවරීමට අස්කිරීම් දැන්වීම් යැවීම්	100	40
03	අස්කිරීම් දැන්වීම් යැවීමට නියමිත පළමු පියවර ක්‍රියාත්මක කිරීම (L-5)	100	40
04	නිලගම පරිශ්‍රයේ නඩු පැවරීම (නිවාස සන්තකය ආපසු ලබා ගැනීම)		6
05	අනවසර කරුවන්ට එරෙහිව පැමිණිලි		10
06	මුල් අවස්ථාවේ අනවසර ඉදිකිරීම් වැලැක්වීම		12
07	අපද්‍රව්‍ය බැහැර කිරීම හා අනවසර අල්ලාගැනීම වැලැක්වීම සඳහා සමිති සමාගම් හා ආගමික ස්ථාන දැනුවත් කිරීම	06	04
08	අනවසර වැලි ගොඩදැමීම තහනම් කිරීම		04
09	අවිධිමත් ඉදිකිරීම් නැවැත්වීම්		03
10	අනවසර දැව හෙලීම නැවැත්වීම්		05
11	විධිමත් ඉදිකිරීම් සඳහා පළාත් පාලන ආයතනවලට නිර්දේශ ලබාදීම		46
12	අවදානම් තත්වයේ පවතින දැව හෙලීම් සඳහා නිර්දේශ ලබාදීම		03

2.3.5 2019 වර්ෂය තුල සිදුකල විශේෂ ප්‍රගතිය හා ඒ තුලින් ජාතික ආර්ථිකයට සිදුකල දායකත්වය

අනු අංකය	ජලාශය	විදුලිබල නිශ්පාදනය සඳහා ජලය සැපයීම (MCM)	විදුලිබල නිශ්පාදන ධාරිතාවය (KWH)	ජාතික ආදායම (රු.මිලියන)
01	වික්ටෝරියා kwh සඳහා රු. 18.50	1170.58	463.95×10^6	7,543.83
02	රන්දෙනිගල kwh සඳහා රු. 18.50	1118.66	236.82×10^6	4,059.16
03	රන්ටැඹේ kwh සඳහා රු. 18.50	651.07	124.61×10^6	2,135.81
04	කොත්මලේ kwh සඳහා රු. 18.50	701.58	378.96×10^6	7,010.83
05	බෝවතැන්න kwh සඳහා රු. 18.50	468.38	57.42×10^6	1,062.18
06	මාදුරුඔය kwh සඳහා රු. 18.50	444.85	13.77×10^6	162.11
07	පොල්ගොල්ල kwh සඳහා රු. 18.50	900.48	161.63×10^6	2,909.38
08	මොරගහකන්ද kwh සඳහා රු.18.50	681.50	56.82×10^6	992.10
එකතුව				**25,875.40**

2.3.6 කෘෂිකර්මික කටයුතු සඳහා ජලය නිකුත් කිරීම

අනු අංකය	ජලාශය		සපයන ලද ජල ධාරිතාවය ඝණ මීටර් මිලියන (MCM)
01	පොල්ගොල්ල හැරවුම (බෝවතැන්න ජලාශයට)		899.809
02	මිණිපේ ඇල	වම් ඉවුර	296.700
		දකුණු ඉවුර	784.527
03	මොරගහකන්ද ජලාශය		87.370
04	උඩවලව	වම් ඉවුර	372.160
		දකුණු ඉවුර	386.437
	එකතුව		**2827.003**

2019 වර්ෂයේ තැබූ ඉලක්ක හා ලබාගත් ප්‍රගතිය (මූල්‍ය හා භෞතික)
ඉදිකිරීම් හා තාක්ෂණ අංශය

අනු අංකය	විස්තරය	භෞතික		මූල්‍ය රුපියල් මිලියන	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
01	කාර්යාල හා නිවාස ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම	ගොඩනැගිලි ගණන **55**	ගොඩනැගිලි ගණන **55**	35.699	35.653
02	ජල සැපයුම යෝජනා ක්‍රම නඩත්තුවමෙහෙයවීම (කොත්මලේ,බෝවතැන්න, මාදුරුඔය,රන්දෙනිගල,උඩවල)	යෝජනා ක්‍රම 04	යෝජනා ක්‍රම 04	9.620	9.621
04	නිල නිවාස, කඳවුරු නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියා කටයුතු කිරීම (කාර්යභාර ඉංජිනේරු කාර්යාල වලට අයත් කඳවුරු ඇතුලුව)	කාර්යය 240	කාර්යය 240	33.280	33.272
05	ජලාශ හා වේලි නඩත්තු කටයුතු(වේලි පරිශය) දෙවන වර වැඩුනු කැලෑ කපා පිරිසිදු කිරීම	හෙක්. 400	හෙක්. 400	56.189	55.241
06	වේලි ආරක්ෂණ කටයුතු ගේට්ටු අලුත්වැඩියා කටයුතු	ගේට්ටු 64	ගේට්ටු 64	88.357	88.345
07	ප්‍රධාන ජලාශවලටඅදාල යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම	කාර්යය 140	කාර්යය 130	41.000	35.358
08	කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර	යන්ත්‍ර 10	යන්ත්‍ර 10	13.898	13.900
09	වාහන අලුත්වැඩියා කටයුතු	වාහන 25	වාහන 25	14.502	14.500
10	කාර්යාලීය උපකරණ හා කම්හල් උපකරණ සපයා ගැනීමේ කටයුතු	උපකරණ 50	උපකරණ 45	4.455	4.424
එකතුව				**297,000**	**290,314**

2.4 ජල කළමනාකරණ ලේකම් කාර්යාලය

ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මගින් වාර්ෂික යල සහ මහ කන්නයන් සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති නිර්දේශ කර මහවැලි පද්ධති සඳහා මෙහෙයුම් සැළසුම් සකස් කිරීම සිදුකරන අතර මෙය මූලික ලෙස වාරිමාර්ග හා බලශක්ති අවශ්‍යතා මත පදනම් ව ප්‍රධාන ලෙස වී සහ අතුරු වැවිලි බෝග නිෂ්පාදනය සඳහා පුළුල් දායකත්වයක් ලබාදෙන ජාතික වැඩ සටහන වේ. මෙය සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ උපදෙස් සපයන ඒකකයක් ලෙස ජල පාලන ලේකම් කාර්යාලය මගින් ජලපාලන කමිටුවට අයත් සාමාජික ආයතන සම්බන්ධීකරණය කරගනිමින් සියලු මෙහෙයුම් සැළසුම් සතිපතා අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සමාලෝචනය හා ඉදිරි සති ජල මෙහෙයුම් සැළසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම සිදුකරන අතර එය කෘෂි, විදුලි හා පානීය ජල අවශ්‍යතාද සලකමින් සමස්ත පද්ධතිය තුල නිර්දේශිත ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබන්නකි.

2.4.1 2018/19 මහ කන්නය (2018 ඔක්.01 - 2019 මාර්තු 31)

2018/2019 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටු රැස්වීම 2018. ඔක්තෝම්බර් මස 19 දින පේරාදෙණිය ගන්නොරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ වනවිට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් කොත්මලේ 87.2%, වික්ටෝරියා 83.1%, මොරගහකන්ද 42.9%, වලව 55.2%, හුරුලුවැව 23.5%, මාදුරුඔය 38.9% ලෙස පැවතීය.

ඒ වනවිට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී තිබීම හේතුකොට ජලය නිකුත් කරන ලෙස දන්වන ලද අතර ඒ අනුව ජලය නිකුත් කිරීම, 2018 ඔක්තෝබර් මැද භාගය වනවිට ආරම්භ කිරීමට හැකිවිය. ඒ අනුව 2018/19 මහ කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 191,561 වූ අතර එය සමස්ථ ලෙස 100 % විය.

මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 1472 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී. සමස්ත විදුලිබල උත්පාදනය 2018/19 මහ කන්නය තුල පැවති ආකාරය පළමුවන රූප සටහනින් දැක්වේ.



පළමු රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2018/19 මහ කන්නයේ වගා සැළසුම හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.



දෙවන රූප සටහන

2.4.2 2019 යල කන්නය - (2019 අප්‍රේල් 01 - 2019 සැප්. 30)

2019 යල කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටු රැස්වීම 2019 මාර්තු මස 29 වන දින පේරාදෙණිය ගන්නොරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ වනවිට කොත්මලේ ජලාශයේ සක්‍රීය ජල මට්ටම 31.9% ද, වික්ටෝරියා 37.5%, මොරගහකන්ද 83.3%, වලව 88.8%, මාදුරුඔය 80.5% ද, හුරුලුවැව 75.2% ලෙස ජල මට්ටම් පැවති අතර පරාක්‍රම සමුද්‍රය ජල මට්ටම 94.3% ක් ලෙස උපරිම ජල මට්ටමට ආසන්නව පැවතිනි.

2019 යල කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 162,224 වූ අතර එය ආසන්න ලෙස මුලු වගාවෙන් 84% ක ප්‍රමාණයක් විය.
මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 631 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී. 2019 යල කන්නය තුල විදුලිබල උත්පාදනය පැවති ආකාරය තුන්වන රූප සටහනින් දැක්වේ.



තෙවන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ පවතින කලාපවල 2019 යල කන්නයේ සැලසුම හා ලබාගත් ප්‍රගතිය සිව්වැනි රූප සටහනින් දැක්වේ.



හතරවන රූප සටහන

2.4.3 2019/20 මහ කන්නය (2019 ඔක්තෝබර් 01 - 2019 දෙසැම්බර්.31 දක්වා)

2019/20 මහ කන්නය සඳහා වූ මහවැලි ජලපාලන කමිටුව 2019 ඔක්තෝබර් මස 17 වන දින පේරාදෙනිය ගන්නෝරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර, ඒ වනවිට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම් කොත්මලේ 91.7%, වික්ටෝරියා 70.5%, මොරගහකන්ද 35.3%, වලව 49.7%, හුරුලුවැව 10.1%, මාදුරුඔය 12.3% ලෙස පැවතීය.

ඒ වනවිට ඊසාන දිග මෝසම් වැසි ආරම්භවී තිබීම හේතුවෙන් ජලය නිකුත් කිරීම 2019 ඔක්තෝබර් මැද භාගය වනවිට ආරම්භ කිරීමට හැකිවිය. 2019/20 මහ කන්නයේ හෙක්. 187,285ක් වගා කිරීමට සැලසුම් කර ඇති අතර එය සමස්ථ වගා වපසරියෙන් 100 විය. මෙම කාලය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 807 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදී. 2019/20 මහ කන්නය තුල විදුලිබල උත්පාදනය පැවති ආකාරය පස්වන රූප සටහනින් දැක්වේ.



පස්වන රූප සටහන

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2019/20 මහ කන්නයේ වගා සැලසුම් හය වන රූප සටහනින් දැක්වේ.



හයවන රූප සටහන

2.5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

හැඳින්වීම:

මහවැලි බල ප්‍රදේශ තුළ තිරසාර සංවර්ධනය අරමුණු කරගත් භෞතික, ආර්ථික, සමාජයීය සංවර්ධනය හා පරිසර කළමනාකරණ ඉලක්ක ඔස්සේ ඒකාබද්ධ සැලසුම්කරණය ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ කාර්යභාරයයි. මහවැලි මහසැලැස්ම අනුව සංවර්ධන ප්‍රදේශ වල ස්වභාවය අධ්‍යයනය කර අනාගත සංවර්ධන ඉලක්ක සඳහා පුරෝකථනයන් සිදුකර ව්‍යුහාත්මක සැලසුම්, කලාපීය සැලසුම්, නැවත පදිංචි කිරීමේ සැලසුම්, නගර හා ග්‍රාමීය මධ්‍යස්ථාන සැලසුම් සකස් කිරීමට කටයුතු කරනු ලබයි.

2.5.1 ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ මූලික කාර්යය:

- සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනාගැනීම.
- සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශ වල මූලික දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා පුරෝකථනයන් සිදුකිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශ වලට අදාල සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- මහවැලි බල ප්‍රදේශ වල සැලසුම් යාවත්කාලීන කිරීම.
- තිරසාර භූමි භාවිතය තහවුරු කරමින් ඉඩම් බැහැර කිරීම් සඳහා වන භෞතික සැලසුම් නිර්දේශ ලබාදීම.
- අනවසර ඉඩම් අත්පත් කරගැනීම පාලනය හා සංවේදී පරිසර පද්ධති හා රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම.

2.5.2 2019 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය

ක්‍රියාකරකම	**වාර්ෂික මුදල් වෙන්කිරීම (රු.මි.)**	**2019.12.31 දක්වා වූ ඉලක්ක**		**2019.12.31 දක්වා වූ ප්‍රගතිය**	
		මූල්‍ය (රු.මි.)	**භෞතික**	**මූල්‍ය (රු.මි.)**	**භෞතික**
මහවැලි කලාපයන්හි සැලසුම් ස්කෑන් කිරීම, සැලසුම් යාවත් කාලීන කිරීම හා ඒ අනුව උපායමාර්ගික සැලසුම් සකස් කිරීම.	0.5	0.5	උපායමාර්ගික සැලසුම් 05	0.48	උපායමාර්ගික සැලසුම් 05
මහවැලි ගඟ රක්ෂිත සීමාව වෙන් කිරීම. (කි.මී. 50)	1.0	1.0	මහවැලි ගඟ (කි.මී.50)	0.71	කි.මී. 50 ක මැනුම් කටයුතු අවසන් කර ඇත
එකතුව	1.5	1.5		1.19	

2.5.3 මාදුරු ඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අදාලව අලි මංකඩ පදිංචි ජනතාව පිළිබඳ සමීක්ෂණය සිදු කිරීම



1979.06.15 හා අංක 41 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විශේෂ බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ඇති විශේෂ ව්‍යාපෘතියක් වන මදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කලයුතු වූ ඉඩම් පරිහරණ දත්ත අධ්‍යන වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දුන් අතර ඒ සඳහා ඉඩම් භාවිතය පිලිබඳ සමීක්ෂණ සිදු කිරීම.

එමෙන්ම යෝජිත අලිමංකඩ ස්ථාපිත කිරීම හේතුවෙන් ව්‍යාපෘති බල ප්‍රදේශයට බාහිරව ඉදිකර තිබූ නිවාස සම්බන්ධ තොරතුරු හා වන සංරක්ෂණ ප්‍රදේශ තුල ඉදිකිරීමට යෝජිත මාර්ග පිළිබඳ තොරතුරු ක්ෂේත්‍ර පරීක්ෂා මගින් සමීක්ෂණය කිරීම.

භෞතික සැලසුම් කමිටු වාර්තා/ ගංගාශ්‍රිත ස්ථාවර කමිටු වාර්තා ලැබීම් වලට අදාළ ප්‍රගතිය දැක්වෙන සාරාංශය (2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා)

කලාපය/රක්ෂිත ප්‍රදේශ	යොමු කර ඇති ලිපි ප්‍රමාණය	යොමු කර ඇති මුළු ස්ථාන ප්‍රමාණය	නිර්දේශ කර ඇති ප්‍රමාණය	නිර්දේශ කර නොමැති ප්‍රමාණය	වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා යොමු කර ඇති ප්‍රමාණය
බී කලාපය	53	376	343	14	12
සී කලාපය	34	3293	3266	8 (03 ක් සඳහා නිර්දේශ සකස් කරමින් පවතී)	16
ඩී කලාපය	25	45	41	-	4
ජී කලාපය	35	83	58	6	7
එච් කලාපය	63	112	106	(06 ක් සඳහා නිර්දේශ සකස් කරමින් පවතී)	-
එල් කලාපය	12	22	20	(02 ක් සඳහා නිර්දේශ සකස් කරමින්	-

					පවතී)	
වලව කලාපය	භෞතික සැ.කමිටු වාර්තා	45	213	196	10	5
	තේරීම් ලේඛන	9	537	492	45 ක් පරික්ෂා කරමින් පවතී.	
රඹකැන්ඔය කලාපය		70	145	144		1
වික්ටෝරියා කලාපය		17	19	12	1	3
හුරුළු වැව කලාපය		15	32	31	1	-
බෝවතැන්න		11	11	11	-	-
ගංගා හා ජලාශ්‍ර ආශ්‍රිත		16	24	8	8	8
එකතුව		405	4936	4728	104	56

2.5.4 2019 වර්ෂයේ සැලසුම්

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සජීවී වනාන්තර පවරාදීමේ වැඩ පිළිවෙල යටතේ කොත්මලේ බල ප්‍රදේශයට අයත් වන ගහනය සහිත ස්ථාන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමු කිරීම.



- මහවැලි එල් කලාපයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු රක්ෂිත ප්‍රදේශ තුල දැනට පදිංචිය දරණ හා ග්‍රාමීය වැව් පද්ධතිය ඇතුලත් භූමි ප්‍රදේශ හා එහි අස්වැද්දුම් ප්‍රදේශය රක්ෂිතභාවයෙන් නිදහස් කරගැනීම සඳහා සැලසුම් කිරීම.

- එක් එක් මහවැලි කලාපය තුල පවතින ගොවිපළ ඉඩම් වල සැලසුම් සකස් කිරීම යටතේ ගොවිපළ ඉඩම් සඳහා ඉඩම් පරිහරණ සලසුම් සකස් කිරීම.

කලාපය	ගොවිපළ
වලව	කන්දකැටිය ගොවිපළ
	කව්විගල් ආර ගොවිපළ
	සුරියවැව
	මහගම
	කට්ටකඩුව
	සේද ගොවිපොළ
	ගුරුගොඩවෙල
බී	අරලගංවිල (Seed Farm)
සී	නවමැදගම කෘෂිකාර්මික ගොවිපළ
එව්	කලන්කුට්ටිය



- මහවැලි බල ප්‍රදේශ තුල ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති සහ අනාගතයේදී ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දිය හැකි ඉඩම් හඳුනා ගැනීම.

- මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාසයේ ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දිය හැකි ඉඩම් හඳුනා ගැනීම හා සිතියම් ගත කිරීම.







- මැදිරිගිරිය නව සංවර්ධන කලාපයේ ආයෝජන යෝජනා ව්‍යාපෘති සඳහා ඉඩම් වෙන් කිරීම.



2.6 වන හා පරිසර අංශය

හැඳින්වීම

ශ්‍රී ලංකාවට සමාජ ආර්ථික ප්‍රතිලාභ රැසක් හිමිකර දෙමින් ක්‍රියාත්මක වූ මහවැලි මහ සැලැස්ම තිරසාර පරිසර සංරක්ෂණ වැඩපිළිවෙලක් යටතේ ඉදිරියට ගෙන යාමට මූලිකව සැලසුම් කල අතර එමගින් යෝජිත සංවර්ධන ක්‍රියාවලියේ සෑම පියවරකින්ම සිදුවිය හැකි පාරිසරික බලපෑම හා විපර්යාස අවම මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණ විය.

ඒ අනුව සංවර්ධනය කරන ලද පහළ මහවැලි නිම්න කලාප මෙන්ම ඉහළ ජලාධාර ප්‍රදේශයද සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම සඳහා එහි සොබා සම්පත් මනාලෙස සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම හා පවත්වාගෙන යාම වන හා පරිසර අංශය වෙත පැවරුනු මූලික කාර්යභාරය විය.

දැක්ම :-
තිරසාර සංවර්ධනයක් උදෙසා මහවැලි ගංගා ද්‍රෝණිය නිරෝගීව හා සවීමත්ව පවත්වා ගැනීම.
(Healthy Mahaweli River Basin for Sustainable Development)

2.6.1 2019 මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ප්‍රගතිය

අංකය	අංශය/කලාපය	මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	2020 වර්ෂයේදී ගෙවීමට යොමුකළ බිල්පත් (රු.මි.)	එකතුව (රු.මි.)	ප්‍රතිශතය
01	පරිසර හා වනසංරක්ෂණ අංශය-කොත්මලේ	30.00	29.80	2.32	32.15	107.1%
02	බී,සී,ඩී,ජී,එච්,වලව, හුරුළුවැව,වික්ටෝරියා, රඹකැන්ඔය (මහවැලි කලාප)	54.78	53.83	0	53.83	98%
03	විශේෂ ව්‍යාපෘති (1.)වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය,	13.08	11.21	0	11.21	86%
	(2.) රඹකැන්ඔය ව්‍යාපෘතිය	3.6	2.164	1.6	3.764	105%
	(3.) රිදීමාලියද්ද ව්‍යාපෘතිය	3	1.554	1.4	2.954	98%
	එකතුව	104.46	98.56	5.32	103.88	99%

2.6.2 2019 භෞතික ප්‍රගතිය:

අ.අ	වැඩසටහන	ඉලක්කය	ප්‍රගතිය
01	වන වැස්ම 30%කින් වැඩි කිරීම (පැල ලක්ෂ 50 නිෂ්පාදනය හා සිටුවීමේ වැඩසටහන)	පැල 5,000,000	පැල නිෂ්පාදනය - 4,181,427 (84%) ක්ෂෙත්‍රයේ සිටුවීම-2,019,045(40%)
02	පාංශු සංරක්ෂණ වැඩසටහන	මීටර් 6000 /ඝ.මී. 240	මීටර් 7350 ක් (ඉහළ මහවැලි ජලාධාරයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක ,ක්ෂෙත්‍ර 42ක්).
03	මහවැලි පවිත්‍ර ගංගා වැඩසටහන		
3.1	ජල තත්ව මිනුම් වැඩසටහන	ස්ථාන19ක	ඉහළ ජලාධාරය තුල ස්ථාන 19ක ජල තත්ව මිණුම් මසකට වරක් සිදුකර ඇත.
3.2	ජල විද්‍යා අධ්‍යයනය	ස්ථාන 07	මහවැලි ඟඟ හා මහවැලි උප ජලාධාර ගංගා 07ක දෛනිකව ජලවිද්‍යා මිනුම් ලබාගෙන ඇත.
3.3	කසල කළමනාකරණ සඳහා දැල් වැට ඉදිකිරීම	මීටර් 225	වැට ඉදිකිරීම මීටර් 124 නිමකර ඇත
3.4	පවිත්‍ර ගංගා වැඩසටහන දැනුවත් කිරීම	වැඩසටහන් -10	පිහාඹය සංරක්ෂණය සම්බන්ධව මෙහෙයුම් කමිටු 02 ක් පවත්වන ලදී. ගම්පොල කැලිකසළ ගැටළුව සම්බන්ධව උඩනළාත ප්‍රා.ලේ කාර්යාලය හා අනෙකුත් ආයතන සමඟ මෙහෙයුම් කමිටුවක් පැවැත්වීමට සාකච්ඡා කර ඇත. පාසල් දැනුවත් කිරීම් 11ක් පවත්වා
3.5	ආක්‍රමණශීලි ජීවී ව්‍යාප්තිය පාලනය සඳහා වැව්වල ආක්‍රමණකාරී ජලජ ශාඛ ඉවත් කිරීම	වැව් 16	වැව් 15
		(බී කලාපය-10, සී කලාපය -3, එච්-කලාපය-1,මැදිරිගිරිය -2,)	සී කලාපය-වැව් 04යි (හැංගුම වැව, විජයපුර වැව, වීරලන්ද වැව,දොළකන්ද වැව)
			එච් කලාපයේ වැව් 07යි. (තම්මැන්නාගම වැව,ජෝෂප් වැව,පොත්තේගම වැව,මීගලෑවවැව,මැදින්නොරුව වැව,මරදන්කල්ල වැව)
			රඹකැන්ඔය-01යි(මහඔය ජලාශය)
			එල් කලාපය-වැව් 03යි.
	රක්ෂිතවල යෝධ නිදිකුම්බා ඉවත් කිරීම	හෙක්ටයාර් 4 (රඹකැන්ඔ	රඹකැන්ඔය පොල්ලෙබැද්ද කොට්ඨාශය-හෙක්ටයාර් 01

		ය-හෙක්. 4)	
04	අලිමිනිස් ගැටුම කළමනාකරණය		
4.1	විදුලි වැට නඩත්තු කිරීම	කි.මී. 93.8	කි.මී. 93.8
		(බී- කි.මී 24, එච් - කි.මී - 11, රඹකැන්ඔය-කි.මී -10, එල්- 48.8	බී කලාපයේ මහවැලිතැන්න(16) හා මහසෙන්පුර(8) විදුලි වැට කි.මී 24
			රඹකැන්ඔය කලාපයේ විදුලිවැට කි.මී 10
			එල් කලාපයේ වැලිඔය පාලම-ගජබාපුර -කි.මී. 20, ගජබාපුර-නෙළුම්වැව කි.මී. 18.8, හැලඹවැව-කි.මී. 10
			එච් කලාපයේ නිරාවිය ගොවිපල වටා විදුලි වැට කි.මී 11
	විදුලි වැට ඉදිකිරීම	කි.මී. 8	කි.මී- 23.7
		(එල් කලාපය-- ජනකපුර-දෙවන අදියර)	බී කලාපයේ සෙවනපිටිය ඒකකයේ කි.මී 8ක විදුලිවැටක් ඉදිකර ඇත. වැලිකන්ද පැලතවාන වටා කි.මී 1.6 ක විදුලිවැටක් හා රුහුණුකෙත සංචාරක බංගලාව වටා කි.මී 1.2 ක විදුලි වැට ඉදිකර ඇත
			එල් කලාපයේ ජනකපුර විදුලි වැට කි.මී. 7.9ක් ඉදිකිරීම් සිදු කර ඇත.
			සී කලාපයේ නවමැදගම කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වටා කී.මී 5 ක විදුලි වැටක් ඉදිකර ඇත(අමතර ප්‍රතිපාදන ලැබීම මත)
4.2	ජීව වැට ඉදිකිරීම/නඩත්තුව	කි.මී 12	කි.මී. 12
		(සී කලාපය -කි.මී-1, ජී කලාපය-කි.මී-3, වලව-කි.මී-6, මැදිරිගිරිය-කි.මී-2)	බී කලාපය,මහින්දාගම ඒකකයේ ජීවී වැට කි.මී. 05ක් නඩත්තුකර ඇත.
			සී කලාපයේ ස්ථාන 03ක එකතුව කි.මී.01ක් වනසේ ජීව වැට ඉදිකර ඇත. (වෙහෙරගල-කණිවිවිගල -මී.500 සිරිපුර නාමල්ගම-මී. 300 මැදගම-වැව් මැදගම- මීටර් 200)
			මැදිරිගිරිය කලාපය, බිසෝපුර ගොවිපළ වටා කි:මී: 2ක සජීවී වැට ඉදිකර ඇත.
			වලව කලාපයේ මයුරපුර කොට්ඨාශයේ සමරකොන්

			ගොවිසංවිධානය සමඟ කි.මී 4ක සජීවී වැටක් ඉදිකරන ලදී.
5	පරිසර අධ්‍යාපන , පුහුණු හා ප්‍රවර්ධන	වැඩසටහන් 125	වැඩසටහන් 176 (ලෝක ජල දිනය, අළුත් අවුරුදු නැකතට පැලසිටුවීමේ දැනුවත් කිරීම්, ජෛව විවධත්ව දිනය- මැයි 22 ට ලෝක පරිසර දිනය හා ජාතික පාරිසරික සතිය , මහවැලි ක්‍රීඩා වලට අදාල ව හා හරිත පාසල් ආදිය පිළිබඳව දැනුවත් කිරීම් හා ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම)
5.1	මහවැලි තුරු ඉතුරුම් වැඩසටහන	ප්‍රධාන වැඩසටහන් 10(කලාප-9, පරිසර අංශය)	වැඩසටහන් 10 තුරු ඉතුරුම් දැනුවත් කිරීමේ වැඩසටහන් 39ක් පමණ පවත්වා ඇත. පැල නිෂ්පාදනය-41823 ගිණුම් සංඛ්‍යාව-291
6	මහවැලි හරිත නගර/ග්‍රාම/ පාසල් වැඩසටහන	වැඩසටහන් -කලාප 6	වැඩසටහන් -කලාප 08
			බී කලාපය -වැඩසටහන් 06 විජේබාපුර කොට්ඨාශ කාර්යාලය, සිංහපුර කොට්ඨාශ කාර්යාලය, නේවාසික.ව්‍යාපාර කාරියාලය ,දිඹුලාගල කාශ්‍යප විදුහල,මොණරතැන්න පන්සල් භූමිය,මනම්පිටිය වාලුකාරාමය
			සී කලාපය-වැඩසටහන් 03 නුවරගල, වෙහෙරගල කොට්ඨාශ කාර්යාලවල හරිත කාර්යාල වැඩසටහන කෘෂිකර්ම කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය
			මොරගහකන්ද කලාපය- වැඩසටහන් 01 ඒකක කාර්යාලවල භූමි අලංකරණ වැඩසටහන
			එල් කලාපයේ -වැඩසටහන් 01 හරිත ගම්මාන වැඩසටහනක් ආරම්භකර ඇත.
			වලව කලාපය-වැඩසටහන් 02 • සූරිය වැව හරිත පාසල සඳහා උපකරණ ලබාදීම. • හරිත කාර්යාල වැඩසටහන- නේවාසික ව්‍යාපාර කාර්යාලය,මධ්‍යම පැල තවාන , මුරවැසිහේන, මයුරපුර,

			වන්දිකාවැව කොට්ඨාශ කාර්යාල
			හර්ත පාසල් දැනුවත් කිරීම් • හුරුළු වැව කලාපයේ පාසල් -03, • රඹකැන්ඔය-පාසල් 04 • එච් කලාපයේ හරිත පාසල් 07ක් තෝරා දැනුවත් කිරීමේ වැඩසටහන් හා පාසල් ගෙවත්ත සංවර්ධනය සඳහා උපකරණ ලබා දී ඇත.

2.6.3 ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සඳහා වූ ක්‍රියාකාරකම්

- **පරිසර හා වන සංරක්ෂණ අංශය - කොත්මලේ**

2019 වසර ප්‍රධාන ක්‍රියාකාරම් සඳහා මූල්‍ය ප්‍රගතිය

වාර්ෂික අදායම:

ආදායම් විස්තරය	අදායම් ඉලක්කය (රු.මි)	අදායම් ප්‍රගතිය(රු.මි)	ආදායම් ප්‍රතිශතය
පැල අලෙවිය හා ගොවිපල අදායම	4.085	4.001	97%
ණය පොලිය හා නිවාස කුලී ආදායම	0.933	1.247	133%
එකතුව	5.018	5.248	104%

2019 වර්ෂයේ වාර්ෂික ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් ප්‍රගතිය

මූල්‍ය විස්තරය	මූල්‍ය ඉලක්කය (රු.මි)	වාර්ෂික මූල්‍ය ප්‍රගතිය (රු.මි)	ගෙවීමට ඇති (රු.මි)	එකතුව (රු.මි)	මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය
1. ප්‍රාග්ධන වියදම්	30.00	29.79	2.32	32.11	107.1%
2. පුනරාවර්ථන වියදම්	44.08	45.28	0	45.28	102.7%

2.6.4 මහවැලි කලාප තුල ක්‍රියාත්මක පරිසර හා වන සංරක්ෂණ වැඩසටහන

හැදින්වීම:-

මහවැලි කඩිනම් සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් බලපෑමට ලක්වූ ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය කිරීම විශේෂයෙන්ම එම කලාපවල වැඩිවන ජනගහනය හේතුවෙන් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු හේතුවෙන් පාරිසරික හා සාමාජීය වශයෙන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පරිසර අංශයේ මග පෙන්වීම යටතේ සිදුවේ.

ඒ යටතේ මූලිකවම පහත පරිසර ක්‍රියාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- වන ගහනය වැඩිකිරීම සඳහා වූ අවශ්‍ය පැල තවාන් ආරම්භ කිරීම, නඩත්තු කිරීම
- ක්ෂද්‍ර ජල පෝෂක ප්‍රදේශ, ජලාශ රක්ෂිත ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම හා වනගහනය වැඩිකිරීම සඳහාවූ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මහවැලි ජානපදිකයින් හා පාසැල් ළමුන් ඇතුළු සමස්ථ ප්‍රජාව සඳහා පරිසර අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අලිමිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම, ජීව වැට ඉදිකිරීම හා නඩත්තු කිරීම
- ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් විශේෂ මර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- හරිත නගර/හරිත ග්‍රාම/හරිත කාර්යාල/හරිත පාසල් වැඩසටහන

2.6.5 වන හා පරිසර අංශය මගින් ඉටු කරනු ලබන විශේෂ කටයුතු

- පරිසර හා වන සංරක්ෂණ අංශය ක්ෂේත්‍ර කටයුතු වලට අමතරව මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මකකරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු මෙහෙයවීම හා පසුවිපරම් කිරීම සහ මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු , මෙහෙයුම් කමිටු හා ස්ථාවර කමිටු නියෝජනය කිරීම සිදුකරන ලබයි.

- මීට අමතරව පරිසර හා වන සංරක්ෂණ අංශය අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා තාක්ෂණික කමිටුව නියෝජනය කිරීමද සිදුකරනු ලබයි.

- ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ පරිපාලනය කටයුතු හා පසුවිපරම් කටයුතු සිදුකිරීම.

තුන්වැනි පරිච්ඡේදය

3.0 සංවර්ධන අංශය

සංවර්ධන අංශය ප්‍රධාන අංශ 07 කින් සමන්විත වන අතර එම අංශ පහත පරිදි වේ.

01. ඉඩම් අංශය
02. කෘෂිකර්ම සංවර්ධන අංශය
03. පශු සම්පත් සංවර්ධන අංශය
04. ආයතන සංවර්ධන අංශය
05. ව්‍යාපාර සංවර්ධන අංශය
06. මානව සම්පත් කළමනාකරණ අංශය
07. පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

3.1 ඉඩම් අංශය

හැදින්වීම:-

සීමිත සම්පතක් වන ඉඩම් යහපත් කළමණාකරණ විධි මඟින් මහවැලි බල ප්‍රදේශ තුල පදිංචි ප්‍රතිලාභී ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම තුලින් ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්වය වැඩි දියුණු කිරීමට දායකවීම.

3.1.1 ඉඩම් අංශයේ කාර්යභාරය

01.ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබා දීම හා පසු කටයුතු.
02.රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයින් හා ආයතන වෙත ඉඩම් ලබා දීම හා පසු කටයුතු.

අවසරපත්‍ර ලබා දීම - ඉඩම් සංවර්ධන ආඥා පනත- 2019

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	4,700	4,044
සී	4,530	4,155
ඩී	900	775
එච්	1,900	704
එල්	1,600	1,243
වික්ටෝරියා	300	42
හුරුළුවැව	360	300
මොරගහකන්ද	910	628
වලව	3,150	2,075
රඹකැන්ඔය	1,550	1,401
එකතුව	**19,900**	**15,364**

ප්‍රදානපත්‍ර ලබා දීම
ඉඩම් සංවර්ධන ආඥා පනත - 2019

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	2,100	780
සී	4,690	4,146
ඩී	650	455
එච්	3,800	1,039
එල්	1,660	1,360
වික්ටෝරියා	90	-
හුරුළුවැව	530	249
මොරගහකන්ද	500	333
වලව	2,470	1,486
රඹකැන්ඔය	110	-
එකතුව	**16,590**	**9,848**

දීර්ඝ කාලීන බදුකර ලබා දීම
රජයේ ඉඩම් ආඥා පනත - 2019

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	235	6
සී	25	5
ඩී	-	-
එච්	220	107
එල්	45	-
වික්ටෝරියා	35	5
හුරුළුවැව	25	7
මොරගහකන්ද	25	4
වලව	70	9
රඹකැන්ඔය	5	1
එකතුව	**685**	**144**

රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබා දීම - 2019

කලාපය	පැවරුම් නියෝග		ඉඩම් භාරදීම	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
බී	30	26	5	4
සී	30	18	10	8
ඩී	-	-	-	-
එච්	10	-	10	-
එල්	5	8	4	-
වික්ටෝරියා	5	-	5	-
හුරුළුවැව	5	4	5	-
මොරගහකන්ද	4	2	2	-
වලව	10	5	10	6
රඹකැන්ඔය	-	-	8	7
එකතුව	**99**	**63**	**59**	**25**

විහාරස්ථාන දීමනා පත්‍ර ලබා දීම 2019

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	30	8
සී	35	13
ඩී	-	-
එච්	10	3
එල්	6	-
වික්ටෝරියා	5	1
හුරුළුවැව	10	6
මොරගහකන්ද	4	-
වලව	10	3
රඹකැන්ඔය	2	2
එකතුව	112	36

දීමනාකර (නිවාස) ලබා දීම - 2019

කලාපය	ඉලක්කය	ප්‍රගතිය
බී	15	-
සී	10	-
ඩී	-	-
එච්	250	31
එල්	40	-
වික්ටෝරියා	80	5
හුරුළුවැව	25	-
මොරගහකන්ද	15	3
වලව	150	55
රඹකැන්ඔය	5	-
එකතුව	590	94

3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

කාර්යභාරය:

- ආහාර නිෂ්පාදන ජාතික ඉලක්කයන්ට අනුව මහවැලි වාරි හා වාරි නොවන ඉඩම් වල බෝග වගාව, සත්ව නිෂ්පාදනය හා කෘෂි ව්‍යාපාර ඇති කිරීම සඳහා වාර්ෂික ඉලක්කයන් සකසා ගැනීම.
- වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන වලට අනුකූලව ව්‍යාප්ත ඉලක්ක හා උපක්‍රම සැලසුම් සකස් කිරීම, ඒවා කලාප මට්ටමින් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කරවීම, පසුවිපරම අධීක්ෂණය හා වාර්තා කිරීම.
- කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වලදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම, ග්‍රාමීය කටයුතු පශුසම්පත්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හා සියළුම බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීම.

3.2.1 2019 වර්ෂයේ අයවැය මගින් කෘෂි ඵලදායිතා වැඩසටහනට මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම.

2019 වර්ෂය සඳහා කෘෂිකර්ම නිෂ්පාදන ඵලදායිතා වැඩසටහනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් රු.මි. 151ක මුල්‍ය ප්‍රතිපාදන අනුමත කරන ලද අතර එය පහත දැක්වෙන පරිදි මහවැලි කලාප සඳහා වෙන්කර ලබාදෙන ලදී.

කලාපය	අනුමත මුදල් රු.මිලි
බී	29.00
සී	13.00
ඩී	3.00
ජී	15.00
එච්	42.00
හුරුළුවැව	6.00
වලව	39.00
වික්ටෝරියා / කොත්මලේ	2.00
ප්‍රධාන කාර්යාලය	2.00
එකතුව	151.0

	ක්‍රියාකාරකම	වෙන් කල මුදල රු.මිලි
1	වී නිෂ්පාදන ඵලදායිතා ප්‍රවර්ධනය	2.8
2	බෝග විවිධාංගීකරණය	12.4
3	පලතුරු බෝග සංවර්ධනය	1.8
4	ගෘහ ආර්ථික සංවර්ධන	5.6
5	කාබනික ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය	0.3
6	කෘෂි ව්‍යාප්ති කටයුතු	4.5
7	නිලධාරි පුහුණු කිරීම	2.7
8	ගොවිපල සංවර්ධනය	96.8
9	තවාන් හා පටක රෝපණ පැල නිෂ්පාදනය	10.3
10	කාළගුණ විපර්යාස සඳහා අනුගත වීමේ විශේෂ වැඩසටහන්	8.0
11	දිළිඳුකම පිටුදැකීම සඳහා වැඩසටහන්	2.1
12	කළමනාකරණ වියදම්	3.7
	එකතුව	151

ඉහත සඳහන් පරිදි කෘෂි ඵලදායිතා වැඩසටහන තුල කලාපය සඳහා වෙන්කල ප්‍රතිපාදන එම වැඩසටහනේ මූලික සැලසුම් වලට අනුව වියදම් කිරීම සඳහා සැලසුම් කරන ලදී.

ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය	ප්‍රගතිය
වී වගා ප්‍රවර්ධනය			
යාය වැඩසටහන්	සංඛ්‍යාව	100	75
ක්ෂේත්‍ර පාසල්	සංඛ්‍යාව	110	113
අස්වනු සමීක්ෂණ	සමීක්ෂණ	400	359
පැරෂුට් ක්‍රමයට වී වගා ව්‍යාප්තිය	හෙක්.	20	23
පත්‍ර වර්ණ දර්ශක භාවිතය	හෙක්.	2,000	2,000
ස්වයං බීජ වී නිෂ්පාදනය	හෙක්.	100	100
වෙනත් ක්ෂේත්‍ර භෝග			
බෝග වගා ආදර්ශන (බඩඉරිඟු, සෝයා, බීළඟුණු, මිරිස්, මුං, රටකජු, උඳු, කව්පි, කුරක්කන්)	සංඛ්‍යාව	45	40
සහන පදනම මත බීජ බෙදාදීම (බඩඉරිඟු, සෝයා, බීළඟුණු, මිරිස්, මුං, රටකජු, උඳු, කව්පි, කුරක්කන්)	කි. ග්‍රෑම්	7,954	14,311
බීළඟුණු මව් බල්බ වසන්තීකරණය	කි. ග්‍රෑම්	10,000	6,000
කෘෂි ළිං ලබා දීම	සංඛ්‍යාව	25	27
ජල පොම්ප ලබා දීම	සංඛ්‍යාව	4	7
ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීම	සංඛ්‍යාව	76	122
පලතුරු බෝග සංවර්ධනය			
අඹ ගස් පුනරුත්තාපන වැඩසටහන්	සංඛ්‍යාව	55	51
පළතුරු මැස්සා පාලන වැඩසටහන්	සංඛ්‍යාව	20	16
නව පළතුරු වගාව	හෙක්.	30	27
ගෙවතු සංවර්ධන වැඩසටහන			
වාර්ෂික සහ බහු වාර්ෂික බෝග වගාව ප්‍රවර්ධනය	ගෙවතු	6,000	6,135
මී පැණි නිෂ්පාදනය ප්‍රවර්ධන වැඩසටහන යටතේ මී මැසි පෙට්ටි ලබාදීම	මී මැසි පෙට්ටි	400	396
බිම් මල් නිෂ්පාදන වැඩසටහන්	සංඛ්‍යාව	60	62
කෘෂි ව්‍යාප්ති වැඩසටහන්			
ගොවි පුහුණු නිලධාරී පුහුණු කෘෂි පර්යේෂණ සහ ව්‍යාප්ති සංවාද බෝග සායන	සංඛ්‍යාව	1,249	1,250

3.2.2 2019 වර්ෂයේ කෘෂි ඵලදායිතා වැඩසටහනේ භෞතික ප්‍රගතිය

බීජ නිෂ්පාදන වැඩසටහන

බීජ වර්ගය	ප්‍රමාණය මෙ.ටො.
බීජ වී	4,543
ලොකු ළූණු සත්‍ය බීජ	1.7
සෝයා	356
රටකජු	19.5
කව්පි	8
බඩඉරිඟු	42
මිරිස්	1.2
ඵලවළු	23

පැල නිෂ්පාදන වැඩසටහන

පැල වර්ගය	ප්‍රමාණය
පළතුරු පැල	228,883
ගෙවතු පැල	395,160
වන පැල	317,702
ඵලවළු පැල	103,069
විසිතුරු පැල	25,319

සියළුම කලාප වල 2019 වර්ෂයේ ලබාදී ඇති නිපාදන වලට අනුව භෞතික ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකිරීමට කාර්ය මණ්ඩලය උනන්දුවෙන් මෙම භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට ක්‍රියාකර ඇත.

3.2.3 බෝග නිෂ්පාදනය ප්‍රගතිය සහ දායකත්වය - 2018/19 මහ සහ 2019 යල කන්නය

බෝගය	වපසරිය (හෙක්)	මහවැලි නිෂ්පාදනය (මෙ.ටො)	ජාතික නිෂ්පාදනය (මෙ.ටො)	මහවැලි දායකත්වය (%)
වී	156,696	889,774	4,592,000	19%
බඩ ඉරිඟු	2,823	12,659	245,600	5%
මුං	292	511	7,400	7%
කව්පි	321	409	8,100	5%
සෝයා	496	1,139	2,200	52%
අමු මිරිස්	636	5,052	76,867	7%
රටකජු	577	1,146	26,900	4%
උඳු	160	240	4,900	5%
තල	108	89	6,100	1%
කුරක්කන්	335	784	5,500	14%
ලොකුළූණු	448	8,957	18,600	48%
ඵළවළු	6,460	76,571		

පළතුරු බෝග

බෝගය	වපසරිය (හෙක්)	නිෂ්පාදනය (මෙ.ටො)
කෙසෙල්	9,761	146,411
පැපොල්	722.6	13,007
අඹ	2,222	9,330

(ජාතික නිෂ්පාදන දත්ත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය මගින් නිකුත්කරනු ලබන 2018/19 මහ සහ 2019 යල බෝග අස්වනු අනාවැකි වාර්තා වලින් ලබා ගන්නා ලදි.)

ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන තුල ජාතික ආහාර නිෂ්පාදනයට දායක වෙමින් හෝ ආර්ථිකය සරු කිරීම හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීම ඉතා සාර්ථකව ඉටුකර ඇත.

පැල සිටුවන යන්ත්‍ර භාවිතය



පැරෂුට් ක්‍රමයට පැල වැපිරීම



වී වගාවේ පළිබෝධ පාලන වැඩමුළු



බීජ වී නිෂ්පාදන වැඩසටහන



කුරක්කන් බීජ නිෂ්පාදන වැඩසටහන



තල බීජ නිෂ්පාදන වැඩසටහන



දෙමුහුම් මිරිස් බීජ නිෂ්පාදනය



බඩඉරිඟු වගාවේ සේනා දළඹුවා මර්ධනයට උගුල ලබාදීම





ආරක්ෂිත ගෘහ තුල වගාව



එලවළු වගාව සඳහා නව තාක්ෂණය භාවිතය



අඹ ගස් කප්පාදු වැඩසටහන්



පළතුරු වගාව පිළිබඳ පුහුණු වැඩසටහන්





කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන්







ගෙවතු සංවර්ධන වැඩසටහන්/ගෙවතු ආශ්‍රිත මී මැසි පාලනය පිළිබඳ/ගෙවතු ආශ්‍රිත බිම්මල් වගාව පිළිබඳපුහුණු වැඩසටහන්/ කෘෂි ප්‍රදර්ශන





3.3 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය

දැක්ම:-

සත්ව නිෂ්පාදන තුළින් මහවැලි පදිංචිකරුවන්ගේ පවුල්වල ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.

මෙහෙවර:-

සත්ත්ව නිෂ්පාදන ඵලදායීතාව හා ලාභදායීතාව ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම හා රටේ දළ දේශීය නිෂ්පාදනයට දායකවීම සඳහා වූ තිරසාර නිෂ්පාදන කාර්යය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම.

2019 සඳහා අරමුණු

- වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 25 දක්වා වැඩි කිරීම සහ ජාතික කිරි අවශ්‍යතාවය සපුරාලීම සඳහා වන දායකත්වය වැඩි කිරීම (ජාතික දායකත්වය 6%).
- වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8000 දක්වා වැඩි කිරීම සහ ජාතික දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය 27% දක්වා වැඩි කිරීම.
- වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 35 දක්වා වැඩි කිරීම.
- වාර්ෂික විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය යුගල මිලියන 29 දක්වා වැඩි කිරීම.
- පාසල් ළමුන් හා ප්‍රජාව අතර නැවුම් කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.
- සත්ව ජාන සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම, ප්‍රවර්ධනය සහ ඵලදායීතාව වැඩි කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම.
- නිසි පශු වෛද්‍ය සේවාවක් සැපයීම තුළින් සත්ව සෞඛ්‍යයේ ආරක්ෂාව සහතික කිරීම
- අගය එකතු කළ කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම
- කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සහ පදිංචිකරුවන්ගේ ගොවීන්ගේ ආදායම වැඩි කිරීම.
- සත්ව නිෂ්පාදන තුළින් පදිංචිකරුවන්ගේ ගොවීන්ගේ පෝෂණ තත්ත්වය සහතික කිරීම සහ ගොවි ප්‍රජාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.
- පුහුණු ආදර්ශ හා පර්යේෂණ සඳහා මහවැලි ගොවිපල භාවිතා කරමින් ගොවීන්ට තම තාක්ෂණය ලබාදීම.

3.3.1 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් පහත ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කරන ලදී.

1. කිරි ගව සංවර්ධන වැඩසටහන
2. කුකුළු පාලන ප්‍රවර්ධන වැඩසටහන
3. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය
4. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය
5. මහවැලි ආදර්ශ ගොවිපල සංවර්ධනය
6. එළු පාලන ප්‍රවර්ධන වැඩසටහන්
7. විශේෂ ව්‍යාපෘතීන් වල ධීවර හා පශු සම්පත් සංවර්ධන කාර්යයන්

1. කිරි ගව සංවර්ධන වැඩසටහන

මහවැලි ප්‍රදේශවල ක්‍රියාත්මක කිරි ගොවිපල ප්‍රධාන වශයෙන් සතුන් 2-5 යුත් කුඩා පරිමාණ ඒකකයන්ගෙන් සමන්විතය. සංගණනය හා සංඛ්‍යාලේඛන දත්ත වලට අනුව, රටේ විශාලතම ගවයින් සහ මී ගව ගහනය වියළි කලාපයෙන් සහ අතරමැදි කලාපයෙන් වාර්තා වේ. එබැවින්, කිරි කර්මාන්තය දියුණු කිරීම සඳහා මහවැලි ප්‍රදේශවලට විශාල විභවයක් ඇත. සම්පත් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව, ගොවීන් සූක්ෂ්ම, අර්ධ සූක්ෂ්ම හා නිදැලි ගව කළමනාකරණ ක්‍රමයන් අනුගමනය කරයි. ගව ගහනය ජර්සි සහ ජර්සි-සහිවාල් දෙමුහුම් මෙන්ම දේශීය ප්‍රභේදයන්ගෙන් සමන්විත වන අතර, වැඩි ප්‍රතිශතයක් දේශීය සහ සහිවාල් යන ප්‍රභේදවලින් වලින් යුක්ත වේ.

මීට අමතරව, මෙම ප්‍රදේශයේ ප්‍රමුඛ මී ගවයින් ප්‍රභේද වන්නේ මුරා, නිලිරවි සහ ඔවුන්ගේ දෙමුහුම් ප්‍රභේදය. දේශීය ප්‍රභේද හැරුණු විට දෙමුහුම් ආරවල දෙනුන්ගේ සාමාන්‍ය දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 3 සිට 7 දක්වා වෙනස් වේ. මී ගවයින්ගේ නිෂ්පාදනයේ උපරිම ධාරිතාව දිනකට කිරි ලීටර් 4 සිට 5 දක්වා වේ. කිරි නිෂ්පාදනයේ නිසි අස්වැන්නක් ලබා ගැනීම සඳහා සත්ව පෝෂණය ඉතා වැදගත් සාධකයකි. මේ අනුව, ගොවීන් සතුන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහා තණකොළ සහ සාන්ද්‍ර ආහාර යන දෙකම යොදා ගනී. වගා කරන ලද තෘණ ප්‍රභේදවලට CO3, ගිනි සහ බ්‍රැකේරියා ඇතුළත් වේ. ප්‍රදේශවල හරිත තෘණ සීමිත වන විට වියළි කාලය සඳහා භාවිතා කරන අනෙකුත් ආහාර සංරක්ෂණ ක්‍රම වන්නේ වියළි තෘණ සහ සයිලේජ් නිෂ්පාදනයයි. මහවැලි ප්‍රදේශයේ කිරි එකතු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන්නේ මිල්කෝ, නෙස්ලේ, කොත්මලේ, පැලවත්ත වැනි සමාගම් ය. සෙසු කණ්ඩායම් වශයෙන් කිරි එකතු කරන්නන්ගේ සමූපකාර සමිති, රිච් ලයිෆ්, කඩුවෙල, සීඅයිසී, වෙලෝ සහ මහවැලි ගොවිපල සහ පෞද්ගලික එකතු කරන්නන් ද මෙම කටයුත්තට සම්බන්ධ වී කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කරයි.

2019 දියර කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 25.5 කි. දෛනිකව දියර කිරි ලීටර් 75,000 ක් පමණ නිපදවන අතර ඉහත සමාගම් වෙත අලෙවිය මූලික අරමුණ වේ. මීට අමතරව සුළු ප්‍රමාණයක් දියර කිරි පරිභෝජනය සඳහා යොදා ගැනේ. කිරි ලීටරයක සාමාන්‍ය මිල රු.65ක් වන අතර 2019 වර්ෂයේ ද මහවැලි ගොවීන් කිරි නිෂ්පාදනයෙන් ලැබූ ආදායම රු මිලි.1658 කි.

- **කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග**

1. යටිතල පහසුකම් සංවර්ධනය, සම්පත් තිරසාර ලෙස උපයෝගී කර ගැනීම තුළින් අර්ධ සූක්ෂ්ම හා සූක්ෂ්ම ගව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම.

2. වැඩි දියුණු කරන ලද සතුන් හඳුන්වා දීම සහ සත්ව අභිජනනය වැඩි දියුණු කිරීම තුළින් එළ ගවයන්ගේ / මී ගවයින්ගේ ජානමය විභවය වැඩි දියුණු කිරීම

3. නිසි පෝෂණ සැලසුම්, ආහාර සංරක්ෂණ ක්‍රම, තෘණ බිම් ස්ථාපිත කිරීම සහ කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවන් ලබාදීම සම්බන්ධීකරණය තුළින් සත්ව පෝෂණය වැඩි දියුණු කිරීම සහ සත්ව ගහණය කළමනාකරණය කිරීම.

4. කිරි සමිති හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම තුළින් කිරි සමිති හා අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම.



කිරිගව කටයුතු ප්‍රවර්ධනය සඳහා පුහුණු සැසි පැවැත්වීම



තෘණ වගා ඒකක පිහිටුවීම



ගොවිපල තුළ යටිතල පහසුකම් දියුණු කිරීම



තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර ලබාදීම



අගය එකතු කළ කිරි නිෂ්පාදනය



ජංගම කිරි දොවන යන්ත්‍ර ලබාදීම

2. කුකුළු පාලනය ප්‍රවර්ධනය කිරීම

කුකුළු පාලන ප්‍රධාන වශයෙන් බිත්තර හා මස් නිෂ්පාදනය සඳහාත් මහවැලි පදිංචිකරුවන්ගේ පවුල්වල පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහාත් ක්‍රියාත්මක වේ. එසේම මෙම කර්මාන්තය ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීම සඳහා වූ ආදායම් උත්පාදන ප්‍රභවයකි. මහවැලි කලාප වල කුකුළු පාලනය වාණිජමය හා ගෘහාශ්‍රිත වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. ඒ අතරින් ගෘහාශ්‍රිත කුකුළු පාලනය ප්‍රධාන වශයෙන් මන්දපෝෂණය අවම කිරීමටත්, ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීමටත් විශේෂයෙන් ගෘහස්ථ කාන්තාවන්ට ස්වයං රැකියා අවස්ථා ලබා දීමටත් උපකාරී වේ. ග්‍රාමීය ප්‍රජාවේ ප්‍රෝටීන්

අවශ්‍යතා සපුරාලන අතරම රටේ 35% ක මන්දපෝෂණ තත්ත්වය අවම කිරීම සඳහා ගෘහාශ්‍රිත කුකුළු පාලනය එක් විසඳුමකි.

මූලික වශයෙන් ගොවින් 17,950 ක් පමණ ගෘහාශ්‍රිත කුකුළු පාලනයේ හා වාණිජමය බිත්තර හා බ්‍රොයිලර් නිෂ්පාදනයෙහි නිරතව සිටිති. 2019 දී බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 35 ක් වූ අතර මස් නිෂ්පාදනය මෙ.ටො.9,000 විය. ගම් කුකුළු බිත්තරයක සාමාන්‍ය මිල රු.20.00ක් වන අතර සාමාන්‍ය බිත්තරයක මිල රු.18.00කි. 2019 දී බිත්තර නිෂ්පාදනයෙන් ලබාගත් මුළු මුදල රු.මිලි. 630කි. කුකුළු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 310.00 ක් වන අතර මෙමගින් 2019 වර්ෂය සඳහා රු.මිලි.2790 ක මුදලක් මහවැලි කලාපයේ කුකුළු පාලනයේ නියුතු ගොවීන් අතර සංසරණය කර ඇත.

කුකුළු පාලනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග

1. කුකුළු නිවාස තැනීම මගින් මස් හා බිත්තර පිණිස පවතින කුකුළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
2. ගෘහාශ්‍රිත කුකුළු පාලන ප්‍රවර්ධනය සඳහා මසක් හා දිනක් වයසැති කුකුළු පැටවුන් බෙදා හැරීම.
3. උසස් තත්ත්වයේ පැටවුන් සැපයීම සහතික කිරීම සඳහා දෙමාපිය පරම්පරාව නඩත්තු කිරීම
4. සතුන්ගේ පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම තුළින් නිෂ්පාදනය කාර්යක්ෂමව හා ඵලදායිතාව සිදු කිරීම
5. එන්නත් හා නිසි සනීපාරක්ෂක වැඩසටහන මගින් සත්ව සෞඛ්‍ය සුරක්ෂිත කිරීම.



ගෘහාශ්‍රිත කුකුළු පැටවුන් ලබා දීම



බිත්තර නිෂ්පාදනය සඳහා සිදු කරනු ලබන වාණිජමය කුකුළු පාලනය

3. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

මිරිදිය ධීවර කර්මාන්තයෙහි පැවැත්ම සඳහා මහවැලි ප්‍රදේශවල ප්‍රධාන ජලාශ 10 ක් ඇතුළුව මධ්‍ය සහ කුඩා පරිමාණයේ ජලාශ 324ක් භාවිතා වේ. මෙමඟින්, ධීවර කර්මාන්තය ගොවි පවුල්වල පෝෂණ අවශ්‍යතාවය සහ රටේ ආහාර සුරක්ෂිතතාව සපුරාලීමට උපකාරී වේ. තිලාපියා, කැට්ලා සහ මිරිගාල් මිරිදිය මත්සය නිෂ්පාදනයේ ප්‍රමුඛතම මත්ස්‍ය විශේෂය වන අතර එම ප්‍රභේද සමස්ත නිෂ්පාදනයට සියයට 90 ක දායකත්වයක් ලබා දී ඇත. මීට අමතරව අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගත් මිරිදිය ඉස්සන් වගාව සිදු වේ. ජලාශ තුළ අඛණ්ඩව මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම මගින් ධීවර කර්මාන්තයේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබා දේ. මීට

අමතරව විශාල වැව් සංඛ්‍යාවක දැල් කූඩු තුළ මත්ස්‍ය ඇසිත්තන් වගාව ද සිදු කරයි. මෙමඟින් නිෂ්පාදන පිරිවැය අවම කර මෙම ක්ෂේත්‍රයෙන් ලැබෙන ලාභය වැඩි කරගැනීමට අපේක්ෂා කර ඇත.

මිරිදිය මත්සය වගාවේ නියැලුනු සමස්ථ ධීවර ප්‍රජාව 5450 කි. 2019 වර්ෂයේදී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 7364ක් වූ අතර එහි වටිනාකම රු.මිලි.1841කි. මෙලෙස විශාල හා මධ්‍ය පරිමාණයේ ජලාශ මෙන්ම කාලීන ජලාශවල ද මත්ස්‍ය නිෂ්පාදනය ඇතුළුව 2019 වර්ෂයේ ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට මහවැලි දායකත්වය 27% කි.

- **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමේ උපාය මාර්ග**

1. ජලාශ තුළ ඇඟිල්ලන් තැන්පත් කිරීම හා නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම.
2. ප්‍රදේශයේ මත්ස්‍ය ඇඟිල්ලන්ගේ අවශ්‍යතාවය සහතික කිරීම සඳහා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
3. ධීවර ආම්පන්න, දැල් සහ බෝට්ටු වැනි ධීවර උපකරණ ලබා දීමෙන් ධීවර සමිති සවිබල ගැන්වීම.
4. අගය එකතු කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ මාළු නිෂ්පාදනයේ අලෙවිකරණ ජාලය ශක්තිමත් කිරීම.
5. ධීවරයින්ට තාක්ෂණික දැනුම බෙදා හැරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
6. ජලාශවල මත්ස්‍ය නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා මිරිදිය මත්ස්‍ය වගා අස්වැන්න ලබා ගැනීම.





4. විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම

මහවැලි බී,සී.ඩී.එච් සහ උඩවලව කලාප වල විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රචලිතව පවතින අතර වර්ථමානයේ විසිතුරු මත්ස්‍ය වගාවේ නියැලෙන ගොවීන් සංඛ්‍යාව 840 ක් පමණ වේ. ජනපදිකයන් ලෙස ඉඩම් හිමි ප්‍රජාවේ දෙවන තෙවන පරම්පරාවේ දරුවන් අතර වගා කටයුතු සඳහා ඉඩම් සීමිත වීම නිසා කුඩා ඉඩම් ප්‍රමාණයක වැඩි ආදායමක් ලබාගත හැකි කර්මාන්තයක් ලෙස විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රචලිතව ඇත. මෙම කර්මාන්තය තුළ විසිතුරු මත්ස්‍ය වගාකරුවන් පැටවු නිෂ්පාදනයේ නියුතු අභිජනකයින්, මත්ස්‍ය නිෂ්පාදනය වෙළඳ පල සඳහා එකතු කරන්නන් සහ තොග හා සිල්ලර ප්‍රමාණයේ අලෙවිකරුවන් වශයෙන් විශාල පිරිසක් ජාලයක් ලෙස එකට බැඳුණු නිෂ්පාදන

ක්‍රියාවලියක් මෙම ක්ෂේත්‍රයේ දැකිය හැක. එසේම, පවුල් 800 කට වැඩි පිරිසක් සඳහා තම ජීවනෝපාය රඳා පවතින නිෂ්පාදන අංශයක් ලෙස ද සැළකිය හැක. එමෙන්ම ප්‍රාදේශීය මට්ටමේ ගැණුම්කරුවන් විසින් ගුණාත්මයෙන් යුතු නිෂ්පාදන විදේශ වෙළඳපලට යොමු කරන අතර, වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් මේ වන විට යොමු වන්නේ දේශීය වෙළඳපලට වේ. ඇමරිකාව, චීනය, ජපානය සහ යුරෝපීය රටවල් වෙත ප්‍රමුඛව මෙම නිෂ්පාදනය අපනයනය කරනු ලබයි. මීට අමතරව විදේශීය වෙලඳපලට වැඩි ඉල්ලුමක් ඇති මව් සතුන් තායිලන්තය, සිංගප්පූරුව, මැලේෂියාව යන රටවලින් ආනයනය කොට නිෂ්පාදන කාර්යය සඳහා කොන්ත්‍රාත් ක්‍රමවේදයට සංවිධානය වූ ගොවීන් වෙත ලබාදීම සිදු කරයි. දේශීය වෙළඳපලේ වැඩිම ඉල්ලුමක් ඇත්තේ ගෝල්ඩ් ෆිෂ් ප්‍රභේදයට වන අතර විදේශීය වෙළඳ පල සඳහා ගප්පි, ස්වඩ්ටේල්, ප්ලේටි, මොලී යන ප්‍රභේද සඳහා වැඩි ඉල්ලුමක් ඇත. 2019 වර්ෂය වන විට විසිතුරු මසුන් යුගල මිලියන 29 ක් දේශීය හා විදේශීය වෙළඳපොළවල් සඳහා සපයා ඇති අතර එහි වටිනාකම රු. මිලි. 725 කි.

- **විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ග**

1. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මඩ පොකුණු ඉදිකිරීම
2. මත්ස්‍ය විශේෂවල වර්ණ සංවර්ධනය හා ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා නිරෝධායන සහිත ටැංකි ස්ථාපනය කිරීම.
3. ගොවීන්ට ඇඟිල්ලන් සැපයීම සඳහා අභිජනන මධ්‍යස්ථාන නඩත්තු කිරීම.
4. තාක්ෂණික සහය සැපයීමෙන් ගොවි සමිති සවිබල ගැන්වීම.
5. කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය.
6. අලෙවිකරණ ජාලය දියුණු කිරීම සහ අපනයන වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම.



විසිතුරු මත්ස්‍ය වගාව සඳහා නිරෝධායන ටැංකි පිහිටුවීම



විසිතුරු මසුන් විකිණීම සඳහා වර්ග කිරීම

5. මහවැලි ගොවිපල සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි කළමණාකාරිත්වය යටතේ ගොවිපල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වන අතර වර්තමානයේදී ගොවිපල 13 ක් මහවැලි කලාප තුළ ව්‍යාප්තව පවති. මූලිකව කෘෂි භෝග නිෂ්පාදනය ඒකකයන් පැවතුනද අයහපත් හා අවිනිශ්චිත කාලගුණික තත්ත්ව යටතේ භෝග වගාව

මුහුණ පා ඇති අවධානමට විසඳුමක් ලෙස කෘෂි භෝගවලට අමතරව පශු සම්පත් හා සීවර නිෂ්පාදන කටයුතු ඇතුළත් වූ සමෝදානික ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

ගොවිපල සංවර්ධන කාර්යයයෙහි මූලික අරමුණ වන්නේ,

- ප්‍රදේශයේ ගොවීන් සඳහා කෘෂි සහ පශු සම්පත් පිළිබඳ තාක්ෂණික දැනුම ලබාදෙන පුහුණු සහ ආදර්ශන ඒකකයන් ලෙස ගොවිපල ක්‍රියාත්මක කිරීම.
- කෘෂි හා පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම සඳහා නොයෙකුත් පර්යේෂණ සිදු කිරීමේ ඒකකයන් වීම.
- ගව අභිජනන මධ්‍යස්ථානයක් ලෙස කලාපයට අවශ්‍ය උසස් ආරයෙන් උසස් කිරිගව පැටවුන් ලබාදීම, බිත්තර රක්කවන යන්ත්‍ර මඟින් ගොවීන් හට කුකුළු පැටවුන් ලබාදීම හා කිරි හා ඒ ආශ්‍රිත අතුරු නිෂ්පාදන සිදු කිරීම හා අලෙවිකරණ ඒකකයක් වීම.

මෙලෙස, මහවැලි ගොවිපල සංවර්ධන වැඩසටහන ඔස්සේ ප්‍රාදේශීය ගොවීන් හට පුළුල් සේවාවක් ලැබෙයි.



කිරි ගව සංවර්ධනය සඳහා පුහුණු වැඩ සටහන්



ගොවි පුහුණු වැඩ සටහන් පැවැත්වීම

3.3.2 මූල්‍ය ප්‍රගතිය 2019

ඒ අනුව, 2019 වර්ෂය සඳහා ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශයට අදාළ මූල්‍ය ප්‍රගතිය කලාප හා ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කළ ආකාරය පහත පරිදි වගුව ආකාරයෙන් දැක්වා ඇති.

අ.අ	කලාපය	2019 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන	2019 වර්ෂය සඳහා සංශෝධිත මුදල් වෙන් කිරීම	2019.12.25 වන දිනට වියදම් වූ මුළු මුදල	මූල්‍ය ප්‍රගතිය
1	බී කලාපය	6.25	5.53	5.42	98
2	සී කලාපය	4.15	4.45	4.23	95
3	ඩී කලාපය	3.5	3.3	3.2	96
4	ජී කලාපය	2.5	2	1.98	99
5	එච් කලාපය	5.25	5	4.68	94
6	හුරුළුවැව කලාපය	2.5	2.3	1.91	83
7	වලව කලාපය	5	4.3	4.3	100
8	මිණිපේ කලාපය	1.5	1	0.96	96
9	ප්‍රධාන කාර්යාලය	1.35	1.07	0.9	84
	උප එකතුව	**32**	**29**	**27.58**	**95**
		ව්‍යාපෘති සඳහා වෙන් කිරීම්			
1	එල් කලාපය	9.25	7.76	7.22	93
2	රිදීමාලියද්ද	4.48	2.82	2.83	100
3	රඹකැන්ඔය කලාපය	2.39	0.85	0.69	81
	මුළු එකතුව	**48.12**	**40.43**	**38.32**	**95**

3.3.3 භෞතික ප්‍රගතිය - 2019

ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍ර වල නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් කළ ව්‍යාප්ති වැඩ සටහනෙහි ආදර්ශ ඒකකයන් ලෙස කලාප මට්ටමින් සිදු කළ භෞතික ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සඳහන් සාරාංශ සටහන වගුවෙහි දක්වා ඇත.

අ.අ.	ක්‍රියාකාරකම	ඒකකය	ඉලක්කය	ප්‍රගතිය
01	ගවගාල් ඉදි කිරීම	සංඛ්‍යාව	78	76
02	ජංගම කිරි දොවන යන්ත්‍ර සැපයීම	සංඛ්‍යාව	19	19
03	කිරි එකතු කිරීමේ උපකරණ ලබා දීම	සංඛ්‍යාව	62	62
04	ජීව වායු නිෂ්පාදන ඒකක පිහිටුවීම	සංඛ්‍යාව	04	04
05	තෘණ වගා ඒකක පිහිටුවීම	ඒකක ගණන	19	18
06	තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර ලබා දීම	සංඛ්‍යාව	11	13
07	තණකොළ කපන යන්ත්‍ර ලබා දීම	සංඛ්‍යාව	10	20
08	සත්ත්ව සායන පැවැත්වීම	සංඛ්‍යාව	47	50
09	සතුන් රක්ෂණය කිරීමේ වැඩසටහන්	සංඛ්‍යාව	10	08
10	සයිලේජ් බැරල්/ හේ ගබඩා මධ්‍යස්ථාන	සංඛ්‍යාව	358	334
11	කුකුල් නිවාස සෑදීම	සංඛ්‍යාව	127	122
12	දිනක් වයසැති කුතුළු පැටවු සැපයීම	සංඛ්‍යාව	36,890	34,765
13	ජලාශ තුළ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම	සංඛ්‍යාව (මිලියන)	1.43	0.60
14	අලෙවිය සඳහා මසුන් එකතු කිරීමේ මධ්‍යස්ථාන	සංඛ්‍යාව	1	1
15	මත්ස්‍ය ඇසිත්තන් තැම්පත් කිරීම	සංඛ්‍යාව	3500	2900
16	මිරිදිය ඉස්සන් වගාව	සංඛ්‍යාව	600,000	600,000
17	උසස් ආරයේ කිරි ගවයින් ලබාදීම	සංඛ්‍යාව	21	22
18	කෘතිම සිංචණ වැඩසටහන්	සංඛ්‍යාව	216	274
19	ධීවර උපකරණ ලබාදීම(දැල්)	සංඛ්‍යාව	175	261
20	ගව අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම	සංඛ්‍යාව	1	1
21	කිරි සතිය වැඩසටහන් පැවැත්වීම	සංඛ්‍යාව	49	54
22	මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම	සංඛ්‍යාව	3	2
23	මඩ පොකුණු ඉදි කිරීම	සංඛ්‍යාව	19	19
24	නිරෝධායන ටැංකි ඉදි කිරීම	සංඛ්‍යාව	20	20
25	එළු නිවාස ඉදි කිරීම	සංඛ්‍යාව	11	20
26	එළු අභිජනන ගොවිපල පිහිටුවීම	සංඛ්‍යාව	3	2
27	නිලධාරී/ගොවි පුහුණු	සංඛ්‍යාව	164	196

3.4 ආයතන සංවර්ධන අංශය

3.4.1 ප්‍රජා සංවර්ධනය

මහවැලි කලාප තුළ මතින් තොර, හිංසනයෙන් තොර, අපචාරයන්ගෙන් තොර, සාරධර්ම සපිරි නිරෝගිමත් ගොවි ප්‍රජාවක් බිහිකිරීම සඳහා මගපෙන්වීම ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි මූලික අරමුණ වේ.

මේ යටතේ,

- මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් පුහුණු කිරීම හා පාසල් ළමුන් හා ප්‍රජාව දැනුවත් කිරීම
- ළමා අපචාර, කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අඩුවයස් විවාහ හා ගැබ්ගැනීම් වැලැක්වීම සඳහා දැනුවත් කිරීම
- බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම (විශේෂයෙන් සීඝ්‍ර ලෙස පැතිරීයන වකුගඩු රෝගයෙන් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත් කිරීම හා හදුනාගත් රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කිරීම)
- අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම (පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පොස. සාමාන්‍ය පෙළ විභාගය හා අ.පොස.උසස්පෙළ විභාගය සඳහා)
- මහවැලි පදනම ශිෂ්‍යත්ව ලබා දීම (දෙමාපියන් ඉතා දිළිඳු, ආබාධිත හෝ මියගිය, සාමාන්‍ය පෙළ සමත් දරුවන් සඳහා ලබා දේ) සිදු කෙරේ.

2019 වර්ෂයේ ප්‍රජා සංවර්ධනය වැඩසටහන් වලට අදාල ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව 596 කි. ඉන් වැඩසටහන් 672 ක ප්‍රගතිය ලබා ගෙන ඇති අතර මූල්‍යඉලක්කය රුපිල් මිලියන 31.28 ක් හා මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 30 කි.

කලාපය	පුහුණු කරන ලද ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් සංඛ්‍යාව	දැනුවත් කරන ලද පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව	දැනුවත් කරන ලද ග්‍රාමීය ප්‍රජාවන්ගේ සංඛ්‍යාව
බී කලාපය	23	1318	1360
සී කලාපය	45	1129	2937
ඊ කලාපය	42	885	300
එච් කලාපය	40	878	2356
එල් කලාපය	40	-	842
මැදිරිගිරිය කලාපය	-	75	1207
මොරගහකන්ද කලාපය	-	200	525
හුරුළුවැව කලාපය	42	1250	1200
රඹකැන්ඔය කලාපය	48	2100	188
වලව කලාපය	40	440	1253
එකතුව	**280**	**8275**	**12168**

සුජාත දරුවෝ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන - විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්හි පළවූ අවස්ථා කීපයක්



මහවැලි ජනපදවල දරුවන්ට
මත්ද්‍රව්‍ය පිළිබඳ සම්මන්ත්‍රණයක



තෙල්දෙණියේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක්

මැදමහනුවර - ඉන්දික බණ්ඩාර

මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වික්ටෝරියා කලාපයේ සුජාත දරුවෝ සංසදය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හා තෙල්දෙණිය පොලිසියේ අනුග්‍රහය ඇතිව මත්ද්‍රව්‍ය නිවාරණ සම්බන්ධයෙන් අත් පත්‍රිකා බෙදිදීමක් තෙල්දෙණිය නගරයේදී පැවැත්විණි.



සුජාත දරුවෝ ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් විසින් පෝස්ටර් මගින් හා වෙළඳසැල් වෙත ගොස් ප්‍රජාව දැනුවත් කිරීම

3.4.2 ජානපදික හැකියා හා වෘත්තීය පුහුණු

- මහවැලි ජානපදිකයින්ගේ ආර්ථික මට්ටම රුපියල් 30,000. 00 වඩා ඉහළ නැංවීම අරමුණු කරගනිමින් වෘත්තීය පුහුණු ලබා දීම හා ඒ ඔස්සේ ඔවුන් රැකියා/ගත කිරීම මූලික අපේක්ෂාව වේ.
- ගොවි සංවිධාන නිළධාරීන් සඳහා ගිණුම් පුහුණුව ලබාදීම හා පොල්ගොල්ල ජාතික අධ්‍යාපන සමූපකාර සංවර්ධන ආයතනය යටතේ මහවැලි කලාප වල උසස් පෙළ සමත් තරුණ තරුණියන්ට විගණනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ගොවි සංවිධාන විගණනය සඳහා බලය ලබා දීම හා කලාපයේ ගොවි සංවිධාන වාර්ෂිකව විගණනය කිරීම ඔවුන් විසින් සිදු කිරීම.

2019 වර්ෂය තුළ මේ යටතේ වැඩසටහන් 90ක් ඉලක්ක ගතව තිබූ අතර ඉන් වැඩසටහන් 76 ක ප්‍රගතියක් හා රුපියල් මිලියන 7.685 ක මූල්‍ය ඉලක්කයක් හා 7.685 ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්නා ලදී. තවද දිළිදුකම තුරන් කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ මාසික ආදායම රුපියල් 30,000.00 ට වැඩියෙන් උපයන පවුල් සංඛ්‍යාව 844 ක් ලෙස රැකියාගත කිරීම සිදුකරන ලදී.

අනු අංකය	කලාපය	රැකියාගත කරන ලද සංඛ්‍යාව
1	බී කලාපය	22
2	සී කලාපය	175
3	ඊ කලාපය	57
4	එච් කලාපය	88
5	එල් කලාපය	48
6	මැදිරිගිරිය කලාපය	132
7	මොරගහකන්ද කලාපය	30
8	හුරුළුවැව කලාපය	73
9	රඹකැන්ඔය කලාපය	53
10	වලව කලාපය	166
	එකතුව	**844**

3.4.3 කාන්තා සංවර්ධනය

- ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම හා ගෘහස්ථ මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා මගපෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ.
- මහවැලි කලාප තුළ සිටින කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මේ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි
- තම නිවසේ සිටම ආදායම් උත්පාදනය සඳහා ඇයට කටයුතු කළහැකි වන පරිදි ස්වයංරැකියා හා විවිධ වෘත්තීය පුහුණු ලබාදීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමද මේ යටතේ සිදුකරයි.

2019 වර්ෂයේ මෙහි වැඩසටහන් ඉලක්කය 149 ක් වන අතර ප්‍රගතිය වැඩසටහන් 118 කි. මූල්‍ය වියදම රුපියල් මිලියන 4.2 කි.

3.4.4 ගොවි සංවිධාන ප්‍රවර්ධනය

ගොවි සංවිධාන නිලවරණ පැවැත්වීම හා ගොවි සංවිධාන සඳහා අදාලවන අණපනත්, නීති රීති, ජලකළමනාකරණය ආදිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ගොවීන් ගේ ආකල්ප වර්ධනය හා ධාරිතා සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සිදුකරන අතර කළමනාකරණ කමිටු යටතේ ගොවි ගැටලු සඳහා විසඳුම් ලබාදීම සිදු කරයි.

2019 වර්ෂයේදී ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2018-2019 අන්තර් කලාප හොඳම ගොවි සංවිධානය තේරීමේ තරගය පවත්වනලද අතර එහිදී ගොවි සංවිධාන ඇගයීම සිදුකරනලදී.



අන්තර් කලාප හොඳම ගොවි සංවිධානය තේරීම -2018-2019 ත්‍යාග ප්‍රධානෝත්සවය - සී කලාපය

3.4.5 ප්‍රජා සහභාගිත්ව වාරිපද්ධති කළමනාකරණය

- ඇළ පද්ධතිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීම මගින් කෙත්ඇළ නවීකරණය කිරීමේ ප්‍රජා සහභාගිත්ව කළමනාකරණ වැඩසටහන.
- ප්‍රතිසංස්කරණය කළයුතු මට්ටමේ ඇති කෙත්ඇළ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හා ශ්‍රමදායකත්වයෙන් අමුද්‍රව්‍ය සඳහා වන පිරිවැය පමණක් දරා ප්‍රතිසංස්කරණය කිරීම.

(කාර්යක්ෂම ජල භාවිතයකට ගොවීන් හුරුකිරීම හා ජල කළමනාකරණය පිළිබඳ ආකල්පමය වෙනසක් ප්‍රායෝගිකවම මේ තුළින් ඇතිකරවනු ලබන අතර විශාල පිරිවැයක් දැරීමට සිදුවන කටවයුත්තක් ප්‍රජාවගේම ශ්‍රමයෙන් වඩා ඵලදායී ලෙස සිදු කරයි.)

2019 වර්ෂයේ දී මෙම වැඩසටහන මහවැලි බී, සී,එච්, මොරගහකන්ද, එල්, වලව හා හුරුළුවැව යන කලාපයන්හි ක්‍රියාත්මක කරන ලදී. උපරිමය රුපියල් ලක්ෂ පහකට (5) යටත්ව ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා මුදල් ලබාදෙන අතර එහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 15ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. ඒ අනුව මී.18922 ක දිගින් යුතු වාරි පද්ධති ප්‍රමාණයක් රුපියල් මිලියන 8.47 ක ඉතිරියකින් යුතුව නිමකර ඇත.

කලාපය	ප්‍රතිසංස්කරණය කරන ලද බෙදුම් ඇල ප්‍රමාණය	ප්‍රතිසංස්කරණය කරන ලද ඇලවල්හි දිග ප්‍රමාණය (මීටර්)	ඇස්තමේන්තු ගත මුදල (රුපියල් මිලියන)	ශ්‍රම වටිනාකම (රුපියල් මිලියන)	සම්පූර්ණ නිමවුම් වටිනාකම (රුපියල් මිලියන)
බී කලාපය	10	1118	4.865	0.73	5.6
සී කලාපය	23	8187	9.85	3.25	13.1
එච් කලාපය	9	820	4.97	1.37	6.34
එල් කලාපය	1	200	0.49	0.19	0.68
වලව කලාපය	19	2038	7.02	1.26	8.28
හුරුළුවැව කලාපය	1	5406	0.49	0.35	0.84
මොරගහකන්ද කලාපය	4	1153	1.99	1.32	3.31
එකතුව	**67**	**18,922**	**29.675**	**8.47**	**38.15**



පෙර තත්ත්වය



පසු තත්ත්වය



පෙර තත්ත්වය



ප්‍රති සංස්කරණයෙන් පසු බී කලාපය

3.5. ව්‍යාපාර සංවර්ධන අංශය

<u>පසුබිම -</u>

ව්‍යාපාර සංවර්ධන අංශය ,ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටුකරන අංශයක් වෙයි .මහවැලි කලාප තුළ එක් එක් කලාපයන්ට අනන්‍ය වූ සීමිත සම්පත් උපරිම ඵලදායී ලෙස උපයෝජනය කරමින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය හා ආර්ථික සංවර්ධනය සඳහා වගකීම් දරමින් කටයුතු කරයි.

ඒ අනුව මහවැලි කලාපවල කෘෂිකර්ම ,සත්ත්ව පාලන ,සංචාරක ආදී අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි කුඩා ,මධ්‍ය හා මහා පරිමාණයේ විවිධ වූ ව්‍යවසායකයන් බිහි කරලීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම , ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම හා ඇගයීම, පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධනයට යොමු කර ගැනීම ,අළෙවිකරණය සඳහා වෙළෙඳපොළ සම්බන්ධතා ඇති කිරීම , ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රම දියත් කර ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම ,ඔවුන්ට අවශ්‍ය මගපෙන්වීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ අරමුණු:-</u>

01. අධිකාරියේ වාර්ෂික ආදායම් තත්වය ඉහල නැංවීම.
02. මහවැලි බල ප්‍රදේශවල තරුණ තරුණියන්ට රුකියා අවස්ථා ජනනය කිරීම.
03. ආයෝජන තුලින් ප්‍රාදේශීය සංවර්ධනය.
04. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් බිහි කිරීම.
05. ස්වයං රැකියා පුහුණුව මඟින් කුඩා පරිමාණයේ නිෂ්පාදන ක්ෂේත්‍රයට දායකත්වය ලබාදීම.
06. ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මැදිහත්කරුවෙකු වීම.
07. වෙළඳපල සම්බන්ධීකරණය මඟින් මහවැලි බල ප්‍රදේශවල නිෂ්පාදනවලට ඉහල වටිනාකමක් ලබාදීම
08. ව්‍යවසායකත්ව හැකියා වර්ධනය හා තාක්ෂණ නිපුණතාවය ලබා දීම.
09. ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබාදීම හා අපනයන ප්‍රවර්ධනය.
10. ව්‍යාපාර උපදේශණය/ව්‍යාපාර සැලසුම් සකස්කිරීමට සහය ලබාදීම හා ඇඟයීම.
11. ජාතික විදුලි නිෂ්පාදනය සඳහා පුනර්ජනනීය විදුලි බල නිෂ්පාදන දායකත්වය ලබා දීම.

<u>ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය:-</u>

- සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය,පොල් වගාව,වෙනත් බෝග හා පලතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම.
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බෝට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම.
- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුලින් අදායම් උත්පාදනය.
- සුර්යබල ශක්ති, ජෛව ස්කන්ධ විදුලි බල ශක්ති, ජල විදුලි බලශක්ති ආදී විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම.
- ජලාශ මතු පිට පාවෙන සූර්ය බල ශක්ති විදුලි ව්‍යාපෘති සඳහා මහවැලි ජලාශ මතුපිට ආයෝජන අවස්ථා සලසාදීම.

- දේශීය සීනි අවශ්‍යතාවය මෙරට තුලදීම නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්ත ශාලා වැනි ව්‍යාපෘතිවල ඉඩම් සහ ප්‍රදේශයේ ගොවීන් අතර ඉඩම් බෙදා දීම මඟින් බදු අදායම මෙන්ම රාජ්‍යභාගය ලබා ගැනීම.
- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රාදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
- කෘෂිකාර්මික හා සත්ව පාලන ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම.
- ග්‍රාමීය වශයෙන් ව්‍යාපාර සංවර්ධන උපාය මාර්ග ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා උපකරණ සහ මෙවලම් ලබාදීම වෙනුවෙන් %50 ක මහවැලි මූල්‍ය දායකත්වයක් ලබාදීම
- පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා මහවැලි හෙල බොජුන් හල් ආරම්භ කිරීම.
- පිළිගත් වෘත්තීය පුහුණු සහතිකපත් ලාභීන් බවට මහවැලි කලාපීය දුවා දරුවන් පත්කර රැකියා ගත කිරීම.

<u>2019 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්</u>

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය.
- “මහවැලි හෙල බොජුන් හළ” ව්‍යාපෘතිය.
- පෞද්ගලික අංශය සඳහා මහවැලි කලාපවල ආයෝජන අවස්ථාවන් ලබාදීම.
- “මොරගහකන්ද අත්වැල” ණය වැඩ සටහන හා ‘‘මහවැලි සවිය’’ ණය යෝජනා ක්‍රමය
- මහවැලි ජලාශවල/වැව්වල පරිසර හිතකාමී බෝට්ටු මෙන්ම පාවෙන ගුවන් යානා සේවා ආරම්භ කිරීම.
- මහවැලි ව්‍යවසායකත්ව සම්මාන උළෙල
- මහවැලි කලාපවල රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහන.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් නහා සිටුවීම, දායකත්වය සැපයීම සහ ස්වයං රැකියා පුහුණුව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
- නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම සහ පුහුණුව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධාරිතා සංවර්ධන හා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අනු අංකය	කලාපය	සංචාරක බංලාවේ නම		සංචාරක බංගලා සංඛ්‍යාව	ආසන්න නගරය	කාමර ගණන
1	බී	රුහුණුකෙත		1	වැලිකන්ද	10
		පිඹුරත්තැව		2	අරලගංවිල	4
2	සී	දෙහිඅත්තකණ්ඩිය i		3	දෙහිඅත්තකණ්ඩිය	10
		දෙහිඅත්තකණ්ඩියii		4	දෙහිඅත්තකණ්ඩිය	5
		දෙහිඅත්තකණ්ඩිය iii		5	දෙහිඅත්තකණ්ඩිය	3
		ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය	VIP	6	ගිරාඳුරුකෝට්ටේ	1
			සාමාන්‍ය		ගිරාඳුරුකෝට්ටේ	3
			A ශ්‍රේණිය		ගිරාඳුරුකෝට්ටේ	20
			B ශ්‍රේණිය	7	ගිරාඳුරුකෝට්ටේ	8
		උල්හිටිය / රත්කිඳ	I		මැදගම	2
			II		මැදගම	3
3	ඩී	සූරියපුර		8	කන්තලේ	6
		බිසෝපුර(නව)		9	මැදිරිගිරිය	6
4	ජී	මොරගහකන්ද විශේෂ ව්‍යාපෘතිය		10	මොරගහකන්ද	4
		බකමූණ		11	බකමූණ	6
5	එච්	කලාවැව	VIP	12	කලාවැව	2
			සාමාන්‍ය		කලාවැව	3
		තඹුත්තේගම		13	තඹුත්තේගම	4
		නොච්චියාගම		14	ච්චියාගම	6
		නිරාවිය		15	තඹුත්තේගම	4
6	එල්	වැලිඔය		16	සම්පත් නුවර	4
7	වික්ටෝරියා	222 නේවාසික ව්‍යාපාර කාර්යාල සංචාරක බංගලාව		17	දිගන	4

		නුවර එළිය		18	නුවර එළිය	6
		කොත්මලේ119	2	19	කොත්මලේ	3
		බූවැලිකඩ		20	මහනුවර	3
8	වලව	උඩවලව		21	ඇඹිලිපිටිය	4
		ඇඹිලිපිටිය		22	ඇඹිලිපිටිය	8
		මයුරපුර		23	සූරිය වැව	5
9	රඹකැන්ඔය	මහඔය		24	මහඔය	4
		බදුල්ල		25	බදුල්ල	6
10	මු.වැ.පා.ක්‍රි.න	පොල්ගොල්ල		26	මහනුවර	4
		කොත්මලේ 119	1	27	කොත්මලේ	4
		රන්දෙණිගල	VIP 1	28	මහියංගනය	3
		බෝවතැන්න		29	නාවුල	3
		මාදුරු ඔය		30	අරලගංවිල	4
11	රත්මලාන	රත්මලාන		31	රත්මලාන	8

<u>මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සියලුම සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් බවට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) පත් කර ඇති අතර ව්‍යාපාර සංවර්ධන අංශයේ පිහිටුවා ඇති මෙහෙයුම් ඒකකය සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) යටතේ ක්‍රියාත්මක වේ.

<u>2019 නවීකරණය කරන ලද සංචාරක බංගලා</u>

උල්හිටිය රත්කිඳ සංචාරක බංගලාව, නොච්චියාගම, කොත්මලේ,කලාවැව, නුවරඑළිය, බකමූණ සහ නොච්චියාගම සංචාරක බංගලාවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදි.

2018 වර්ෂයේ සංචාරක බංගලා ආයතනය උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක 2018 වසරේ මෙරට සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් හා සංචාරක බංගලා ස්ථාන භාර ඉංජිනේරුවන්ගේ ප්‍රයෝජනය සඳහා පැවරීම හේතුවෙන් 2018 වසරට සාපේක්ෂව ආදායම් උත්පාදනය අඩු වී ඇත.





වර්ෂය	ආදායම (රු.)
2016	1,661,000.00
2017	5,260,450.00
2018	11,145,605.00
2019	6,027,172.92



<u>සංචාරක බංගලා වල වත්මන් තත්ත්වය</u>

මාර්ගගත වෙන් කිරීමේ පහසුකම් සහිත සංචාරක බංගලා ගණන - 13

මාර්ගගත වෙන් කිරීමේ පහසුකම් නොමැති සංචාරක බංගලා ගණන - 10

ඉදිවෙමින් පවතින සංචාරක බංගලා සංඛ්‍යාව - 03

2019 වර්ෂය සඳහා උපයා ඇති ආදායම රුපියල් මිලියන 6.6 කි.

<u>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ප්‍රවර්ධන කිරීම සඳහා ණය ලබා දීම</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා සමගාමීව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරයි.යාත්මක කරන ලදික් ක්‍රි2 මවසරේ ණය යෝජනා ක්‍ර 2019 මෙහිදී .

- මහවැලි සවිය" ණය යෝජනා ක්‍රමය (2019 දෙසැම්බර් දක්වා)

  2019 වර්ෂය තුළ මහවැලි අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව රු. මිලියන 14.6ක ණය මුදලක් ව්‍යවසායකයින් 78 දෙනෙකු සඳහා ලබා දී ඇත.

- "මොරගහකන්ද අත්වැල" ණය වැඩ සටහන

"මොරගහකන්ද අත්වෙල" ණය වැඩසටහන - 2019 වසරේ මොරගහකන්ද ප්‍රදේශයේ නැවත පදිංචි වූ ව්‍යවසායකයින් 11 දෙනෙකුට ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 5.9ක් ලබා දී ඇත.

මහවැලි ව්‍යවසායකත්වය ජනාධිපති සම්මාන උළෙල - 2019

ප්‍රථම වරට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ව්‍යාපාර සංවර්ධන අංශය විසින් කාණ්ඩ නවයක් යටතේ මහවැලි ව්‍යවසායකයින් 34 දෙනෙකු ඇගයීමට ලක් කරන ලදී.





මහවැලි හෙළ බොජුන්හළ ව්‍යාපෘතිය

පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය තුළින් කුටුම්භ වල ආර්ථිකය නඟා සිටුවීම ,දේශීය ආහාර අවම මිලක් යටතේ පාරිභෝගිකයන්ට ලබා දීමට හා කලාපීයව සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය යන මූලික අරමුණු පදනම් කරගනිමින් නව ව්‍යාපෘතියක් ලෙස මහවැලි හෙළ බොජුන්හල් මහවැලි කලාපවල ආරම්භ කර ඇත. වැලිකන්ද, දෙහිඅත්තකණ්ඩිය, මොරගහකන්ද සුපුරුදු පරිදි හෙළ බොජුන් ශාලා තුනක් ස්ථාපිත කරන ලදි. එමෙන්ම නව අලෙවිසැල් දෙකක් නිම කර ඇති අතර යෝජිත නව අලෙවිසැලක් ඉදිවෙමින් පවතී.

මෙම හෙළ බොජුන්හල් ස්ථාපිත වීම මඟින් වස විසෙන් තොර දේශීය ආහාර පොදු ජනයා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.මෙම හෙළ බොජුන් සැල් මඟින් මහවැලි කලාපවල සෘජු හා වක්‍ර රැකියා අවස්ථා රැසක්ද ජනිත වී ඇත.





පරිසර හිතකාමී සංචාරක බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම.

01. පරිසර හිතකාමී බෝට්ටු/ඔරු සේවාව

පරිසර හිතකාමී බෝට්ටු සේවා යනු ව්‍යාපාර සංවර්ධන අංශය විසින් සිදු කරන ආදායම් උත්පාදන ව්‍යාපෘතියකි. මෙහිදී වික්ටෝරියා, පොල්ගොල්ල, දඹුලුඔය හා ලොග්ගල් ඔය පාදක කරගෙන මෙම පරිසර හිතකාමී ව්‍යාපෘතිය සිදු කරයි. මෙමඟින් 2019 වර්ෂයේදී රුපියල් මිලියන 0.7ක පමණ ආදායමක් ලබා ඇත.




02. පාවෙන ගුවන් යානා සේවාව -

වික්ටෝරියා ජලාශය ආශ්‍රිතව පාවෙන ගුවන් යානා ගොඩබෑම මත නව ගිවිසුමකට යටත්ව ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන ලදි. මෙහිදී මිලියන 0.5ක ආදායමක් ලබා ඇති අතර එය වර්ෂයේදී තුන්වන කාර්තුවේ සිට හතරවන කාර්තුව දක්වා කාලයේදීය.

මහවැලි ප්‍රදේශවල පෞද්ගලික අංශය සඳහා ආයෝජන අවස්ථාවන්

සුදුසු ආයෝජන ව්‍යාපෘති 34ක් සඳහා පුද්ගලික අංශයට ආයෝජන අවස්ථා ලබා දී ඇත.

කෘෂිකර්ම ව්‍යාපෘති	40
පශු සම්පත් ව්‍යාපෘති	01
කෘෂිකර්ම හා පශු සම්පත් ව්‍යාපෘති	05
සංචාරක ව්‍යාපෘති	13
කාර්මික ව්‍යාපෘති	22

ව්‍යාවසායකයන් සඳහා පුහුණු වැඩසටහන්-

- කුසලතා සංවර්ධන සහ තාක්ෂණික සම්බන්ධ වැඩසටහන් 56ක් මහවැලි කලාපයක් තුළ 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.
- නව ව්‍යාවසායක් ඇති කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් 39 ක් මහවැලි කලාපයන් තුළ 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

වෙළඳපළ ප්‍රවර්ධන වැඩසටහන් 30ක් සහ ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන් 40ක් 2019 වර්ෂයේදී පැවැත් වූ අතර මෙමගින් රැකියා අවස්ථාවන් 500ක් උත්පාදනය කරන ලදි.




3.6 මානව සම්පත් සංවර්ධන අංශය

හැඳින්වීම:

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සිටින සියලුම නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම උදෙසා දැනුම, ආකල්ප හා නිපුණතාවයන් වැඩිදියුණු කිරීමේ අරමුණින් මානව සම්පත් සංවර්ධන අංශය පිහිටුවා ඇත. මෙම අංශය මෑත කාලයේදී පිහිටුවාගත් අංශයක් වුව ද මේ වන තෙක් ඉතා විශාල කාර්ය භාරයක් සිදු කළ අංශයක් වශයෙන් ද හඳුන්වා දිය හැකි ය.

කාර්යභාරයන් හා අරමුණු:

- දේශීය පුහුණු සහ උසස් අධ්‍යාපන පුහුණු අවස්ථා ලබා දීම තුළින් ආයතනයේ නිළධාරීන්ගේ පුද්ගල දැනුම, ආකල්ප, නිපුණතා වැඩිදියුණු කිරීම
- විදේශීය පුහුණු සහ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම තුළින් දැනුම, ආකල්ප, නිපුණතා සංවර්ධනය හා අත්දැකීම් හුවමාරු අවස්ථා සැලසීම.
- ඉංජිනේරු සේවා, භෞතික සැලසුම් සේවා, කෘෂිකාර්මික ඵලදායී සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබා දෙමින් තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීමට අදාළ පුහුණු පැවැත්වීම.
- නවීන තොරතුරු තාක්ෂණ වැඩ ලෝකයට ගැළපෙන පරිදි නිළධාරීන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම.

3.5.1 2019 වසරේ ප්‍රගති සමාලෝචනය

i. 2019 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලයේ සහ අනෙකුත් කලාප හා අංශ ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු පැවැත්වීම සහ බාහිර ආයතනයන්හි සංවිධානය කරනු ලබන වැඩමුළු සඳහා නිළධාරීන් සහභාගී කරවීම අප අංශය විසින් සිදු කරන ලදී.

මානව සම්පත් සංවර්ධන අංශය සිදු කළ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරය

(මාර්තු සිට දෙසැම්බර් දක්වා)

අ/අ	පුහුණු වැඩසටහන	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පුහුණු පැය	දින	ආයෝජනය (රු.)
01	විනිශ්චය පිළිබඳ සම්මන්ත්‍රණ අත්දැකීම් (නඩු අධ්‍යයනය)	01	07	08	2019/03/07	28,000.00
02	ප්‍රවාහන කළමණාකරණය	02	13	20	14/03/2019 සහ 15	91,000.00
03	MSO සාමාජිකයන් සඳහා පුහුණු වැඩමුළුව	02	50	20	14/03/2019 සහ 15	73,250.00
04	ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඇලුමිනියම් භාවිතය පිළිබඳ පුහුණුව	01	07	08	26/03/2019	28,000.00
05	මානව සම්පත් කලමණාකරුවෙකුගේ	01	01	08	26/03/2019	8,000.00

අ/අ	පුහුණු වැඩසටහන	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පුහුණු පැය	දින	ආයෝජනය (රු.)
	කාර්යභාරය පිළිබඳ පුහුණුව					
06	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ පුහුණුව	03	10	26	27/03/2019 සිට 29 දක්වා	80,000.00
07	රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පරිපාලන කුසලතා පිළිබඳ වැඩමුළුව	02	15	16	08/04/2019 සහ 09	187,500.00
08	කොටිඇාශ කළමණාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	03	47	26	25/04/2019 සිට 27 දක්වා	145,220.00
09	ව්‍යාපෘති යෝජනා සකස් කිරීම	02	11	16	06/05/2019 සහ 07	77,000.00
10	රාජ්‍ය සේවය සඳහා උපාය මාර්ග සකස් කිරීම	01	03	08	10/05/2019	-
11	HEC - RAS 2D භාවිතයෙන් හයිඩ්‍රොමිනම්ක් ආකෘති නිර්මාණය	01	02	08	31/05/2019	5,000.00
12	පුද්ගලික සහ සමාජ ආචාර විධි	01	60	08	31/05/2019	45,000.00
13	නේවාසික ව්‍යාපාර කළමණාකරුවන් හා කාර්යභාර ඉංජිනේරුවන් සඳහා ධාරිතා පුහුණු වැඩසටහන	02	22	20	07/06/2019 සහ 08	418,800.00
14	මාධ්‍ය වැඩමුළුව	1	60	08	18/06/2019	66.,900.00
15	බෝට්ටු ක්‍රියාකරුවන් සඳහා පුහුණු වැඩමුළුව	3	20	30	24/06/2019 සිට 26 දක්වා	51,013.00
16	21/05/2019දින නවක පත්වීම් ලැබූ නිළධාරීන් ආයතනගත කිරීමේ පුහුණු වැඩමුළුව	1	180	08	28/06/2019	167.,050.00
17	රාජ්‍ය ආයතන සඳහා ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩමුළුව	01	03	16	11/07/2019 සහ 12	21,000.00.
18	ඉංජිනේරුවන් පිළිබඳ තාක්ෂණික සැසිය	01	07	08	12/07/2019	10,000.00.
19	මහවැලි අධිකාරියේ රියදුරන් සඳහා පුහුණු වැඩමුළුව	02	50	30	18/07/2019 සහ 19	405,551.18
20	නවක කළමනාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය සංවර්ධන වැඩමුළුව	04	01	32	18/07/2019 සහ 25 ,19 සහ 26	10,000.00
21	පුරවැසි අවධානය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	01	02	08	22/07/2019	-
22	අමාත්‍යමණ්ඩල සන්දෙශගත කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	01	05	08	23/07/2019	19,500.00

අ/අ	පුහුණු වැඩසටහන	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පුහුණු පැය	දින	ආයෝජනය (රු.)
23	මහවැලි ආරක්ෂක බලකායේ ආරක්ෂක නිළධාරීන් සඳහා අවි පුහුණු හා සරඹ පුහුණු වැඩමුළුව	02	50	16	29/07/2019 සහ 30	89,050.00
24	මහවැලි ආරක්ෂක බලකායේ නිළධාරීන් සඳහා පුහුණු වැඩමුළුව	02	65	20	30/07/2019 සහ 31	254,200.00
25	මහවැලි අධිකාරියේ මුදල් අංශයේ සහ විගණන අංශයේ නිළධාරී මහතුන් සඳහා පුහුණු වැඩමුළුව	03	30	27	,05/08/2019 06සහ 07	212,502.00
26	පුස්තකාල සම්බන්ධ පුහුණු වැඩමුළුව	01	03	08	07/08/2019	24,000.00
27	ප්‍රගති පාලන නිලධාරීන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීමේ වැඩමුළුව	02	50	33	22/08/2019 සහ 23	329,593.60
28	සමාජ සංරක්ෂණ නීති පිළිබඳ පුහුණු වැඩමුළුව	01	03	08	27/08/2017	25,500.00
29	ශ්‍රම ඵලදායීතාවය වර්ධනය සඳහා කාර්යාල කළමනාකරණය	03	01	8	/09/2019 12,19සහ26	8,000.00
30	නවක පත්වීම් ලැබූ මහවැලි ආරක්ෂක බලකායේ නිළධාරීන්ගේ පුහුණු වැඩමුළුව	40	65	330	201/09/92 7 සිට 05/11/2019	3,323,985.00
31	ශබ්ද පරිපාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව	02	01	16	19/09/2019 සහ 20	12,000.00
32	තොරතුරු තාක්ෂණ සමුළුව	03	07	24	08/10/2019, 09සහ 10	185,000.00
33	විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව	01	03	16	2019/10/03 සහ 04	96,000.00
34	HEC භාවිතා කරමින් ජල ගතික ආකෘති නිර්මාණය	01	02	08	2019/10/26	5000.00
35	Event Management	02	04	16	09/10/2019 සහ 10	52,000.00
36	ගුරුළුවැව කලාපයේ කළමණාකරණ සහකාර මහතුන්ගේ පුහුණු වැඩමුළුව	02	35	18	17/10/2019 සහ 18	136,105.00
37	8 වැනි Ciob ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රණය - 2019	03	05	24	2019/11/08 සහ 09	75,000.00
38	ජල විගණනය සහ ජල පියසටහන් තක්සේරුව පිළිබඳ උපදේශක සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	03	01	08	2019/11/29, 30 සහ 31	24,500.00
39	වියදම් හා ගෙවීම් පටිපාටිය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන	01	05	08	10/12/2019	30,000.00

අ/අ	පුහුණු වැඩසටහන	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පුහුණු පැය	දින	ආයෝජනය (රු.)
	එකතුව	1009	890	928	-	6,821,121.78

ii. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධරයින් බොහෝ පිරිසක් සඳහා ඔවුන්ට අදාළ විශය ක්ෂේත්‍රය අනුව විදේශ ශිෂ්‍යත්ව ලබා දීම ද අප අංශය මගින් සිදු කළ තවත් කාර්යයකි.

විදේශ ශිෂ්‍යත්ව තොරතුරු-2019 වර්ෂය

අ.අ	දිනය	පුහුණු වැඩසටහන්	රට	පැවැත්වුනු කාලය	යොමු කළ නම MD&E අමාත්‍යාංශයට
1	2019.02.11	දකුණු ආසියාවේ බලශක්ති අංශයේ වෘත්තීය ජාලයේ කාන්තා ප්‍රථම කලාපීය සමුළුවට ශ්‍රී ලංකා විදුලිබල අංශයේ ආයතනවල සහභාගිත්වය	නේපාලය	පෙබරවාරි 20-21	සරෝජා උඩංගමුව මිය - ටී.ඊ
2	2019.2.21	කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ සාක්ෂි දැරීම	ඉරානය	මාර්තු 8-11	ඉංජිනේරු, ආර්.එම්.එස්.වත්සලා - යාන්ත්‍රික ඉංජිනේරු
3	2019.02.20	KOICA - පශ්චාත් උපාධි	කොරියාව	2019-2020	ඉංජිනේරු M.K.M. මල්ලවාරච්චි - සිවිල් ඉංජිනේරු
4	2019.04.02	මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය සඳහා වන විද්‍යාවේ ජාත්‍යන්තර සහයෝගීතාවයේ ධාරිතා ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	චීනය	2019 අප්‍රේල් 09 - 29	A.G.T.හේමන්ත ජයසිංහ මහතා (RPM - G)
5	2019.04.24	ප්‍රධාන ධාරාවේ දේශගුණික විපර්යාස අනුවර්තනය	කොරියාව	2019 ජුනි 13 සිට ජූලි 03 දක්වා	ජී.ඒ.කේ.වික්‍රමසිංහ මහතා - සිවිල් ඉංජිනේරු
6	2019.04.25	ඔරොත්තු දෙන කෘෂිකර්ම පැකේජය ගොඩනැගීම පිළිබඳ සාර්ක් කලාපීය පුහුණුව	නේපාල්-කත්මන්ඩු	2019 මැයි 27-30	ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන - ආර්පීඑම් (වික්ටෝරියා)
7	2019/05.13	කෘෂිකාර්මික අංශය හරහා ප්‍රධාන ප්‍රවාහයේ ප්‍රාදේශීය උපදේශන රැස්වීමට ආරාධනා	තායිලන්තය	17 - 19 ජූලි - 2019	ආර්.ඒ.ඩී.කේ.රාජපක්ෂ මහත්මිය - ක්‍රි.ව.(කෘෂි)
අ.අ	**දිනය**	**පුහුණු වැඩසටහන්**	**රට**	**පැවැත්වුනු කාලය**	**යොමු කළ නම MD&E අමාත්‍යාංශයට**
8	2019.06.06	GEO- ග්‍රාමීය සංවර්ධනයේ තොරතුරු යෙදුම	ඉන්දියාව	2019 ජූලි 09 සිට අගෝස්තු 05 දක්වා	එච්.කේ.යූ.හෙට්ටිආරච්චි මහතා - භෞතික සැලසුම්කරු
9	2019.06.06	GEO- ග්‍රාමීය සංවර්ධනයේ තොරතුරු යෙදුම	ඉන්දියාව	2019 ජූලි 09 සිට අගෝස්තු 05 දක්වා	ඉංජිනේරු එස් පී බී ඉලංගසිංහ - ඩී ඩී (ජල සම්පත්)
10		P.G.ඩිප්ලෝමා වාරි ජල කළමනාකරණය	ඉන්දියාව	2019 ජූලි 12 සිට 2020 ජූලි 11 දක්වා	R.A.R.L.රණසිංහ මහතා - කෘෂි විද්‍යාඥ
11	2019.05.07	ඩකා, බන්ග්ලාදේෂ් හි ගංගා ද්‍රෝණි ආකෘති නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන	බංග්ලාදේශය	2019 මැයි 20 - 26	ඉංජිනේරු එස්.එච්.ආර්.වසන්ත

12	2019.06.07	බංග්ලාදේශයේ ඩකා හි ගංගා ද්‍රෝණි ආකෘති නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන	බංග්ලාදේශය	2019 මැයි 20 - 26	ඉංජිනේරු එම්.ජී.එන්.ඩී.වීරසිංහ
13	2019.06.10	පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ පුහුණු වැඩසටහන	දකුණු අප්‍රිකාව	2019 ජූලි 1-6	I.G.මද්දුම බණ්ඩාර මහතා - DD(F&E)
14	2019.06.12	ජෛව විවිධත්වය පිළිබඳ 09 වන ට්‍රොන්ඩ්හයිම් සමුළුව	නෝර්වේ	2019 ජුනි 30 - ජූලි 07	A.M.K.B.අදිකාරි මහතා
15	2019.06.20	බලශක්ති සංවර්ධන සහ කර්මාන්ත ප්‍රතිපත්ති පිළිබඳ 2019 සම්මන්ත්‍රණය. - චීනය	චීනය	17 ජූලි - 06 අගෝස්තු 2019	ඉංජිනේරු S.P.H.සේමසිංහ - යාන්ත්‍රික ඉංජිනේරු
16	2019.07.11	"පෘථිවි නිරීක්ෂණ" පිළිබඳ සාර්ක් කලාපීය පුහුණුව	පකිස්තාන්	29 ජූලි - 01 අගෝස්තු - 2019	A.M.K.B.අත්නායක මහතා - D(F&E)
17	2019.08.08	2019 හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සහ බලශක්ති පරිවර්තන පුහුණු පාඨමාලාව	චීනය	2019 සැප්තැම්බර් 16-29	එම්.යූ.ආර්.රණතුංග මිය - කුට්ටි කළමනාකරු, හුරුළුවැව
18	2019.08.09	කෘෂිකාර්මික නියහ නිරීක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයන චාරිකාව	ඉන්දියාව	2019 අගෝස්තු 19-23	ඉංජිනේරු පී.ජී.ගුණපාල (DDG-TS)
19	2019.08.15	2019 දකුණු සහ අග්නිදිග ආසියාතික රටවල් සඳහා හරිත සංවර්ධනයේ චීනයේ භාවිතයන් පිළිබඳ සම්මන්ත්‍රණය	චීනය	සැප්තැම්බර් 5-25	M.C.L. අතුකෝරල මහතා - DRPM (සංවර්ධන) ජී කලාපය
20	2019.08.21	ශ්‍රී ලංකාව සඳහා Mgt නිදහස් වෙළඳ කලාපයේ ඉදිකිරීම් සහ කළමනාකරණය පිළිබඳ 2019 සම්මන්ත්‍රණය	චීනය	2019 ඔක්තෝබර් 8-28	විපුල අබේරත්න මහතා - සහකාර අධ්‍යක්ෂ (BD)
21	2019.11.15	සූර්ය බලශක්ති තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන	ඉන්දියාව	2019 නොවැම්බර් 24 - දෙසැම්බර් 14	ඉංජිනේරු බී.ජී.සී. මංගල, සිවිල් ඉංජිනේරු

iii. මීට අමතරව විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ආදී ආයතනවලින් අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාස 06ක පුහුණු කළ සීමාවක් සඳහා වැටුප් සහිතව මෙන් ම රහිතව ප්‍රධාන කාර්යාලයට හා කලාපවලට / අංශවලට යොමු කර ඔවුන්ට පුහුණු අවස්ථා සලසා දීම.

iv. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි අධිකාරියේ නිළධාරීන්ට දෙමළ භාෂා පාඨමාලාවන් පැවැත්වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

3.7 පර්යේෂණ, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

දැක්ම

නවීන තාක්ෂණය හා උපායමාර්ග ක්‍රමවේද තුළින් මහවැලි කලාපවල බහුආංශික සංවර්ධනය සාක්ෂාත් කරගැනීම

අරමුණ

මහවැලි ජානපදිකයින්ගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා මහවැලි මහ සැලැස්මට අනුකූලව දේශීය හා විදේශීය විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

<u>අංශයේ කාර්යභාරය</u>

මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා බහු ආංශික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති, ආයතනික ප්‍රතිපත්ති සහ මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි අධිකාරියේ අංශ සඳහා වන දේශීය හා විදේශීය මුල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතීන් සකස් කිරීම , බලාත්මක කිරීම සඳහා වන ක්‍රමෝපායන් සකස් කිරීම , අදාළ අංශ හරහා ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය මෙන්ම මහවැලි බල ප්‍රදේශ වල සංචාරක ව්‍යාපාර කටයුතු ප්‍රවලිත කිරීම හා ප්‍රවර්ධනයට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම මගින් සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම.

මහවැලි ජනපදිකයින්ගේ වෙළඳ පොළ ඉලක්ක කර ගත් කෘෂි හා වෙනත් නිෂ්පාදන සඳහා නවින තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම මගින් නිෂ්පාදන ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම හා දේශීය / විදේශීය පර්යේෂණ ආයතන/ විශ්ව විද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන ආදිය සමග සම්පත් වල ස්වභාවය , ආර්ථික විවල්‍යත්වනයන් හා පවතින විභවතාවයන් ආදිය පිළිබඳව පර්යේෂණ කටයුතු සම්බන්ධීකරය , ක්ෂේත්‍රයේ ආදර්ශ පර්යේෂණ කටයුතු සිදුකිරීම හා පර්යේෂණ ප්‍රතිඵල මහවැලි කලාප වලට අනුගත කිරීම තුලින් ජනපදිකයන්ගේ ආදායම් උත්පාදනය වැඩි කිරීම

අංශය මගින් සිදුකරනු ලබන ව්‍යෘපෘතින්.

1. දේශගුණික අවබලපෑම් අවම කිරීම සඳහා හා යහ කෘෂි පිලිවෙත් අනුගමනය කරමින් ඉහළ ප්‍රමිතියෙන් හා වටිනාකමින් යුත් භෝග වගාව ප්‍රවර්ධනය සඳහා වන නියමු අධිතාක්ෂණික හරිතාගාර ව්‍යාපෘතිය (SMART GREEN HOUSE PROJECT)

2. මහවැලි දෙවන හා තුන්වන පරම්පරාවල තරුණ තරුණියන් හා ගොවීන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ භාවිතය මගින් කෘෂිකර්මාන්තය, රැකියා උත්පාදනය සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ)KOICA) ආධාර මත මහවැලි සී

කලාපයේ ගිරාඳුරුකෝට්ටේ සංවර්ධන මධ්‍යස්ථානයේ ස්ථාපිත තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය)INFORMATION VILLAGE CENTER)

3. කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ)KOICA) ආධාර මත මහවැලි සී කලාපයේ නව මැදගම ගොවිපළ දේශගුණික විපර්යාසයන්ට ප්‍රතිචාර වශයෙන් නවීන කෘෂි තාක්ෂණික උද්‍යානයක්)SMART AGRO-TECHNOLOGICAL PARK) ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
4. මොරගහකන්ද නව සංවර්ධන කලාපයේ පාරිසරික සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘතිය
5. විදේශීය තාක්ෂණික හුවමාරුව මගින් කොත්මලේ ස්ථාපිත පටක රෝපණ විද්‍යාගාරය සංවර්ධන ව්‍යාපෘතිය මගින් ඉහළ ආදායමක් ලබාගත හැකි අපනයනය ඉලක්ක කරගත් භෝග හා ශ්‍රී ලංකාවටම ආවේණික ඌණ භාවිත පළතුරු ගොවි ජනතාව අතර ප්‍රවර්ධනය කිරීම
6. මහවැලි කලාපවල අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා වන විශේෂ නියමු ව්‍යාපෘතිය

7. මහවැලි L කලාපයේ බිනරතැන්න සහ හැලඹ වැව ගම්මාන සඳහා විශේෂ සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම හා විදුලි වැට නවීකරණය
8. මොරගහකන්ද කලාපය තුල කාබනික පොහොර නිෂ්පාදනය සම්බන්ධ සම්බන්ධීකරන කටයුතු
9. අලි වැට ව්‍යාපෘතියට සමගාමීව B හා L කලාප තුල හණ වගා කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ශිල්ප සභාව සමග ගිවිසුම් ගතව කටයුතු කිරීම
10. මාදුරුඔය දකුණ ඉවුර ඒකාබද්ධ අධි තාක්ෂණික කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය
11. මහවැලි වෙළඳ මධ්‍යස්ථානය)Cool Fresh Outlet) නවීකරණය කිරීම
12. සුහුරු ගම්මාන ව්‍යාපෘතිය (Smart Villages)

සිව්වන පරිච්ඡේදය

4.1 මානව සම්පත් හා මුල්‍ය කළමනාකරණ අංශය

4.1.1 පිරිස් හා පාලන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සියලුම කටයුතු සිදුකරනු ලබනුයේ පිරිස් හා පාලන අංශය මගිනි. එය මෙම අංශයේ ප්‍රධානතම කාර්යය භාරයද වේ.

පිරිස් හා පාලන අංශය වෙත පැවරී ඇති කාර්යභාරයන්

පිරිස් හා පාලන අංශය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන අංශ අතරට ඇතුලත් වන අතර එම අංශය වෙත පැවරී ඇති කාර්යභාරය අතිවිශාලය.

කාර්යභාරයන් -

- සේවක අවශ්‍යතා හඳුනා ගැනීම
- සේවක සංඛ්‍යාව සැලසුම් කිරීම
- සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම හා සේවකයින් ස්ථානගත කිරීම
- මානව සම්පත් ආකර්ෂණය කර ගැනීම
    - පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම
    - විභාග/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
    - සුදුස්සන් තෝරා පත් කර ගැනීම
- මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය
- අතහුරුකිරීමේ වැඩසටහන්
- පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- දේශීය විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම
- උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම
- සේවය ස්ථීර කිරීම
- දේශීය විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම
- මානව සම්පත් අභිප්‍රේරණය හා ආකල්ප වර්ධනය
- ස්ථානමාරු
- විශ්‍රාම ගැන්වීම්
- සේවය අවසන් කිරීම්
- පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ නිදහස් කිරීම
- සේ.අ.අ./සේවා නියුක්ත භාර අරමුදල් සම්බන්ද කටයුතු
- විනය කටයුතු
- දිරිගැන්වීම
- කාර්ය සාධනය ඇගයීම
- කාර්ය මණ්ඩලය අධීක්ෂණය හා සුපරීක්ෂණය
- මෙහෙයවීම හා සංවිධානය
- පාලන
- ප්‍රවාහන
- සැලසුම් හා මෙහෙයුම්
- ආරක්ෂක
- ඉඩම් අංශය
- නීති අංශය
- කලාප කාර්යාල
- මහජන සම්බන්ධතාවය
- නිල උත්සව සම්බන්ධ කටයුතු
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
- මහජන පෙත්සම් කාරක සභා
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සහභාගී වීම හා අනෙකුත් අංශ සම්බන්ධීකරණය
- පාලන අංශයට අදාල වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම
- කාර්යාල ක්‍රම ක්‍රියාත්මක කිරීම
- ඇගයීම හා නව ක්‍රමවේද හඳුන්වා දීම
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

4.1.2 ඉලක්ක හා ප්‍රගතිය - 2019 වර්ෂය

ඉලක්කය

පිරිස් හා පාලන අංශයේ 2019 වර්ෂයේ ප්‍රධානම ඉලක්කය වනුයේ සේවක පුරප්පාඩු හඳුනාගැනීම හා පුරප්පාඩු කඩිනමින් පිරවීමයි.

2019 වර්ෂයේ තැබූ ඉලක්ක

- සියළු අංශවල සේවක පුරප්පාඩු හඳුනාගැනීම හා පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම
- වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම
- උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම
- මානව හිමිකම් කොමිසම් සභාව, කම්කරු බේරුම්කරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, කම්කරු විනිශ්චය කාරක සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම සහ දෛනික ක්‍රියාකාරකම්.

ප්‍රගතිය

පිරිස් හා පාලන අංශය නව බඳවා ගැනීම් සිදුකරමින් 2019 වර්ෂයේදී සුවිශේෂී ප්‍රගතියක් ලබාගෙන ඇත.

2019 වර්ෂයේ ලබා දුන් පත්වීම් පිළිබඳ විස්තර

අනු අංකය	තනතුර නාමය	පත්වීම් සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන)	1
2	නේවාසික ව්‍යාපාර කළමනාකාර	1
3	ජල විද්‍යාඥ	1
4	සහකාර අධ්‍යක්ෂ (පාලන)	1
5	සහකාර අධ්‍යක්ෂ (නීති)	2
6	සහකාර අධ්‍යක්ෂ (මුදල්)	2
7	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන)	1
8	සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)	1
9	සහකාර අධ්‍යක්ෂ (පරිසර)	1
10	නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (සංවර්ධන)	2
11	නියෝජ්‍ය ව්‍යාපාර කළමනාකාර	1
12	ඉංජිනේරු (සිවිල්)	50
13	ඉංජිනේරු (විදුලි)	7
14	අභ්‍යන්තර විගණක	1
15	ගණකාධිකාරි	3
16	මිනින්දෝරු	3
17	සංඛ්‍යාලේඛනඥ	1
18	භූ විද්‍යාඥ	1
19	තාක්ෂණ ඉංජිනේරු (සිවිල්)	8

20	තාක්ෂණ ඉංජිනේරු (යාන්ත්‍රික)	1
21	ගොවිපල කළමණාකාර	5
22	භෞතික සැලසුම් ශිල්පී	3
23	ගිණුම් නිලධාරී	5
24	ඉඩම් නිලධාරී	5
25	ප්‍රගති පාලන නිලධාරී	1
26	භාෂා පරිවර්තක	2
27	ඒකක කළමනාකාර	40
28	සහකාර ගොවිපළ කළමනාකාර	2
29	සංවර්ධන සහකාර	11
30	ඉංජිනේරු සහකාර (සිවිල්)	3
31	ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික)	6
32	ඉංජිනේරු සහකාර (විදුලි)	3
33	ජල විද්‍යා සහකාර	2
34	පටක රෝපණ තාක්ෂණ ශිල්පී	13
35	පශු සම්පත් සංවර්ධන සහකාර	17
36	ක්‍රීඩා සහකාර	3
37	පොත් තබන්නා	10
38	කාර්මික සහකාර	110
39	සැලසුම් ශිල්පී	21
40	පරිසර සංවර්ධන සහකාර	2
41	කළමනාකරණ සහකාර	58
42	ක්ෂේත්‍ර සහකාර	44
43	රියදුරු	21
44	බර යන්ත්‍ර ක්‍රියාකරු	2
45	ට්‍රැක්ටර් ක්‍රියාකරු	2
46	කාර්යාල කාර්ය සහායක	58
47	වාරිමාර්ග සේවක	57
48	කාර්මික අත්උදව්කරු	15
49	රිය සහායක	7
50	ආරක්ෂක නියාමක	48
51	සත්ව පාලක සේවක	1
52	සේවාකරු	2

සේවක සංඛ්‍යා තොරතුරු 2019.12.31 වන දිනට

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින ස්ථීර සේවක සංඛ්‍යාව	ද්විතීක/ කොන්ත්‍රාත්/ තුපුහුණු	මුළු සේවක සංඛ්‍යාව
ජේෂ්ඨ මට්ටි (HM 2-3, HM 1-3, HM 1-1)	34	18	4	22
මධ්‍යම මට්ටම (MM 1-1)	441	365	5	370
තෘතීයික මට්ටම (JM 1-1)	367	305	0	305
ද්විතියික මට්ටම (MA 3, MA 2-2, MA 1-2)	1873	1692	0	1692
ප්‍රාථමික මට්ටම (PL 3, PL 2, PL 1)	2144	2154	0	2154
එකතුව	4859	4534	9	4543

4.2 නීති අංශය

හැඳින්වීම:

1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනත හා ඊට අනුශාංගික පනත් 23 ට අදාළ නීතිමය කටයුතු සැළසුම් කිරීම, විවිධ ආයතන හා පුද්ගලයන් අතර සිදුවන නෛතික ගිවිසුම් සැකසුම් හා ක්‍රියාවට නැංවීම, සේවා හා සේවක ගැටළු සම්බන්ධයෙන් යොමුවුණු පැමිණිලි සම්බන්ධව පාර්ලිමේන්තු උපදේශන කාරක සභාව, පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්, බේරුම්කරණය, කම්කරු විනිශ්චය සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව වැනි නෛතික ආයතන සමග සම්බන්ධීකරණය මෙම අංශය පැවරී ඇති රාජකාරී අතර ප්‍රධාන තැනක් ගනී.

4.2.1 නීති අංශය විසින් මෙහෙයවනු ලබන නඩු

01. ශ්‍රේෂ්ඨාධිකරණය
02. අභියාචනාධිකරණය
03. සිවිල් අභියාචනාධිකරණය
04. මහාධිකරණය
05. දිසා අධිකරණය
06. මහේස්ත්‍රාත් අධිකරණය
07. කාර්මික අධිකරණය
08. කම්කරු විනිශ්චය සභාව

4.2.2 2018 වර්ෂයේ නීති උපදෙස් ලබා දෙන විෂය ක්ෂේත්‍ර

01. සේවක ගැටළු
02. වාහන අනතුරු
03. ගිවිසුම් සම්බන්ධ
04. ජලාශවල මීටර් 100 රක්ෂිත සම්බන්ධ කටයුතු කළ යුතු ආකාරය
05. අධිකාරියට අයවිය යුතු මුදල් අයකිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම
06. කුඩා පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අදාල උපදෙස් ලබාදීම
07. ලංකා මහවැලි අධිකාරියට අයත් සමාගම් සම්බන්ධ කටයුතු කිරීම හා උපදෙස් ලබාදීම

4.2.3 හිඟ බදු අයකර ගැනීමට අදාලව ගෙන ඇති පියවර

01. නඩු පැවරීම
02. දැන්වීම් යැවීම
03. එන්තරවාසි යැවීම
04. රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ අස්කිරීමේ නිවේදන යැවීම

4.3 මුදල් අංශය

ආයතනයේ ආයතනික සැලසුම‘ හා වාර්ෂික සැලසුම‘ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජාතික අයවැය ලේඛනය යටතේ මහවැලි අධිකාරිය සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය යෝජනා සැකසීම, මාසිකව අවශ්‍ය මුදල් පිළිබඳව පූරෝකථනය කිරීම හා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීම, දේශිය හා විදේශීය ව්‍යාපෘති වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම, සේවක වැටුප් හා අනෙකුත් ගෙවීම්, භෞතික සම්පත් කළමණාකරනය , විගණන විමසුම් සහ රාජ්ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ (COPE) විමසුම් අනුව තොරතුරු සැපයීම මෙම අංශය වෙත පැවරෙන මූලික කාර්යභාරයන් වේ.

1.3.1 මූල්‍ය වෙන්කිරීම් හා වියදම් පිළිබඳ විස්තර

	ප්‍රාග්ධන මූලය	ප්‍රතිපාදන (රු.'000)	වියදම් (රු .'000)
පුනරාවර්තන වියදම්		2,100,000	2,100,000
ප්‍රාග්ධන වියදම්		949,999	949,999
මහවැලි ව්‍යාපෘති			
මහවැලි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 'බී'	දේශීය	120,000	120,000
මාදුරු ඔය දකුණු ඉවුර	දේශීය	40,000	40,000
රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	53,000	53,000
රඹකැන්ඔය ව්‍යාපෘතිය	දේශීය	71,000	71,000
වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය	දේශීය	179,000	179,000
ප්‍රදාන හා මධ්‍යම වාරි පද්ධති පුනුරුත්ථාපන ව්‍යාපෘතිය	දේශීය	73,500	73,500
මහවැලි ගැටඹේ ව්‍යාපෘතිය	දේශීය	-	-
කිවුල් ඔය ව්‍යාපෘතිය	දේශීය	-	-
කෘෂි හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය	159,500	159,500
එකතුව		1,645,999	1,645,999

1.3.1 දේපළ, පිරියත හා උපකරණ

						රු '000
විස්තරය	01.01.2019 දිනට පිරිවැය	මිල දී ගැනීම්	විකිණීම්, බැහැර කිරීම්, මාරුකිරීම්	31.12.2019 දිනට පිරිවැය	ක්ෂය වීම	ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු 31.12.2019
ඉඩම්	296,000	-	-	296.000	-	296,000
ගොඩනැගිලි හා කාර්යාල	2,094,617	124,157	11,410	2,207,363	555,316	1,652,047
ගොඩනැගිලි - වෙනත්	2,814,845	133,363	53,773	2,894,434	1,524,710	1,369,725
වාහන	1,155,774	1,005,090	992,152	1,168,712	331,325	837,387
කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	135,779	28,956	5,531	159,204	74,133	85,072
විදුලි ජනක යන්ත්‍ර	24,452	10,341	1,650	33,143	14,543	18,600
යන්ත්‍ර හා උපකරණ - වැඩපොළ සේවා	43,343	2,426	21,743	24,026	11,562	12,464
යන්ත්‍ර හා උපකරණ - ඉදිකිරීම්	387,273	183,784	81,052	490,005	252,818	237,187
යන්ත්‍ර හා උපකරණ -පොදු	112,477	68,618	5,235	175,861	58,481	117,380
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	242,753	74,447	20,025	297,174	32,792	264,383
පරිගණක හා උපාංග	182,472	34,995	11,495	205,972	128,855	77,117
පොත් හා අත්පොත්	3,996	1,205	-	5,201	94	5,107
සමස්ත	**7,493,780**	**1,667,382**	**1,204,066**	**7,957,097**	**2,984,628**	**4,972,468**

4.4 මහවැලි ආරක්ෂක බලකාය

හැදින්වීම :

මහවැලි ආරක්ෂක බලකාය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම් , අවශේෂිත ගොඩනැගිලි සංකිර්ණ සහ දේපල ආරක්ෂා කිරීම ප්‍රධාන කොටගෙන ද මහවැලි නිළධාරින් හා කාර්ය මණ්ඩලය /ජනපදිකයින් ආරක්ෂා කිරීම වස් ද 1985 වර්ෂයේ මැද භාගයේ දී පිහිටුවන ලදී.

මෙම අවධියේ දී මහවැලි ආර්ථික ඒජන්සිය හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ ආරක්ෂක කටයුතු එම ආයතන මඟින්ම ආරක්ෂක නිළධාරින් සුළු පිරිසකින් ඉටු කර ගත් අතර, එම සංඛ්‍යාව ප්‍රමාණයෙන් ඉතා සුළු පිරිසක් වුහ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක කටයුතු විමධ්‍යගත කිරීමේ පරමාර්ථයෙන් හා විධිමත්ව පාලන හා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා මහවැලි අධිකාරියේ උපදෙස් පරිදි මහවැලි ආර්ථික ඒජන්සියේ හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ සේවය කල ආරක්ෂක නිලයන් 1989 වර්ෂයේ දී මහවැලි ආරක්ෂක බලකාය වෙත අන්තර්ග්‍රහණය කරන ලදී.

ප්‍රධාන අරමුණු:

- මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම් හා අවශේෂිත ගොඩනැගිලි පද්ධති ආරක්ෂා කිරීම.
- මහවැලි අධිකාරියට අයත් කාර්යාල සංකිර්ණ හා බඩුබාහිරාදිය , උපකරණ ආරක්ෂා කිරීම.
- මහවැලි අධිකාරියට අයත් කාර්ය මණ්ඩල හා ජනපදිකයින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

4.4.1 අනෙකුත් රාජකාරීන් හා කාර්යභාරය:

1. ගරු මහවැලි සංවර්ධන අමාත්‍යතුමා හා මහවැලි සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා ඇතුළු මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ,ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රභූ සම්මාන සහ ප්‍රභූ ආරක්ෂක රාජකාරීන් මහවැලි ක්‍රීඩා සහ අනෙකුත් විශේෂ උත්සව සඳහා අවශ්‍ය සම්මාන සහ ආරක්ෂක රාජකාරීන් ඉටු කිරීම.
2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් දේපල ආරක්ෂාව සම්බන්ධයෙන් යුද හමුදාව හා පොලිසිය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.
3. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු මුදල් හා වටිනා දේපල ප්‍රවාහනයේ දී ආරක්ෂාව සැපයීම.
4. මහවැලි ආරක්ෂක බලකායට හා අනෙකුත් ආයතන වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.
5. මහවැලි අධිකාරියේ අනෙකුත් ආයතන වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.
6. මහවැලි ආයතනයන් හි ප්‍රධාන නිළධාරින්ට සහ ව්‍යාපෘතිභාර නිළධාරින්ට ඔවුන් සේවය කරන ආයතන වල මුරකරුවන්ගේ රාජකාරීන් අධික්ෂණය කිරීමෙන් සහය වීම.
7. මහවැලි අධිකාරියේ සහ ඊට අයත් ආයතන වල සොරකම් අයතා පාවිච්චිය සහ වංචා නැවැත්වීමට කටයුතු කිරීම හා එසේ කරන පුද්ගලයින්ට විරුද්ධව කටයුතු කිරීම.
8. මහවැලි අධිකාරි පනත යටතේ මහවැලි ප්‍රදේශවල අනවසර පදිංචි වීම්,අනවසර ඉදි කිරීම්

හා අනවසර කටයුතු වැලැක්වීම.

9. මහවැලි අධිකාරියට අයත් පුපුරන ද්‍රව්‍ය,අවි ආයුධ,පතරොම් යන ද්‍රව්‍ය තබාගැනීම,ආරක්ෂා කිරීම,බෙදා හැරීම හා ගිණුම් කිරීම.
10. මහවැලි අධිකාරියට හා ඊට අයත් ආයතන වලට ආරක්ෂක උපදේශන සේවා සැපයීම.
11. මහවැලි අධිකාරිය,කාර්ය මණ්ඩවලට හා ජනපදිකයින්ට අවශ්‍ය පරිදි ආරක්ෂක පුහුණුවීම් පැවැත් වීම.

මහවැලි ආරක්ෂක බලකායේ ප්‍රධාන කාර්යභාරය ඉහත පරිදි වන අතර , එය රජයේ මහවැලි කෘෂි කර්ම , ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී සහ එයට අනුකූල වන දේපල හා පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා සැකසුවකි. මෙහි කාර්යභාරය ක්‍රියාවට නැංවීමේ දී මහවැලි ආරක්ෂක බලකායට අණ සහ උපදෙස් දීම සඳහා අධ්‍යක්ෂ කාර්යාංශයක් ද, මෙහෙයුම් අංශයක් ද, ක්ෂේත්‍රයේදී එම අණ සහ උපදෙස් ක්‍රියාවට නැංවීමට බල ප්‍රදේශ කාර්යාල ද ,අවශ්‍ය පරිදි ආරක්ෂක නිළධාරීන් සහ ආරක්ෂක නියාමකයින්ගෙන් සමන්විත විශාල, මධ්‍යම හා කුඩා වශයෙන් අනුබණ්ඩයන් ද ස්ථාපිත කර ඇත.එසේම සියළුම නිළයන්ගේ පාලන හා වැටුප් ගෙවීම් ආදි ගිණුම් කටයුතු ඉටු කර ලීම සඳහා සිවිල් කාර්යමණ්ඩලයක් ද ස්ථාපිත අතර දිගන මෙම බලකා මුලස්ථානය මඟින් එකි කටයුතු ඉටු කරනු ලැබේ. ඒ අනුව 2020 මාර්තු මාසය වන විට අප බලකායේ සම්පූර්ණ ආරක්ෂක කාර්ය මණ්ඩලය 676 කි. සිවිල් කාර්ය මණ්ඩල ප්‍රමාණය 49 කි.

එම ආරක්ෂක රාජකාරීන් ඉටු කරන ආරක්ෂක නිළධාරීන් සහ ආරක්ෂක නියාමක/ නියාමකයින් මනා සංයමයකින් යුතුව රාජකාරි කටයුතු වල නියැලීම පිණිස අවශ්‍ය ස්ථාවර නියෝග හා උපදෙස් නිකුත් කර ඇත.

මහවැලි ආරක්ෂක බලකාය රජයේ වෙනත් සිවිල් ආරක්ෂක ආයතන වලට වඩා මනා නිපුණත්වයකින් ද, අවි ආයුධ සන්නද්ධව සැකසුන ආයතනයකි. මහවැලි අධිකාරියට අයත් රජයේ දේපල ආරක්ෂා කිරීම සඳහා මෙම ආයතනය ඇප කැප වන අතර ,ඊට අමතරව අනෙකුත් අවශේෂ රාජකාරීන් සඳහා ද යොදවා ඇත.

4.4.2 2019 වර්ෂයේ සිදු කළ විශේෂ කාර්යයන්:

01. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019-01-08 දින මොරගහකන්ද ව්‍යාපෘතියේ පැවති උත්සවයේ සහ පොල්ගොල්ල වේල්ලේ දී පැවැත් වූ පරිත්‍රාන ධර්ම දේශණයේ විශේෂ රාජකාරි සහ මෙම බලකාය වෙත පවරන ලද සෙසු රාජකාරීන් සාර්ථකව ඉටු කිරීම.

02. 2019-03-15 දින හුරුළුවැව කලාපයේ සියළු ආරක්ෂක නිළයන් උදෙසා එක් දින පුහුණු වැඩමුළුවක් ඇළගමුව පුහුණු මධ්‍යස්ථානයේ දී සාර්ථකව පවත්වන ලදි.

03. 2019-04-07 දින රුවන්වැලි මහා සෑය අභියස දී පැවැත් වූ අළුත් සහල් මංගල්‍යය උත්සවයේ මෙම බලකාය වෙත පවරන ලද විශේෂ රාජකාරින් සාර්ථකව ඉටු කරන ලදි.

04. 2019-04-21 දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළු ජලාශයන් හි ආරක්ෂාව සඳහා විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කරමින් එකි ජලාශ වල ආරක්ෂාව තර කරන ලදි.

05. 2019-05-25,26 දෙදින දෙහිඅත්තකණ්ඩයේ දී පැවැත් වූ මහවැලි නිළධාරී සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ශූරතාවය මහවැලි ආරක්ෂක බලකාය විසින් දිනා ගන්නා ලදි.

06. මහවැලි ආරක්ෂක බලකාය ස්ථාපනය කර වර්ෂ 34ක් සැපිරිම නිමිත්තෙන් දිගන මෙම බලකා මුලස්ථානයේ දී අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියගේ ප්‍රධානත්වයෙන් 2019-06-15,16 දෙදින පරිත්‍රාන ධර්ම දේශණයක් සහ සංඝගත දක්ෂිණාවක් මෙම බලකායේ සහ සෙසු අංශයන් හි සේවක මහත්ම මහත්මින්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.

07. 2019-08-10 දින මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ රන්දොළි පෙරහැර ආරම්භක දිනයේ දී මෙම බලකායේ නිළයන් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය සම්පූර්ණයෙන් පිරිසිදු කිරීමට ශ්‍රම දායකත්වය ලබා දෙන ලදි.

08. 2019-07-29,30 දෙදින මහවැලි විශේෂ මාධ්‍ය ඒකකයේ ආවරණය සහිතව විශේෂ පුහුණු වැඩමුළුවක් මොරගහකන්ද ව්‍යාපෘතියේ දී මෙම බලකායේ ආරක්ෂක නිළයන් 50 දෙනෙකු උදෙසා සාර්ථකව සිදු කරන ලදි.

09. 2019 මහවැලි ක්‍රීඩා උත්සවයේ ඔලිම්පික් ගිනි සිළුව සමස්ථ කලාප ඔස්සේ මැදිරිගිරිය ක්‍රීඩාංගනය වෙත රැගෙන යෑමේ චාරිකාවේ ආරම්භක උත්සවයේ ආරක්ෂක රාජකාරි සහ මාර්ගස්ථ පෙළපාලි රාජකාරි 2019-08-28 දින මහවැලි කේන්ද්‍රයේ දී සාර්ථකව සිදු කරන ලදි.

10. 2019 මහවැලි ක්‍රීඩා උත්සවයේ මෙම බලකාය වෙත පැවරී තිබූ සම්මාන පෙළපාලි රාජකාරි , ධජ හා ආචාර පෙළපාලි රාජකාරි මෙන්ම ආරක්ෂක රාජකාරින් 2019-09-07,08 දෙදින බිසෝපුර මහවැලි ක්‍රීඩාංගනයේ දී සාර්ථකව නිමා කරන ලදි.

11. මෙම බලකාය වෙත බදවා ගත් ආධුනික ආරක්ෂක නියාමකයින් 46 දෙනකු උදෙසා ආධුනික පුහුණු පාඨමාලාවක් 2019-09-26 දින සිට 2019-11-05 දින දක්වා කොත්මලේ වාරිමාර්ග හා ජල කළමණාකරන පුහුණු පාසලේ දී සාර්ථකව නිමා කළ අතර මෙහි විසිර යාමේ උත්සවය 2019-11-05 දින එකි පුහුණු පරිශ්‍රයේ දී සිදු කරන ලදි.

12. මෙම බලකායේ රාජකාරි යෙදී සිටිය දී අසනිප තත්ත්වයක් මත අප අතරින් වියෝ වූ ආරක්ෂක නියාමක ඩබ්ලිව්.ජී.ජී.ජානක බංඩාර මහතාගේ අවසන් කටයුතු මෙම බලකායේ සම්ප්‍රදායානුකූලව ලබා දිය හැකි උපරිම සම්මානය වන උත්තමාචාරය සම්මානය පුද කරමින් 2019-10-13 දින පොළොන්නරුවේ දී සිදු කරන ලදි.

තව ද මෙම බලකායේ වසර 24ක් පුරාවට අධ්‍යක්ෂ වශයෙන් නායකත්වය ලබා දුන් මේජර් එල්.ඒ.පි.ජයවර්ධන මහතා වයස සම්පූර්ණ විම මත 2020-04-30 දින විශ්‍රාම ලබා ගැනීමට නියමිත අතර එතැන් සිට සහකාර අධ්‍යක්ෂ වශයෙන් මේජර් එම්.ඒ.එල්.එන්.විජේරත්න මහතා මෙම බලකායට නායකත්වය ලබා දෙමින් රාජකාරියේ නිරත වනු ඇත.



32 පුහුණු පාඨමාලාවේ උපදේශක මඩුල්ල



2019 වර්ෂයේ සිදු කළ පුහුණු කටයුතු



ශ්‍රී දළදා මාළිගාවේ පිරිසිදු කිරීමේ කටයුතු





2019 මහවැලි ක්‍රීඩා සමාප්ති උළෙලේ ආරම්භය



මහවැලි ආරක්ෂක බලකායේ 34 සංවත්සරය

2019 අත්පත් කර ගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය

2019 වර්ෂයේ ආයතනයේ ආදායම්

ගිණුම් අංකය			මිලියන
2003 - ණය පොලි ආදායම්	රු:1,696,374.03	2019 වසරට වෙන් වූ මුදල	12.6
2005 - දඩ පොලි ආදායම්	රු:24,000.00	2019 වසරට ඉලක්කය	4.8
2008 - නොගෙවන ටෙ. තැන්පත්	රු:1,466,605.51	2019 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයෙන් ලැබූ මුදල	5.3
2010 - විවිධ ආදායම්	රු:32,000.00	2019 වර්ෂයේ වියදම් වූ මුදල	4.8
එකතුව	රු:3,215,629.54	ඒ අනුව මූල්‍ය ප්‍රගතිය	38.1%

මූල්‍ය ප්‍රගතිය

ගිණුම් අංකය	වෙන් වූ මුදල මිලියන	වියදම් වූ මුදල මිලියන
2385 ගොඩනැගිලි	7.9	1.67
2383 වාහන නඩත්තු	2.0	1.91
2705 කාර්යාල උපකරණ	0.7	0.08
2822 මහවැලි ක්‍රීඩා	1.4	0.95
2706 ගෘහභාණ්ඩ හා උපාංග	0.6	0.14
2116 සංස්කෘතික වියදම්		0.01
2114 සංචාරක බංගලා උපකරණ		0.08
	12.6	4.84

4.5 මහවැලි කේන්ද්‍රය

වාර්ෂික වැඩ සැලැස්මට අනුව මහවැලි කේන්ද්‍රයේ කාර්යභාරය ප්‍රධාන අංශ හතරක් ඔස්සේ ඉටුකරනු ලබන අතර, සංස්කෘතික අංශය මගින් මහවැලි ජානපදික දරු දැරියන්ගේ සෞන්දර්ය හා සංස්කෘතික කලා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙනයාමත්, ක්‍රීඩා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාම ක්‍රීඩා අංශයේ කාර්යයභාරයත් වන අතර මෙම අංශ දෙක මගින් මහවැලි ජානපදික තුන්වන සහ හතරවන පරම්පාරාවන්හි දරු දැරියන්ගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික තත්වය ගොඩනැංවීමෙහිලා කටයුතු කරනු ලබයි.

ප්‍රකාශන අංශය මගින් මහවැලි කලාපයන්හි වර්තමාන කටයුතු පිළිබඳ ප්‍රචාරාත්මක ප්‍රකාශන නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, අධ්‍යාපන හා සමාජ සංවර්ධන හා විශේෂ වැඩසටහන් යටතේ මහවැලි පරිසර බලකාය පිහිටුවීම සහ කලාපයන්හි ශාක ඝනත්වය ඉහළ දැමීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇති අතර, මෙම අංශය මගින් මහවැලි කලාපයන්හි තුන්වන සහ අතරවන පරම්පරාවන්හි දරු දැරියන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම පිණිස ආර්ථික සංවර්ධන කටයුතු ද, ජාතික ආර්ථිකයට සහ ජාතික සංවර්ධනයට දායක කර ගැනීමේ වැඩසටහන් සැලසුම් කර ඇති අතර, ඉදිරි වර්ෂයන් හිදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

ජාතික වාරි කෞතුකාගාරය මගින් මහවැලි පෞඩත්වය පිළිබඳ මෙන්ම ශ්‍රී ලාංකීය වාරි ශිෂ්ඨාචාරය සම්බන්ධ හෙලිදරව්වක් ජාතික සහ ජාත්‍යන්තර තලයට එක් කරනු ලබන අතර iii වන අදියරයේ කටයුතු අවසන් කිරීමෙන් පසු අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා මෙන්ම මහජනයා වෙත විවෘත කර ඇත. ජාතික කෞතුකාගාරය සමග බද්ධ කරමින් මෙහි අකටයුතු වැඩි දුරටත් සංවර්ධනය කිරීමට සහ අන්තර් ජාල පහසුකම් සලසා ගැනීම සඳහා වැඩසටහන් යෝජනා කර ඇති අතර, ඉදිරි වර්ෂයන් තුලදී මෙම නවීකරණ කටයුතු සිදුවනු ඇත.

ගාමිණී දිසානායක ග්‍රවණාගාරය විවිධ බාහිර පාර්ශවයන් සඳහා කුලී පදනම මත ලබා දීම මගින් ආදායම් උත්පාදනය සිදුකරනු ලබන අතර, ප්‍රකාශන අළෙවිය සහ වාරි කෞතුකාගාරය අධ්‍යයන කටයුතු සඳහා උපයෝගී කර ගනිමින් නව ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් සැලසුම් කර ඇති අතර, ඉදිරි වර්ෂයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමට යෝජිතය.

මීට අමතරව තාක්ෂණ හා නඩත්තු අංශය මගින් මහවැලි කේන්ද්‍රය හා සම්බන්ධ සියළු ඉදිකිරීම් නවීකරණ කටයුතු මෙන්ම එදිනෙදා නඩත්තු කටයුතු මෙහෙයවනු ලබන අතර, ගිණුම් අංශය මගින් විවිධ ගෙවීම් කටයුතු ද, පරිපාලන අංශය මගින් ගබඩාද්‍රව්‍ය යාවත්කාලීන කිරීම සහ කාර්යාල පරිපාලනය ද, සිදුකරනු ලබයි.

4.5.1 ක්‍රීඩා අංශය

මහවැලි ජානපදික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාම ක්‍රීඩා අංශයේ කාර්යය භාරය වන අතර, මෙහි කටයුතු පහත පරිදි වේ.

- මහවැලි ප්‍රදේශවල ක්‍රීඩා කුසලතා ඇති තරුණ තරුණියන් හඳුනා ගැනීම සහ දැනට ක්‍රීඩාවල නියැලෙන ක්‍රීඩකයින්ගේ තොරතුරු ලබාගෙන දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලසුම් සකස් කිරීම
- ක්‍රීඩකයින් පුහුණු කිරීමේ සංචිතයක් ඇති කිරීම සහ ඒ මගින් ක්‍රීඩකයින් පුහුණු කිරීම
- ක්‍රීඩා අමාත්‍යාංශයේ හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිර්නාකයන් අනුව විවිධ තරග සඳහා ක්‍රීඩකයින් තෝරා ගැනීම සහ යොමු කිරීම
- මහවැලි ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග හා මලල ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම හා ඊට අදාල සියළු කටයුතු
- ක්‍රීඩකයින්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම
- ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩාංගන වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- ක්‍රීඩා සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර, මා ආයතනයේ අංශ අතර, මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම
- ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
- ඒකක මට්ටමින් ක්‍රීඩක / ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම (සියලු කලාපවල)
- මහවැලි ක්‍රීඩා සමාජ පිහිටුවීම සඳහා ක්‍රීඩක /ක්‍රීඩිකාවන් ඉදිරිපත් කිරීම





විශේෂ කරුණු

ඔලිම්පික් ගිණිසිළුව සියළුම කලාපයන් වෙත රැගෙන ගොස් අවසන් මහා උළෙල පැවැත්වූ මැදිරිගිරිය මහවැලි ක්‍රීඩාංගනය වෙත රැගෙන යාම සහ 2019 මහවැලි මහා ක්‍රීඩා උළෙල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැදිරිගිරිය මහවැලි ක්‍රීඩාංගනයේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.

4.5.2 සංස්කෘතික අංශය

මහවැලි ජානපදික දරු දැරියන්ගේ කළා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට දරු දැරියන් ඔසවා තැබීම මහවැලි සංස්කෘති අංශයේ කාර්යභාරයයි.

- සංස්කෘතික සහ සෞන්දර්ය අංග ගණනාවක් යටතේ තරගාවලි පැවැත්වීම මගින් කලාපීය හා කොට්ඨාශ මට්ටමින් විවිධ දක්ෂතා සහිත දරුවන් හඳුනා ගැනීම (ගායන, වාදන, නර්තන, නිවේදන, ආදී මෙන්ම කෙටිකතා, රචන, නාට්‍ය නිර්මාණ, චිත්‍ර, ආදී)
- හඳුනාගන්නා ලද දරු දැරියන් මගින් මහවැලි ප්‍රතිභා කළා උත්සවය සංවිධානය කර පැවැත්වීම
- ඉහළ කෞෂල්‍යයන් සහිත දරු දැරියන් ජාතික හා ජාත්‍යන්තර තලයේ තරග සඳහා සහභාගි කරවීමට අවස්ථාව ලබා දීම
- දරු දැරියන්ගේ මෙන්ම කාර්යාලීය නිලධාරි මහත්ම මහත්මීන්ගේ කළා රසඥතාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම
- නිවේදක පුහුණු වැඩසටහන මගින් වර්ෂයක් පාසා ජාතික ගුවන් විදුලි සේවයට මෙන්ම ගුවන් විදුලි වැඩසටහන් සඳහා දරු දැරියන් යොමු කරවීම සිදු කරනු ලබන අතර, රූපවාහිනී වැඩසටහන් ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඇති අතර, ඉදිරි වර්ෂ වලදී මෙම වැඩසටහන් ආරම්භ කර වැඩි දියුණු කිරීමට යෝජිතය.

2018 සහ 2019 වර්ෂ වලදී අන්තර් කොට්ඨාශ සියළුම තරගාවලි පවත්වා අවසන් කර ඇතත්, මහවැලි ප්‍රතිභා 2019 කළා උළෙල උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.



4.5.3 ප්‍රකාශන අංශය

ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ඨාචාරයේ ආරම්භයේ පටන් වාරි කර්මාන්තයේ විකාශනය පිළිබඳ සියළු තොරතුරු ඇතුලත් හෙළ වාරි පුරාවත ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම මහවැලි ක්‍රීඩා 2019 සමරු කළඹ සකස්කර නිර්මාණය කිරීම, පුවත්පත් අතිරේකය සහ පුවත්පත් දැන්වීම් සකස් කිරීම ඇතුළු සියළු ප්‍රචාරක කටයුතු සිදුකිරීම

කෞතුකාගාරය

ශ්‍රී ලංකාවේ පැරණි වාරි කර්මාන්තයන්හි ඉතිහාසය සහ වාරි තාක්ෂණය සම්බන්ධ තොරතුරු මෙන්ම මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය හා බැදුණු සමාජ ආර්ධික හා සංස්කෘතික තත්වයන් පිළිබඳව නරඹන්නන්ගේ දැනුම අවබෝධය ආශ්වාදය පිණිස ප්‍රදර්ශණ කුටි නිර්මාණය කර ඇති අතර, ඒ හා සම්බන්ධ කෞතුක භාණ්ඩ ආදර්ශන හා දත්ත සංරක්ෂණය කරමින් අධ්‍යයනයන් හා පර්යේෂනයන් සදහා අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් මහවැලි කේන්ද්‍රයේ ජාතික වාරි කෞතුකාගාරය ස්ථාපනය කර ඇත.

ජාතික වාරි කෞතුකාගාරයේ iii වන අදියරයේ කටයුතු සහ නවීකරණ කටයුතු අවසන් කිරීමෙන් පසු අධ්‍යයනයන් සදහා ජනසතු කිරීමේ කටයුතු සිදුකර ඇත.

රාජ්‍ය ආයතනයන්හි නිලධාරින් හා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර, කුඩා පුස්තකාලය සදහා වාරි ශිෂ්ඨාචාරය හා සම්බන්ධ පොත් මිළදී ගැනීමේ කටයුතු සිදුකර ඇත.

අධ්‍යාපන, සමාජ සංවර්ධන හා විශේෂ වැඩසටහන්

මහවැලි පරිසර බලකාය පිහිටුවීම සහ කලාපයන්හි ශාක ප්‍රවර්ධන වැඩසටහන් රාශීයක් පැවැත්වීම, කොළඹ ප්‍රදේශයේ කාර්යාල නිලධාරි මහත්ම මහත්මීන්ට ගෙවතු වගා ශාක බෙදා දීමේ වැඩසටහනක් පැවත්වීම සිදුකර ඇති අතර, මෙම අංශයේ කටයුතු වැඩිදියුණු කරමින් වඩාත් ඵලදායී කාර්යභාරයක් ඉටු කිරීමට සැලසුම් සකස් කර ඇත.

4.5.4 නඩත්තු අංශය

2018 සහ 2019 වර්ෂයන් තුලදී වාහන රථගාල ඉන්ටලොක් ගල් හා තණකොළ පිඩලි අල්ලා නවීකරණය කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, පළමු මහලට සිදුවන ජල කාන්දුව පිළිසකර කිරීම, ශ්‍රවණාගාරයේ දොරවල් දෙක අළුතින් සවිකර නවීකරණය කිරීම වැනි කටයුතු සිදුකර ඇති අතර, කාර්යාලීය CCTV කැමරා පද්ධතිය ස්ථාපනය කිරීම සහ නව රූපවාහිනී යන්ත්‍රයක් මිළදී ගැනීමේ කටයුතු සිදුකර ඇත.

ආදායම් උත්පාදනය

මහවැලි කේන්ද්‍රය මගින් දැනට ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රම දෙකක් පහත පරිදි භාවිතා කරනු ලබයි.

- මහවැලි විද්වත් මණ්ඩලයක් විසින් සකස් කර මහවැලි කේන්ද්‍රය මගින් මුද්‍රණකටයුතුසිදුකළහෙළවාරිපුරාවත ග්‍රන්ථය හා බෝහියර් මහතා විසින් රචිත පුරාතන වාරි මාර්ග ක්‍රම ග්‍රන්ථ දෙක සහ මහවැලි සිතියම පිටස්තර පුද්ගලයන් හා ආයතනයන් වෙත අවශ්‍යතාවය පරිදි අලෙවි කිරීම
- ගාමිණී දිසානායක ශ්‍රවණාගාරය බාහිර ආයතනයන්ගේ අවශ්‍යතාවය පරිදි කුලී පදනම මත ලබා දීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	අංශය	වෙන්කළ ප්‍රතිපාදනය රු. මිලියන	වැයවූ මුදල රු. මිලියන
01	ඉදිකිරීම් සහ නවීකරණ	5.37	3.58
02	වත්කම් මිලදී ගැනීම සහ සවිකිරීම	1.26	1.07
03	ක්‍රීඩා	8.92	6.72
04	ප්‍රකාශන කටයුතු	0.65	5.00
05	සංස්කෘතික සංවර්ධන සහ මාධ්‍ය	3.50	1.12
06	කෞතුකාගාරය	0.48	0.06
07	අධ්‍යාපන හා සමාජ සංවර්ධන	0.04	0.01
08	විශේෂ ව්‍යාපෘති	0.78	0.57
	එකතුව	21.0	13.53

2019 වර්ෂයේ ආදායම් උත්පාදනය

අනු අංකය	විස්තරය	උපකල්පිත ආදායම රු. මිලියන	උත්පාදිත ආදායම රු. මිලියන
01	ශ්‍රවණාගාරය	2.0	2.64
02	ග්‍රන්ථ අලෙවිය	0.2	0.11
	එකතුව	2.2	2.75

4.6 ප්‍රවාහන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉලක්ක කරා ලඟා වීමට අවශ්‍ය වන සේවාවන් අතර ප්‍රමුඛ කාර්යය භාරයන් ප්‍රවාහන අංශය වෙත පැවරෙයි. ඒ සඳහා ආයතනයේ ප්‍රවාහන සේවාව, ආයතනය තුළ පවතින භෞතික හා ශ්‍රම සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගෙන කඩිනම් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවන් ලෙස ආර්ථික, සාමාජීය හා පාරිසරික බලපෑම අවම කරගනිමින් විධිමත් අයුරින් පවත්වාගෙන යාම ප්‍රවාහන අංශයේ මූලික කාර්යය ලෙස දැක්විය හැකිය.

නව සංකල්ප හා නවින තාක්ෂණ ක්‍රමවේද වෙත අනුගත වෙමින් පරිසර හිතකාමී සේවාවන් ලෙස පවත්වාගෙන යාම යුගයේ අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉටුකිරීමට නිවැරදි මඟ පෙන්වීම, අවශ්‍ය උපදෙස් ලබා දීම,සංචිත වාහන කළමනාකරණය කිරීම නිවැරදි මඟකට යොමු කිරීම තුළින් වඩාත් ඵලදායි පරිසර හිතකාමී කාර්යක්ෂම සේවාවන් ලබා දීම අපගේ පරමාර්ථය වේ.

අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය රජයට වැය බරක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු බවත්, එහි ආදායම් උපද්දවා හෝ ලාභ ලබන ආයතනයක් ලෙස ඉදිරියට කටයුතු කල යුතු බවටත් මහා භාණ්ඩාගාරය (මුදල් අමාත්‍යාංශය) විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව ඉදිරි කටයුතු සැලසුම් කිරීමේදී ප්‍රවාහන කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කල යුතු වේ. සමස්ථ අයවැය ප්‍රතිපාදන වලින් 7 % ක ප්‍රමාණයක් මේ සඳහා වැය වෙයි. ඉන්ධන, රියදුරු ගෙවීම්, අතිකාල, යැපීම්, අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා විශාල මුදලක් වැය වන අතර, ඒවා විධිමත් අයුරින් පාලනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව වාහන 666 ක සංචිතයක් පවති. එය මෝටර් වාහන (කාර්,ජීප්,ද්විත්ව කාර්යය) 488 ක් ද බර වාහන (ලොරි,බස්) 178 ක් හා යන්ත්‍රෝපකරණ (ලෝඩර්, ජේ.සී.බී ආදි) 57 කින් සමන්විත වේ.



ඒ සඳහා පිළිවෙලින් රියදුරන් 413ක්, යන්ත්‍ර ක්‍රියාකරුවන් 71ක්, ට්‍රැක්ටර් රියදුරන් 13ක් හා රිය සහයකයින් /අත්උදව් කරුවන් 39 ක් සේවය කරනු ලබයි.



2019 වසරේදී ප්‍රවාහන කළමනාකරණ කටයුතු සඳහා සමස්ථ වියදම රු.189,997,430.00 ක් වේ

වාර්ෂික පුනරාවර්තන වියදම	
ඉන්ධන හා තෙල් සඳහා වියදම	රු. 57,233,728.00
කුලි පදනම මත යොදා ගත් වාහන සඳහා ගෙවීම් කිරීම	රු. 1,529,230.00
වාහන අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සඳහා වියදම	රු. 64,059,493.00
රක්ෂණය හා ආදායම් බලපත්‍ර ගාස්තු ගෙවීම සඳහා වියදම	රු. 8,937,808.00
පුනරාවර්ථන වියදම් හි එකතුව	රු. 131,760,259.00
වාර්ෂික ප්‍රාග්ධන වියදම	
වාහන වැඩි දියුණු කිරීම සඳහා වියදම රු.	58,237,171.00
සමස්ථ වියදම	**රු. 189,997,430.00**

ප්‍රධාන කාර්යාලය ප්‍රමුඛ කලාප කාර්යාල 10 ක් තුළ ඉහතින් සඳහන් කල මෝටර් වාහන හා ක්‍රියාකරුවන් සේවා අවශ්‍යතාවය මත බෙදා වෙන් කර ඇත. සෑම කලාප කාර්යාලයක් තුළම ප්‍රවාහන අංශයක් ස්ථාපිත කර ඇති අතර, ප්‍රවාහන නිලධාරිවරයෙකු යටතේ එහි මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

එවි කලාපයේ, තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල සෑම කලාප කාර්යාලයක් තුළම යාන්ත්‍රික වැඩපලක් ස්ථාපිත කර ඇති අතර, එමඟින් වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු ඉටු කරනු ලබයි. එහෙත්, යාන්ත්‍රික වැඩපල අතරින් මුලිකත්වය ගනු ලබන තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල තුළින් අපේක්ෂා කල මට්ටමේ ක්‍රියාකාරිත්වයක් ලබා ගැනීමට පසුගිය වසර තුළ නොහැකි වී ඇත.

රජයේ ප්‍රතිපත්තිවලට හා මඟ පෙන්වීම් අනුව නව වාහන මිළදී ගැනීමක් පසුගිය වසර තුළ සිදු නොවිය. එබැවින් පවතින සංචිත වාහන නඩත්තු කරමින් ධාවනයට යෙදවීමට කටයුතු කර ඇත.ආයතනය තුළ පවතින වාහන වලින් 60% කට වඩා අධික ප්‍රමාණයක් වසර 15 කට වඩා පැරණි වාහන වන අතර ඒවා නඩත්තු කිරීමට වැඩි වැය බරක් ආයතනයට දැරීමට සිදුවිය.

තවද පසුගිය වසර තුළ වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබූ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් ලියාපදිංචි වාහන නැවත අධිකාරිය වෙත ලබා ගැනීමටත්, වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු නමින් ලියාපදිංචිව අප ආයතනය විසින් පරිහරණය කරන ලද ඇති වාහන එම ආයතන වෙත ලබා දීමට හෝ අප වෙත පවරා ගැනීමද විධිමත් අයුරින් සිදු කරන ලදි.

රජයේ නිලධාරින්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව අධිකාරියේ ඉහල කළමනාකාරිත්වය විසින් ලබා දී ඇති උපදෙස් හා මග පෙන්වීම් යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සංචිත වාහන කළමනාකරණය කිරීම නිවැරදි මගකට යොමු විය. එම ක්‍රියාදාමය ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක අතර එම පිළිවෙත් කලාප කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීම ඵලදායී සේවාවක් සඳහා ඉවහල් වේ.

ප්‍රධාන කාර්යාලයේ වාහන කළමනාකරණයේ දී වෙන් කරනු ලබන වාහන (නිල වාහන හිමිකාරිත්වය) හැර සෙසු සියලුම වාහන ප්‍රවාහන සංචිතය තුළ කළමනාකරණය කරනු ලබයි. එදිනෙදා රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා දෛනික වාහන ඉල්ලීම් මසකට 150 – 175 අතර ප්‍රමාණයක් ඉදිරිපත් වන අතර, මසකට ක්ෂේත්‍ර චාරිකා 70 ක් පමණ ඉදිරිපත් කරනු ලබයි. මෙම සියළුම ඉල්ලීම් සංචිතය තුළ සිටින සීමිත රියදුරු සම්පතින් (රියදුරු මහතුන් 28) කළමනාකරණය කර ගැනීමට ප්‍රවාහන අංශයට සමත් වී ඇත.



මෙසේ එක් සංචිතයක් තුළ වාහන කළමනාකරණය කිරීම තුළින් නිවැරදි ප්‍රවාහන කළමනාකරණයක් ඉටු කිරීමට හැකියාවක් ලැබෙන අතර, ලබා ගැනීම තුළින් ප්‍රවාහන පහසුකම් සඳහා අධිකාරිය විසින් දරණු ලබන ඉන්ධන හා අනෙකුත් වියදම් පාලනය කර ගැනීමට හැකියාව ලැබී ඇත. මීට අමතරව වාහන අවභාවිතය, සිමිත වූ ශ්‍රමය හා කාලය ඉතිරි කර ගැනීමට මෙන්ම ආර්ථික වාසි ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

සංචිතය තුළ සේවය කරන සෑම රියදුරු මහතෙකුටම සමාන අවස්ථාවන් ලබා දීම තුළින් ඔවුන්ගෙන් ලබා ගන්නා සේවය ඉහල මට්ටමකට ලගා කර ගැනීමට හැකි වූ අතර, රාජකාරී ඉටුකිරීමට දක්වන උනන්දුව ඉහල නැංවීමට හැකියාව ලැබී ඇත. රාජකාරී ඉටු කිරීමට දක්වන කැපකිරීම හා උචිත අයුරින් සේවයට යොමු වීම දක්නට ලැබේ.

මෙම වසර තුළ අංශය සතු ඉලක්කයන් අතර අධිකාරියේ රියදුරු මහතුන් වෙතින් සිදුවන වාහන අනතුරු අවම කර ගැනීම සඳහා මුල් තැනක් හිමි වූ අතර, එම අරමුණ ඇතිව රියදුරු මහතුන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කල කර එම අරමුණ සාර්ථක කර ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව 2019 වර්ෂයේ සිදු වූ අනතුරු සංඛ්‍යාව 4 ක් දක්වා අවම කර ගැනීමට හැකි විය. එවැනි පුහුණු පාඨමාලාවන් ඉදිරියේ දී පැවැත්වීම කාලීන අවශ්‍යතාවයක් වන අතර එමගින් රියදුරු මහතුන්ගේ දැනුම හා අභිප්‍රේරණය ඉහල නැංවිය හැක.



2019 වර්ෂය තුළ රාජ්‍ය ආයතන වල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම කෙරෙහි අවධානය යොමු කල අතර, ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා වලට අනුකූලව අබලන් වූ වාහන අපහරණය කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. ඒ අනුව, ආයතනය තුළ අපහරණය කිරීම සඳහා වාහන හා යන්ත්‍රෝපකරණ 63 ක් ද අබලි ද්‍රව්‍ය හා සුන්බුන් ලෙස යකඩ බරට විකිණීමට 66 ද ලෙස අයිතමයන් 129 ක් හඳුනාගෙන ඇති අතර, ඒවා ටෙන්ඩර් මඟින් විකිණීමට අවශ්‍ය කටයුතු සම්ප්‍රාදනය කරමින් පවති.

ප්‍රවාහන කළමනාකරණ මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ප්‍රවාහන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන)ගේ මූලිකත්වයෙන් තාක්ෂණික ඉංජිනේරු(යාන්ත්‍රික), ඉංජිනේරු සහකා ර (යාන්ත්‍රික) දෙදෙනෙකු, කළමනාකරන සහකාරවරුන් , වැඩ මූලික ඇතුළු සිමිත වූ කාර්යය මණ්ඩලයක් මඟින් ඉටුකරනු ලබන අතර, මූලිකව ප්‍රවාහන නිලධාරී, පාලන සහකාර තනතුරු සඳහා අංශයේ පුරප්පාඩු කලක සිට පවති.



රජයේ ප්‍රතිපත්ති වලට සමගාමීව (සෞභාග්‍යයේ දැක්ම) දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් යන තේමාව මුල් කරගෙන ඵලදායි හා කාර්යක්ෂම ප්‍රවාහන සංචිත කළමනාකරණය කිරීම ඉලක්ක කොට ගෙන ඉහත කාර්යයන් අංශය තුළ ක්‍රියාත්මක කල අතර, ඒ සඳහා නවින/කාලීන තාක්ෂණ ක්‍රමවේද (Information Communication Technology (ICT) , Global Positioning System (GPS), Fleet Management Soft wear (FMS) අනුගමනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබයි. ඉදිරි අනාගතේ දී මෙම තාක්ෂණ ක්‍රමවේද අනුව ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු සැලසුම් කිරීම අපේක්ෂා කරයි.

මෙම වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලයේ වෙන් කරන ලද වාහන (නිල වාහන හිමිකම් ඇති) හැර අනෙකුත් සියලුම වාහන එක් සංචිතයක් තුළින් කළමනාකරණය කල අතර, අධිකාරියේ රාජකාරි අවශ්‍යතා සඳහා වාහන හා රියදුරු මහතුන් වෙන් කිරීම ප්‍රවාහන අංශය තුළින් පමණක් සිදු කරන ලදි. මේ හේතුවෙන් පෙර වර්ෂයන්ට සාපේක්ෂව වාහන අවභාවිතය ඉන්ධන සඳහා වැය වන මුදල අවම කර ගැනිම, පවතින සංචිතයෙන් උපරිම ප්‍රයෝජන ගැනිමට හැකි වී ඇති අතර රජයේ මහ පෙන්වීම් අනුව පිළිගත් නිවැරදි ප්‍රවාහන කළමනාකරණය වෙත යොමු වීමට අවස්ථාව උදාවිය. ඉහත තත්වයන් තව දුරටත් වර්ධනය කර නවින තාක්ෂණ ක්‍රමවේද වෙත යොමු වීම යුගයේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇත.

පස්වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පිහිටවනු ලැබ ඇති සමාගම් - I කොටස

සමාගම් පනතේ යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකළ ව්‍යාපාරික කටයුතු වලින් කොටසක් කළමනාකරණ සඳහා පහත සඳහන් පෞද්ගලික සමාගම් වෙත පවරා දී ඇත.

- සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම
  Mahaweli Livestock & Agro Enterprises (Pvt) Ltd
- සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශය (පුද්ගලික)සමාගම (MCB)
  Mahaweli Consultancy Bureau (Pvt) Ltd
- ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික)සමාගම(NRMS)
  Natural Resources Management Services (Pvt) Ltd

2019 වර්ෂය තුළ සමාගම් වල කාර්යය සාධනය

අ.අ	සමාගම	වර්ෂය තුළ ඉටුකළ කාර්යය/ තත්වය
01	සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම	❖ පළාතේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා ඔවුන්ට එමඟින් සේවාවන් සැපයීම. ❖ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ඒ නිෂ්පාදන මහවැලි කලාප සහ අවට ප්‍රදේශවල අලෙවි කිරීම. ❖ ගම් කුකුල් ව්‍යාපෘතියක් මඟින් ගොවීන් වෙත පැටවුන් ලබා දීම. ❖ පූං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම. ❖ තත්වයෙන් උසස් බ්‍රොයිලර් මස් නිෂ්පාදනය කර අලෙවිය.
02	සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම	ශක්‍යතා අධ්‍යනයන්ගෙන් හා කොන්ත්‍රාත් කටයුතු වලින් 2018 වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත.
03	ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සේවා සමාගම	පහත කටයුතු වලින් 2014 වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත. • වික්ටෝරියා හා කොත්මලේ කලාපයේ ඉඩම් මිනුම්කරනය සහ සැලසුම් සකස් කිරීම - රු.213,800.00 • පාංශු පර්යේෂණ ව්‍යාපෘතිය - රු.1,018,479.01 • H-Q measurement of Nanuoya & Coledoniya gauging station -රු.437,472.00 • මාතලේ දිස්ත්‍රික්කයේ පුවක්පිටිය සහ ඉලුක්කුඹුර කාබනික ගොවිපළ ව්‍යාපෘතිය- රු.200,000.00 • හපුතලේ ප්ලාන්ටේෂන් ව්‍යාපෘතිය ව්‍යාපෘතිය - .160,000.00 • අමර ලෙෂර් හොටෙල් මූලික පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කිරීම. - රු.300,000.00

වාර්ෂික ගිණුම්

II - කොටස

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500, ටී.බී. ජයා මාවත
කොළඹ 10

2019.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

		සමූහය		අධිකාරිය	
		රු '000	රු '000	රු '000	රු '000
		2019	2018	2019	2018
	සටහන්				
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ පිරියත හා උපකරණ	(1)	4,972,468	4,218,620	4,910,040	4,157,600
ආයෝජන	(2)	166,299	173,760	527,118	532,323
ප්‍රාග්ධන නොනිමි වැඩ		47,482	84,947	47,482	84,947
ජංගම නොවන වත්කම් එකතුව		5,186,249	4,477,328	5,484,640	4,774,870
ජෛව වත්කම් - ප්‍රාග්ධන	(3)	219,777	167,027	210,567	156,572
ජංගම වත්කම්					
භාණ්ඩ තොග	(4)	170,983	180,461	166,964	175,874
ජෛව වත්කම් - වෙළඳ	(3)	47,178	26,312	47,004	24,852
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	(5)	2,997,661	2,646,243	2,929,670	2,569,245
කලින් ගෙවීම්		-	4,767	-	4,767
බැංකු ඇපකර මුදල් හා මුදල් සමාන දෑ		374	6,292	-	-
	(6)	258,877	312,702	249,399	304,528
ජංගම වත්කම් එකතුව		3,475,073	3,176,777	3,393,037	3,079,266
වත්කම් එකතුව		**8,881,100**	**7,821,131**	**9,088,243**	**8,010,708**
බැරකම්					
ජංගම බැරකම්					
ගෙවිය යුතු	(7)	968,185	644,059	935,272	602,272
ඇලියන්ස් ෆිනෑන්ස් කල් බදු		-	-	-	-
උපචිත වියදම්	(8)	211,909	102,067	187,511	68,075
අන්තර් ආයතන ජංගම ගිණුම් ශේෂයන්		-	-	-	-

ජංගම බැරකම් එකතුව		1,180,094	746,126	1,122,783	670,347
ජංගම නොවන බැරකම්					
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම්	**(9)**	1,371,814	1,379,494	1,359,652	1,367,485
බැංකු ණය		-	-	-	-
කල් බදු ගාස්තු		-	219	-	-
විලම්බිත බදු		612	612	-	-
ජංගම නොවන බැරකම් එකතුව		1,372,426	1,380,325	1,359,652	1,367,485
බැරකම් එකතුව		2,552,520	2,126,451	2,482,435	2,037,833
මුළු ශුද්ධ වත්කම්		6,328,579	5,694,680	6,605,808	5,972,875
ශුද්ධ වත්කම්/ ස්කන්ධය					
සමුච්චිත අරමුදල	**(10)**	1,837,751	1,606,957	1,834,747	1,603,953
සංචිත - ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුම් ශේෂය		(657,528)	(364,355)	(321,585)	(32,290)
ආදායම් සංචිත - සමාගම්		48,288	50,865	-	-
ප්‍රත්‍යාගණන සංචිත		5,100,069	4,401,212	5,092,646	4,401,212
ශුද්ධ වත්කම්/ ස්කන්ධය එකතුව		6,328,580	5,694,680	6,605,808	5,972,875

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500, ටී.බී. ජයා මාවත
කොළඹ 10

2019.12.31 අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යයඵලය පිළිබඳ ප්‍රකාශය

		සමූහය රු '000 2019	අධිකාරිය රු '000 2019	සමූහය රු '000 2018	අධිකාරිය රු '000 2018
	උපලේඛණය				
ආදායම්	**(01)**				
කුලී		370,610	370,610	257,680	257,680
රාජ්‍ය භාග		1,399,617	1,399,617	365,938	365,938
ඉදිකිරීම් සේවා		17,275	-	33,822	-
ගොවිපළ නිෂ්පාදන විකිණුම්		5,282	-	6,655	915
ආයෝජන ආදායම් (සමාගම්)		9,588	2,935	16,829	10,103
වෙනත් ආදායම්		119,240	119,162	53,335	51,264
උත්පාදිත ආදායම		1,921,613	1,892,324	734,258	685,898
භාණ්ඩාගාර ප්‍රදාන					
- පුනරාවර්තන	**(02)**	2,100,000	2,100,000	2,694,384	2,694,384
- ප්‍රාග්ධන		1,159,436	1,159,436	1,976,359	1,976,359
- කෘෂි		159,500	159,500		
- ගංවතුර		73,500	73,500		
		5,414,049	5,384,760	5,405,001	5,356,641
අඩු කිරීම : වියදම්	**(03)**				
පුද්ගලික පඩි නඩි		2,822,035	2,803,412	2,619,433	2,591,043
ගමන් වියදම් හා යැපුම් දීමනා		106,633	106,529	64,448	64,189
සැපයුම්/ ප්‍රවාහන		137,686	136,598	134,324	128,924
නඩත්තු වියදම්		43,659	43,597	51,374	51,158
ගිවිසුම්ගත සේවා		129,211	127,659	127,387	125,010
රක්ෂණය		237	237	323	323
අනෙකුත් වියදම්		90,301	81,326	78,533	69,018
ක්ෂය වීම්, ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම් හා වෙනත් නඩත්තු කටයුතු		547,475	544,714	525,827	522,620

ප්‍රජා සංවර්ධනය හා වෙනත් ජානපදික සේවා	**(04)**	1,831,043	1,831,043	2,182,666	2,182,666
සංචාරක බංගලාවේ අලාභය	**(05)**	14,085	14,085	12,296	12,296
සංවර්ධන මධ්‍යස්ථානයේ ලාභය		(976)	(976)	7,002	7,002
ජල කළමණාකරණ ව්‍යාපෘතියේ අලාභය		3,739	3,739	3,124	3,124
යාන්ත්‍රික වැඩපොළේ අලාභය/ ලාභය		(10,474)	(10,474)	366	366
පැළ තවාන් අලාභය	**(06)**	19,313	19,313	6,371	6,371
ගොවිපළේ අලාභය/ ලාභය	**(07)**	(52,049)	(52,049)	361	361
හෙළ බොජුන් හල් අලාභය / ලාභය		(82)	(82)	3,924	3,924
මෙහෙයුම් වියදම් එකතුව		5,681,837	5,648,669	5,817,759	5,768,394
මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලැබූ අතිරික්තය/ (ඌනතාවය)		(267,788)	(263,909)	(412,758)	(411,753)
එකතු කිරීම. ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභය/ අලාභය	**(08)**	(25,960)	(25,960)	(10,191)	(10,191)
අඩුකිරි බදු සඳහා වෙන් කිරීම		-	-	79	-
ලාභාංශ		573	573	573	
බදු පසු ලාභය		(293,175)	(289,295)	(423,600)	(421,944)
			-		-
2019.01.01 දිනට ඉ/ගෙන ආ ශේෂය		(364,354)	(32,290)	(23,511,422)	(23,181,813)
ඉදිරියට ගෙන යන ශුද්ධ අතිරික්තිය (ඌනතාවය)		**(657,528)**	**(321,585)**	**(23,935,022)**	**(23,603,757)**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

අංක . 500, ටී.බී. ජයා මාවත

කොළඹ 10.

2019 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සමූහය	අධිකාරිය
	(රු '000)	**(රු '000)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය	(267,788)	(263,909)
ලාභාංශ	573	573
මුදල් නොවන වලනයන්		
ක්ෂය වීම්	557,360	553,924
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම	(7,680)	(7,834)
වැඩිවූ ජෛව වත්කම් උපයාගැනීම්	(52,750)	(53,995)
වත්කම් මාරුකිරීම්	(394,521)	(394,521)
වත්කම් පවරා දීම්	3,298	3,298
මෙහෙයුම් කටයුතු		
තොග වැඩිවීම/ අඩුවීම්	9,478	8,910
ජෛව වත්කම් වැඩිවීම/ අඩුවීම - වෙළඳ	(20,867)	(22,152)
වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	(351,418)	(360,425)
කලින් ගෙවීම් වැඩිවීම/ අඩුවීම	4,767	4,767
බැංකු ඇපකර වැඩිවීම/ අඩුවීම	5,918	-
ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	324,126	333,000
උපචිත වියදම්වල වැඩිවීම/ අඩුවීම	109,842	119,436
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(79,661)**	**(78,927)**
ආයෝජන ක්‍රියාකාරකම්		
දේපළ පිරියත හා උපකරණ මිලදි ගැනීම්	(253,568)	(253,563)
වත්කම් විකිණීමෙන්	3,896	3,896
ආයෝජන වැඩිවීම/ අඩුවීම	7,462	5,205
නොනිමි වැඩ වැඩිවීම/ අඩුවීම	37,465	37,465
	(204,745)	**(206,996)**
මූල්‍ය කටයුතු		
මූල්‍ය ගාස්තු වැඩිවීම/අඩුවීම	(219)	-
සමුච්චිත අරමුදලේ හා සංචිතවල වැඩිවීම/ අඩුවීම	228,217	230,794
ප්‍රත්‍යාගණන සංචිතයේ වැඩිවීම/ අඩුවීම	2,583	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**230,581**	**230,794**
මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	**(53,825)**	**(55,130)**
2019.01.01 දිනට මුදල් සහ මුදල් සමාන	312,702	304,528
2019.12.31 දිනට මුදල් හා සමාන මුදල්	**258,877**	**249,399**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

අංක 500, ටී.බී. ජයා මාවත
කොළඹ 10

<u>ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - සමූහය</u>

	රු.'000	රු.'000	රු.'000	රු.'000
විස්තරය	ඒකාබද්ධ අරමුදල	සංචිත	ආදායම් හා වියදම්	එකතුව
2018.01.01. දිනට ශේෂය	24,407,260	4,056,947	(23,511,422)	4,952,785
වසර තුළ	242,570	861,469	(423,600)	680,439
2018.12.31 දිනට ශේෂය	**24,649,830**	**4,918,416**	**(23,935,022)**	**5,633,224**
2019.01.01 දිනට ශේෂය	**1,606,957**	**4,401,212**	**(293,175)**	**5,714,995**
වසර තුළ	253,563	698,857	(364,354)	**588,066**
විලම්බිත ආදායම	(22,769)			**(22,769)**
2019.12.31 දිනට ශේෂය	**1,837,751**	**5,100,069**	**(657,528)**	**6,280,292**

<u>ස්කන්ධය වෙනස්වීම් දක්වන ප්‍රකාශය - මහවැලි අධිකාරිය</u>

	රු.'000	රු.'000	රු.'000	රු.'000
	ඒකාබද්ධ අරමුදල	සංචිත	ආදායම් හා වියදම්	එකතුව
2018.01.01. දිනට ශේෂය	24,404,255	4,006,082	(23,181,813)	5,228,524
වසර තුළ	242,570	861,469	(421,943)	682,096
2018.12.31 දිනට ශේෂය	**24,646,825**	**4,867,551**	**(23,603,756)**	**5,910,620**
2019.01.01 දිනට ශේෂය	1,603,953	4,401,212	(289,295)	5,715,870
වසර තුළ	253,563	691,434	(32,290)	912,708
විලම්බිත ආදායම	(22,769)	-	-	(22,769)
2019.12.31 දිනට ශේෂය	**1,834,747**	**5,092,646**	**(321,585)**	**6,605,808**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1.) **වාර්තාකරන ඒකකය**

1979 අංක 23 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් එම පනතේ 12 වගන්තියෙහි දක්වා ඇති අතර මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය එමගින් පැවරී ඇත.
මහවැලි පනත අනුව යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතුය.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදා හැරීමේ පද්ධතිය සහ විදුලි බල උත්පාදනය සහ සැපයීම සඳහා ස්ථාපනයන් ඉදිකිරීම හා මෙහෙයවීම ඇතුළුව මහවැලි ගංගා සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

(ආ) එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් සිදු කරනු ලැබිය හැකිය.

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ හා ඒකාබද්ධ සංවර්ධනයට ප්‍රතිශ්‍රයාධාර වීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික ඵලදා වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් ප්‍රශස්ත තත්ත්වයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ එම සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඉ) කිසියම් විශේෂ ප්‍රදේශයක භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ පවත්වා ගෙන යාම.

(ඊ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ප්‍රජාවගේ පොදු සුබසාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම.

(උ) ඕනෑම විශේෂ ප්‍රදේශයක ආර්ථික හා කෘෂිකාර්මික දියුණුව සඳහා අභ්‍යන්තර හා බාහිර වූ උභය පුද්ගලික ප්‍රාග්ධනය යෙදවීම නංවාලීම හා සුරක්ෂිත කිරීම ; සහ

(ඒ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැඟීමෙහි දී මෙන්ම යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය ආයතනවල, පළාත්

පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය නංවාලීම.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකාරියට පැවරී ඇති බලතල එම පනතේ 12 වැනි වගන්තියේ දක්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලිත සමාගම් හතරකින් සහ ආශ්‍රිත සමාගමකින් සමන්විත වේ. එනම් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම, සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම වේ.

සියලුම අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති අතර, පහත සඳහන් මූලික කර්තව්‍යයන් සිදු කරයි.

සමාගම්වල කොටස් ප්‍රාග්ධනය ගැන විස්තර පහත පරිදි වේ.

	සමාගම	**කොටසක මිල**	**සම්පූර්ණයෙන් ගෙවා නිකුත් කරඇති කොටස් ගණන**	**මහවැලි අධිකාරියට නිකුත් කර ඇති කොටස් ගණන**
1	සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශ (පුද්ගලික) සමාගම	රු. 10	6385	6384
2	සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම	රු. 10	1502	1500
3	මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම	රු. 10	1,039,803	1,039,800
4	සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම	රු. 10	3	-

<u>මහවැලි සමාගම් වල මූලික කර්තව්‍යයන්</u>

පරිපාලිත සමාගම්

අ) මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම

අ) මහවැලි ව්‍යවසායකයින් සඳහා ණය පහසුකම් ලබාදීම

ආ) සමාගම සඳහා අරමුදල් උත්පාදනය කිරීම සඳහා වාණිජ ව්‍යවසාය ආයෝජන කටයුතු කිරීම

ආ) සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

(අ) ස්වභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය යටතේ එන නිර්මාණ සැලසුම්, පුහුණුකිරීම්, ද්‍රව විද්‍යාත්මක අධීක්ෂණය, ඉඩම් භාවිතා සිතියම්කරණය, ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය සහ වනය ආශ්‍රිත කටයුතු පිළිබඳව වෘත්තීයමය උපදෙස් හා සේවා සැපයීම.

ආ) තොරතුරු සහ දත්ත සැපයීම සහ ශක්‍යතා අධ්‍යයන,
පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය (EIA), මූලික පාරිසරික ඇගයීම් වාර්තා (IEER) ආදිය සකස් කිරීම

ඇ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) මහවැලි ගොවීන්ට උසස් ගුණාත්මක බවින් යුතු සතුන් සැපයීම .
(ආ) කිරි හා මාංශ නිෂ්පාදනය හා අලෙවිකරණය.

ඈ) සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම

අ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි උපදේශන සේවා සැපයීම.
ආ) ගොඩනැගිලි, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන සහ මාර්ග ආදී ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම් කොනත්‍රාත්තු භාර ගැනීම .

ආශ්‍රිත සමාගම්

ඉ) සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම

(අ) බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය හා අලෙවිය
(ආ) මහවැලි ගොවීන් සමඟ බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය කළ පසු මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹීම

කෙසේ වෙතත්, මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 දී මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම විසුරුවා හැරීමට තීරණය කළේය. එබැවින් මෙම සමාගමේ ගිණුම් ඒකාබද්ධ ගිණුම්වලට ඇතුළත් නොවේ. එවිට වත්කම් සහ බැරකම් සටහනක් ලෙස අනාවරණය කර ඇත.

2) පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විතවේ. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රජය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙල කොට ඇත.

අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඊට පෙර මූල්‍ය වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම අනුවය. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනකාරී සාධක සඳහා ගැලපීමක් සිදු නොකරන ලදී.

2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කොට ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු ආසන්නතම දහසට වටයා ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල ප්‍රකාශිත වටිනාකම්වලට බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇති තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන වලට එළැඹීමට කළමනාකාරීත්වයට සිදු වේ. ඓතිහාසික අත්දැකීම් සහ පවත්නා සංසිද්ධීන්ට අනුව සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂා ද ඇතුළත් වන පරිදි, තීන්දු හා ඇස්තමේන්තු පදනම් වේ. කරුණු එසේ හෙයින් සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල, එකී තීන්දු හා ඇස්තමේන්තු වලින් අපගමනය විය හැකිය.

මෙකී ඇස්තමේන්තු හා පාදක උපකල්පන, අඛණ්ඩ පදනමකින් විචාරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධනයක් සිදු කළේ නම්, එකී ප්‍රතිශෝධනයන් එකී කාලසීමාවට හා වෙනත් ඕනෑම අනාගත කාලසීමාවකට බලපාන්නේ නම් පමණක් එම ප්‍රතිශෝධනය එය සිදු කළ කාලසීමාව තුළ හඳුනා ගත යුතුවේ.

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස් වීම්

පහත සඳහන් අවස්ථාවන්හි හැර ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ අනුගමනය කළ ප්‍රතිපත්තීන්ම වේ.

2.5.1 ගොවිපළ, පැල තවාන් හා සංචාරක බංගලා ඒ ඒ මහවැලි කලාප යටතේ ඇති ආදායම් හා වියදම් ගිණුම් යටතේ වෙන වෙනම ගිණුම් ගත කරන ලදී.

2.5.2 ජෙව වත්කම් ඇගැයීමට ලක් කෙරෙන්නේ සාධාරණ වටිනාකමකින් යුතුවය. ලාභ හෝ අලාභ හඳුනාගනු ලබන්නේ ගොවිපල ගිණුමෙනි.

2.5.3 ප්‍රවර්ථන මූල්‍ය වර්ෂය තුළ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කිරීම නිසා ප්‍රත්‍යාගණන සංචිතය රු.691,434 කින් වැඩි වී තිබේ.

3) සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති එම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කාලපරිච්ඡේදය සඳහාම අඛණ්ඩව අනුකූල වේ.

3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

3.1.1 මව් සමාගමේ සහ පරිපාලන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම ද ඇතුළත්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සකසා ඇත්තේ ඒකාබද්ධ ක්‍රමවේදයන් අඛණ්ඩව යොදාගනිමින් වාර්තාගත ප්‍රතිඵලය හා ස්කන්ධ ක්‍රමය පදනම අනුවය. ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තනි ආර්ථික ව්‍යුහයක් ලෙස පිළිඹිබු වන පරිදි ඒ පිළිබඳව මූල්‍ය තොරතුරු නිරූපණය කරනු ලබයි.

3.2 දේපළ, පිරියත හා උපකරණ

3.2.1 වත්කම්වල පිරිවැය එහි ප්‍රත්‍යාගණන වටිනාකම, ගැණුම් මිල හෝ ඉදි කිරීමේ පිරිවැය හා අදාළ වත්කම අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන පිරිවැයෙන් සමන්විත වේ. 2019.01.01 සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන ඇලවේලි හා ජලාශ අංශයට අයත් මෝටර් වාහන හැර අනෙකුත් සියලුම වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ඇතුළත් කරන ලදී.

3.2.2 ක්ෂය ප්‍රතිපාදනය සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත රේඛීය පදනමින් ගණනය කරන අතර එහිදී වත්කමක පිරිවැය එම වත්කම් වර්ගයේ ඇස්තමේන්තුගත ආයුකාලය සුදුසු කාලසීමාවක් පුරා හානිකරණය කරනු ලැබේ.වත්කමක් භාවිතය සඳහා පවතින අවස්ථාවේ ක්ෂයවීම් සිදු කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා ඇති බවට වර්ගීකරණය කරන දිනට පෙර නතර වේ. මෝටර් වාහන සම්බන්ධයෙන් පහත දක්වා ඇති ක්ෂයවීම් අනුපාත යෙදීමට පෙර 10% ක සුන්බුන් වටිනාකමක් අදාළ කරගනු ලැබේ.

3.2.3

1)	ගොඩනැගිලි – කාර්යාල	2 ½ % වාර්ෂික
	- වෙනත්	5% වාර්ෂිකව
2)	මෝටර් වාහන	20% වාර්ෂිකව
3)	දේපළ, පිරියත හා උපකරණ කාර්යාල උපකරණ සහ සුභසාධන අයිතම	15% වාර්ෂිකව
4)	දේපළ, පිරියත හා උපකරණ - ජනන යන්ත්ර	15% වාර්ෂිකව
5)	දේපළ, පිරියත හා උපකරණ - ඉදිකිරීම්	15% වාර්ෂිකව
6)	දේපළ, පිරියත හා උපකරණ - - පොදු	15% වාර්ෂිකව
7)	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10% වාර්ෂිකව
8)	පරිගණක සහ උපාංග	20% වාර්ෂිකව

3.3 ආයෝජන

3.3.1 ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජන

ආශ්‍රිත සමාගමෙහි ආයෝජනය පිරිවැය අනුව ගිණුම්ගත කර ඇති අතර ශේෂ පත්‍රයේ දිගුකාලීන ආයෝජනයක් ලෙස වර්ගීකරණය කර ඇත. ආයෝජක සමාගමේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් අධිකාරියට සැලකිය යුතු බලපෑමක් නොමැති අතර එම නිසා ස්කන්ධ ක්‍රමය අනුගමනය කිරීම අනුචිත වේ.

3.3.2 අනෙකුත් ආයෝජන

අනෙකුත් ආයෝජන ශේෂ පත්‍රයේ දිගු කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර පිරිවැයට ගණනය කර දක්වා ඇත.

3.4 භාණ්ඩ තොග

භාණ්ඩ තොග තක්සේරු කර ඇත්තේ පිරිවැය හා නිෂ්කාෂණය ශුද්ධ වටිනාකම යන දෙනෙක් අඩු වටිනාකම අනුව වේ. අවශ්‍ය තැන්හි නිකුත් නොවන, දෝෂ සහගත හා යල්පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.5 වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කොට ඇත්තේ නිෂ්කාෂනය කරගත හැකි වෙතැයි ඇස්තමේන්තු ගත වටිනාකම් මත වේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලට අයත් වන්නේ මුදල් ශේෂයන් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැංකු අයිරා ඇතුළත් වටිනාකම වන අතර එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මුදල් කළමණාකරනයේ අනිවාර්ය අංගයක් වන එය මුදල්වල සංඝටයක් ලෙස ඇතුළත් වන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහාය.

3.7 විදේශ ආධාර

ආධාර ලබා දෙන ආයතන විසින් 2012 දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද සමුච්චිත ගෙවීම්වල වාර්තා වී ඇති විදේශ ආධාර භාවිතා කිරීම. විදේශ මුදල් වලින් සිදුකරන ලද වියදම්, අදාළ ගෙවීම් සිදු කරන ලද දිනයන්හිදී පැවති විනිමය අනුපාත අනුව රුපියල්වලට පරිවර්තනය කර ඇත.

3.8 බැරකම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් යනු ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක කාලය ඇතුළත ගෙවා නිම කළ යුතු බැඳීම් වේ. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම ශේෂ පත්‍ර දිනයෙන් වසරකට වඩා කාලයක් පවතින බැඳීම වේ.
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දැන සිටි සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

3.10 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සියලුම පුද්ගලයින් සඳහා විශ්‍රාම පාරිතෝෂික ලබාදීමට ප්‍රතිපාදන සලසා ඇත. ප්‍රතිපාදන ගණනය කිරීම පදනම් වන්නේ සේවයේ පළමු වසරේ සිට ආරම්භ වන සෑම වසරකම සේවා සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ මාස භාගයක සුදුසුකම් ලැබීමේ වැටුප මතය.

3.11.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලනය යටතේ පවතින ඉඩම් බදු දීමෙන් ලැබෙන බදු කුලිය, නිල නිවාස වල කුලිය හා රාජ්‍ය භාග, ආයෝජන වලින් ලබන ආදායම සහ පොලිය යනාදියෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආදායම සමන්විත වේ.

3.11.2 එම ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලැබීමට ඇති වැඩි සම්භාවිතාව අනුව සහ එය විශ්වාසනීය ලෙස මැනිය හැකි තරමට ආදායම ගණනය කර ඇත.
අනෙකුත් කුලී, රාජ්‍ය භාග, පොලී ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ.

3.11.3 රාජ්‍ය ප්‍රදානයන් " ප්‍රාග්ධන ප්‍රදානයන් හා පුනරාවර්තන ප්‍රදානයන්" ලෙස ප්‍රකාශ කරනු ලැබේ. පුනරාවර්තන ප්‍රදානයන්, අදාළ ප්‍රදානයන් මඟින් ගෙවීමට අපේක්ෂිත පිරිවැය වියදම් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හඳුනා ගන්නා කාල සීමාවන්හි ක්‍රමානුකූල පදනමකින් යුක්තව, ලාභ අලාභ ගිණුමේ හඳුනා ගැනීම සිදු කෙරෙනු ලැබේ . වත්කම්වලට අදාළ ප්‍රාග්ධන ප්‍රදානයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත ආදායම් ලෙස නිරූපණය කරනු ලබයි. එය වත්කම්වල ඵලදායී ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමින් මූල්‍ය කාර්යඵලය ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

3.12 වියදම

ආයතනයේ එදිනෙදා මෙහෙයුම් සඳහා වැයවන වියදම්,දේපළ පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් තබා ගැනීම සඳහා වැයවන වියදම් ඇතුළු සියලු වියදම් ආදායම් ප්‍රකාශනයේ සැලකිල්ලට ගෙන වසර සඳහා ලාභය/ අලාභය ගණනය කර ඇති අතර බොල් ණය හා අඩමාන ණය, දන්නා සියලු බැරකම් හා දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් සිදු කොට ඇත.

3.13 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවුන සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අදාළ අවස්ථාවල ගැලපීම් සිදු කර ඇත.

3.14 අවිනිශ්චිත අවස්ථා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එරෙහිව ගොනු කර ඇති විවිධ නඩු සම්බන්ධයෙන් 2019.12.31 දිනට අසම්භාව්‍ය බැරකම රුපියල් 34,858 කි.

මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම
2019.12.31 දිනට වත්කම් හා බැරකම්
(ණයහිමියන් ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ)

	සටහන්	2019 රු.	2018 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	02	3	3
ආයෝජන	03	2,794,671	2,794,671
		2,794,671	2,794,671
ජංගම වත්කම්			
සිංගර් මැෂින් තොගය		29,480	29,480
පොලී ලැබියයුතු	04	380,726	380,726
පුපුරණ ද්‍රව්‍ය පාලන ගිණුම		28,336	28,336
ආදායම් බදු ආපසු	09	62,008	62,008
වෙනත් ලැබියහැකි	05	25,000	25,000
භාණ්ඩාගා. බිල්		9,825,719	9,455,896
බැංකු මුදල්	06	3,598,807	2,817,589
අතැති මුදල්		2,521	2,521
		13,910,451	12,801,556
මුළු වත්කම්		16,705,125	15,596,230
ස්කන්ධය හා බැරකම්			
ස්කන්ධය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	07	10,398,000	10,398,000
අරමුදල් ලැබීම්	08	10,150,325	10,150,325

අධිකාරියෙන් ලද මුදල		432,000	432,000
රඳවාගත් ලාභ/(පාඩු)		(4,656,408)	(5,765,303)
මුළු ස්කන්ධය		16,705,125	15,215,022
ජංගම බැරකම්			
උපචිත වියදම්	10	381,208	460,708
මුළු බැරකම්		381,208	460,70**8**
මුළු ස්කන්ධය හා බැරකම්		16,705,125	15,596,230

3.15 වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම් වත්කම්

2019.12.31 දින විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ **වේලි, ජලාශ, ඇලමාර්ග, මාවත්, වැව් හා අනෙකුත් ඉදිකිරීම් සහ ඉඩම්** වල සාරාංශය පහත දක්වා ඇත.

3.15.1 වැව් ගණන

කලාපය	**වැව් ගණන**	**වැව් ධාරිතාව (අක්කර අඩි)**	**බැම්මේ උස (මීටර්)**	**බැම්මේ දිග (මීටර්)**	**වර්ගඵලය (හෙක්)**
බී කලාපය	76	10,204	-	-	18,214
සී කලාපය	52	20,461	132	-	399
ඩී කලාපය	52	28,110	-	-	-
ජී කලාපය	17	708	277	6,567	-
එච් කලාපය	127	23,031	253	11,682	2,888
එල් කලාපය	31	30,426	-	-	-
වලව	22	54,948	-	-	-
රඹකැන්ඔය	73	48,270	-	-	-
හුරුළුවැව	13	6,511	31	-	1,090
එකතුව	**463**	**222,669**	**693**	**18,249**	**22,591**

3.15.2 ඇල මාර්ග ගණන

කලාපය	බෙදුම් ඇල (කිමී)	ක්ෂේත්‍ර ඇල (කිමී)	ප්‍රධාන ඇල (කිමී)	ශාඛා ඇල (කිමී)
බී කලාපය	480	1,265	53	66
සී කලාපය	560	1,326	29	125
එච් කලාපය	363	1,212	103	80
එල් කලාපය	50	100	610	(ජලාපවහන ඇල)
වලව	416	1,324	90	106
හුරුළුවැව	100	212	34	4
එකතුව	**1,969**	**5,439**	**919**	**381**

3.15.3 මාර්ග

මාර්ග	එල් කලාපය (කිමී)	වලව (කිමී)	බී කලාපය (කිමී)
ප්‍රධාන මාර්ග	100.0	51.0	549.0
ග්‍රාමීය මාර්ග	250.0	-	-
වෙළඳ පොල මාර්ග	12.5	-	-
කෘෂි මාර්ග	25.0	-	-
පාලම්	5.0	-	-
බෝක්කු	125.0	-	-
සපත්තු පාලම්	10.0	-	-
මුළු	**527.5**	**51.0**	**549.0**

3.15.4 ජල සැපයුම සහ ලිං

ළිං	එල් කලාපය (ගණන)	හුරුළුවැව (ගණන)
පානීය ජල ළිං	350.0	-
වගා ලිං	150.0	297.0
බෝර වළ	100.0	-
උඩිස් ටැංකි	100.0	-
ප්‍රතිවර්තන ආස්‍රැති යන්ත්‍රය	-	1.0
නල ළිං	-	48.0
මුළු	**700.00**	**346.0**

3.15.5 වේලි ගණන

වේලි	(පිරිවැය රු. බිලියන)
කොත්මලේ	13.0
වික්ටෝරියා	9.8
රණ්දෙනිගල	5.8
රන්ටැඹේ	3.2
පොල්ගොල්ල	0.09
බෝවතැන්න	0.05
මිණිපේ	0.65
රත්කිඳ	1.9
මාදුරු ඔය	2.6
උඩවලවේ	0.14
චන්ද්‍රිකා වැව	0.08
මොරගහකන්ද	45.3
මුළු	**82.61**

3.15.6 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම්

කලාපය	මුළු ඉඩම් (හෙක්)	විකිණූ ඉඩම් (හෙක්)	ඉතිරි ඉඩම් (හෙක්)
බී කලාපය	95,687.0	28,448.0	67,239.0
සී කලාපය	52,564.0	41,024.0	11,540.0
ඩී කලාපය	16,396.0	1,597.0	14,799.0
එච් කලාපය	80,803.0	33,191.0	47,612.0
ජී කලාපය	11,940.0	9,560.0	2,350.0
එල් කලාපය	37,338.0	4,762.0	32,576.0
වික්ටෝරියා	311,118.0	3,384.0	307,734
වලව	57,775.0	34,506.0	23,269.0
හුරුළුවැව	9,704.0	6,904.0	2,800.0
රඹකැන්ඔය	134,002.0	6,111.0	127,891
මුළු	**807,327.0**	**169,517.0**	**637,810.00**

විගණකාධිපති වාර්තාව

111 කොටස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IEN/B/MASL/01/19/21 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2020 නොවැම්බර් 25 දින

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්ද ඇතුලත් සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්ද ඇතුලත් සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම්ද ඇතුලත් සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතද අනුගමනය කර තිබුණද සමාගම් විසින් අනුගමනය කරන ලද පදනම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරවිකර නොතිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.13,010,825 ක අවිනිශ්චිත ගිණුම පිළිබඳ පරීක්ෂා කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල එම අවිනිශ්චිත ගිණුමේ ශේෂය ණයගැනියන් ලෙස දක්වා තිබුණි.

(ඇ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (අ) වගන්තිය ප්‍රකාරව විගණනය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. මෙම නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කිරීමේදී විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ඈ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සටහන් අනුව රු බිලියන 82.61 ක පිරිවැය වූ ප්‍රධාන වේලි 12 ක් සහ කි.මී 919 ක ප්‍රධාන ඇලමාර්ග, කි.මී 7,789 ක සෙසු ඇල මාර්ග, වැව් 463 ක් හා කි.මී 1,127.5 ක පාරවල් මහවැලි අධිකාරිය විසින් නඩත්තු කරමින් පැවතියද එම වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම 2018 දෙසැම්බර් 21 දින අධිකාරිය විසින් භාරගෙන තිබුණු මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) 2015 – 2018 කාලය තුළ රු. 80,000,000 ක වියදමින් වැලිකන්ද සහ වැලිඔය කලාපවල ඉදිකර තිබුණු ජලපිරිපහදු යන්ත්‍ර 30 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය විසින් අධිකාරියට ඉදිකරදී තිබූ පිරිවැය රු. 499,421,968 ක් වූ කොත්මලේ හා පොල්ගොල්ල කාර්යාල ගොඩනැගිලි අධිකාරිය විසින් 2019 වර්ෂයේ සිට භාවිතායට ගෙන තිබුණද, එම කාර්යාල ගොඩනැගිලි අධිකාරියේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව ප්‍රමාණාත්මක පූර්ව කාල පරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවද මොරගහකන්ද ජල විදුලිබලාගාරවලින් පෙර වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු. 496,770,000 ක ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමේදී එලෙස සිදු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් ලැබිය යුතු රු. 22,557,702 ක රාජ්‍ය භාග ආදායම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(එ) වැඩ අවසන් කර නොතිබුණු වලව කලාපයේ මුරවැසිහේන කොට්ඨාස කාර්යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරා තිබුණු රු. 3,518,278 ක මුදල කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වියදමක් ලෙස කපාහැර තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 210,567,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සහ ඊට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාල දේපල පිරියත හා උපකරණ පංතියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද, 2019 ජනවාරි 01 දින සිදුකර තිබුණු අධිකාරියේ මෝටර් රථ ප්‍රත්‍යාගණනයේදී ප්‍රමිතයේ නියමයන්ට පටහැනිව නඩත්තු අංශයේ සහ ප්‍රධාන කාර්යාලයේ පැවති පිලිවෙලින් පිරිවැය රු. 175,599,150 ක් හා රු. 60,648,350 ක් වූ මෝටර්රථ ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඕ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් අධිකාරිය වෙත ලබා දී තිබුණු වත්කම්වල තක්සේරු වටිනාකම රු. 14,040,500 ක් වූවද එය රු. 26,533,300 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණු අතර රු. 1,800,000 ක් වූ වත්කමක් රු. 18,000,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතු නිසා දේපළ පිරියත හා උපකරණ රු. 28,692,800 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වුණි.

(ක) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු. 671,503,748 ක් වූ ස්ථාවර වත්කම් කොටසක් රු. 478,699,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකර තිබුණද ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම මෙම වත්කම්වල වටිනාකම ප්‍රදානයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, ණයහිමියන් යටතේ රු. 398,346,892 ක් ලෙස රු. 80,352,108 ක් අඩුවෙන් වගකීම්වලට එකතු කර තිබීම නිසා ප්‍රදානය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ කළමනාකරණ පහසුකම් යටතේ විවිධ කොන්ත්‍රාත්වලින් අධිකාරියට ලැබී තිබුණු රු. 4,369,384 ක වත්කම්ද ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ග) අධිකාරියේ දේපල පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපත්තියට අනුව මෝටර් රථ ක්ෂය කළ යුත්තේ සියයට 10 ක සුන්බුන් අගයක් අඩුකිරීමෙන් පසුව වුවද, කලාප 6 ක් විසින් එසේ සිදුකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු. 6,116,990 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඝ) සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් ශේෂයන් 07 කට අදාල මුළු එකතුව රු. 2,199,131,679 වටිනාකම හා ඊට අනුරූපිව අධිකාරියේ පරිපාලිත සමාගම් හා කලාප පවත්වාගෙන ගිය ගිණුම් අනුව වූ ශේෂයන්ගේ එකතුව රු. 2,182,422,219 ක් වූයෙන් වටිනාකම් අතර රු. 16,709,460 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වූවත් මෙම වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ච) රු. 20,477,000 ක ආයෝජනවලට අදාල කොටස් සහතික සහ රු. 3,360,389 ක ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පතුවලට අදාල ශේෂ සනාථ කිරීම් හා තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඩ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකිය යුතු තරම් වෙනස්වන හා ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්තවන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කළයුතු වූවත්, අධිකාරිය විසින් 1984 - 1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු. 64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ඒවායේ පිරිවැය හෝ ගිණුම්ගත කර නොතිබුණි.

(ත) පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උපදෙස් මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකැසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙලිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යූහය සහ අන්තර්ගතය ඇගැයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2(අ),(ක),(ඩ) සහ (ත) ඡේදවල ඇතුලත් නිර්දේශයන් හැර අනෙකුත් නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති/විධානයට යොමුව	විස්තරය
(අ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය	මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 152 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 1,920 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2019 මාර්තු 24 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වක්‍රලේඛයේ 2.3.3 ඡේදය	නිලධාරියෙක් ව්‍යාපෘතියකට නිදහස් කළ හැක්කේ රජයේ අවශ්‍යතාවය මත පූර්ණකාලීන පදනමින් අවුරුදු 05 ක් හෝ වැටුප් රහිත පදනම මත සේවකයාගේ ඉල්ලීම අනුව අවුරුදු 05 ක් සඳහා පමණි. නමුත් අධිකාරියේ නිලධාරීන් 37 දෙනෙකු වසර 05 කට වැඩි කාලයක් තිස්සේ ව්‍යාපෘතිවල සේවය කර තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ ස්ථිර තනතුර දීර්ඝ කාලයක් පුරා පුරප්පාඩුවී පැවතුණි. තවද නිලධාරීන් 33 දෙනෙකු මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ සේවය සඳහා ස්ථාන මාරු යටතේ පූර්ණකාලීන වැටුප් සහිතව අනුයුක්ත කර තිබුණි.
(ඇ) අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර වක්‍රලේඛයේ 05 වගන්තිය	අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවසන් වී දින 07 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු.167,329,000 ක සැපයුම් අත්තිකාරම් විය.
(ඈ) මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛය (i) 2 වගන්තිය	රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනයේ නමින්ම ලියාපදිංචි කර තිබීම අනිවාර්ය වූවත්, අධිකාරිය විසින් භාවිතා කරන රජයට අයත් වාහන 56 ක් අධිකාරියේ නමින් ලියාපදිංචි කර නොතිබුණි.

	(ii) 2.3 (අ)සහ (ආ) වගන්ති	රජයේ ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති වාහන සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා බදු රහිතව ආනයනය කර ඇති වාහන භාවිතා කිරීමේදී ලියාපදිංචි අයිතිය ලබාගැනීමට කටයුතු කළයුතු වූවත්, එසේ බදු රහිතව ආනයනය කර තිබුණු වාහන 16 ක ලියාපදිංචි අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි.
(ඉ)	මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 2 (ආ) වගන්තිය	ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියළුම වාහන 2018 ජූනි 30 දිනට පෙර අපහරණය කළ යුතු වූවත් අධිකාරිය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඊ)	1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 217 (2) (vi) වගන්තිය	වාණිජ හෝ කාර්මික කටයුතු සඳහා ඉඩම් බදු දීමේදී වෙළඳපළ වටිනාකම තක්සේරු කර බදු මුදල් අයකළ යුතු වූවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල ඉඩම් කැබලි 18 ක් කළුගල් කැඩීම සඳහා බදු පදනමට බැහැර කර තිබුණද 2020 පෙබරවාරි 27 වූ විගණිත දිනය දක්වා එම කිසිදු ඉඩමක් මැනීම් කර ඒවායේ රජයේ තක්සේරු අගය මත බදු මුදල් අයකර නොතිබුණි.
(උ)	2019 මාර්තු 21 දිනැති අංක LUP/01/01/2019 දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර වක්‍රලේඛය	
	(i) උපලේඛන (i) හි 1.6 වගන්තිය	භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ගෙවනු ලබන කැනීම් පරිමාව මත පදනම්ව ඉඩම් පරිහරණ ගාස්තු අය කළ යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් එලෙස භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට රාජ්‍ය

		භාගය ගෙවන ලද කැනීම් ප්‍රමාණයන් සහනික කරගැනීමකින් තොරව බලපත්‍රලාභියා විසින් ඉල්ලුම්කරන කියුබ් ප්‍රමාණය සඳහා පමණක් ඉඩම් පරිහරණ ගාස්තු අයකර තිබුණි.
	(ii) උපලේඛන (i) හි 1.8 වගන්තිය	කැනීම් සිදුකරන ලබන ස්ථාන අබණ්ඩව අධීක්ෂණය සඳහා කොටියාශ මට්ටමින් නිරීක්ෂණ කමිටු පත්කිරීම හා සති 2 කට වරක් ක්ෂේත්‍රය නිරීක්ෂණය කර දිනකට නිස්සාරණය කරනු ලබන ඛනිජ ප්‍රමාණය ඇතුළත් නිරීක්ෂණ වාර්තා අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) වෙත යොමුකිරීම් කල යුතු වුවත් තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් එපරිදි කටයුතු සිදු කර නොතිබුණි.
(ඌ)	මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2020 ජනවාරි 03 දිනැති වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක 01/2017(1)	රජයේ ආයතන විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු 2019 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර 2020 ජනවාරි 20 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එවි කලාපය, ඊ කලාපය, මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය හා එල් කලාපය විසින් ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(එ)	කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දින නිකුත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශයේ 2.1 ඡේදය	රජයට අයත් සියලුම ඉඩම් තක්සේරු කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එහිදී රජයේ කාර්යාල, නිවාඩු නිකේතන, වැඩපලවල් ආදිය පිහිටා ඇති රජයේ ඉඩම් තක්සේරු කර ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාල, නිවාඩු නිකේතන හා වැඩපලවල්

ආදිය පිහිටි ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2017 මැයි 09 දිනැති අංක ඩීජී/05/2017 දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර වක්‍රලේඛය

(I) ඒ - 3 හා සී - 1 වගන්ති — තලාව කොට්යාශ කාර්යාලය විසින් නිල නිවාස හා ගොඩනැගිලි කාණ්ඩගත කර ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර නොතිබුණි. පවත්වාගෙන යාම ආර්ථික වශයෙන් ඵලදායී නොවන නිවාස හෝ ගොඩනැගිලි නිසි පරිදි හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. වල් වැදී අත්හැර දමන ලද නිල නිවාස 4 ක් දක්නට තිබුණි.

(II) බී- 1 වගන්තිය — බාහිර පාර්ශවයන් වෙත නිල නිවාස ලබාදීමේදී කුලී හෝ බදු පදනම මත විධිමත්ව හා ගිවිසුම්ගතව පමණක් ලබාදිය යුතු වුවත් තලාව කඳවුරේ නිල නිවාස 6 ක් බාහිර පාර්ශවයන් වෙත ගිවිසුම්ගත වීමකින් තොරව ගාස්තු රහිතව ලබා දී තිබුණු අතර විගණන පරීක්ෂණ අවස්ථාවේදී ඉන් එක් නිල නිවාසක් මහවැලි අධිකාරියේ අවසරයකින් තොරව අළුත්වැඩියා කරමින් පැවතුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2015 වර්ෂයේ මිලදී ගත් වගකීම් කාලසීමාවද ඉක්මවා නොතිබුණු වායුසමීකරණ යන්ත්‍ර 21 ක් මිලදීගත් ආයතනය මඟින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර භාවිතයෙන් ඉවත්කර එම ආයතනයෙන්ම සමාලෝචිත වර්ෂයේදී රු.3,367,971 කට වායුසමීකරණ යන්ත්‍ර 22 ක් නැවත මිලට ගෙන තිබුණි. එසේම මෙම මිලදීගැනීම් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කරද නොතිබුණි.

3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) රඹකැන්ඔය කලාපයේ පොල්ලේබැද්ද නිල නිවාසය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.4,861,105 ක කොන්ත්‍රාත් ගිවිසුමටකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු. 1,243,051 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් කාලය අවස්ථා 2 ක 2018 දෙසැම්බර් 28 දක්වා දීර්ඝකර තිබුණද එදිනට වැඩ නිමකර නොතිබුණි. 2018 නොවැම්බර් 20 දින කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය අවසන් වී තිබුණද එහි වලංගු කාලය දීර්ඝකරගෙන නොතිබුණි. 2019 මාර්තු 14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර ප්‍රමාද ගාස්තු රු.486,110 ක් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවනලද රු.1,402,376 ක් 2020 අගෝස්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණි. කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රඹකැන්ඔය කලාපයේ මහඔය නිල නිවාසයක ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.4,843,185 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.1,414,555 ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2019 මාර්තු 14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. කාර්යසාධන ඇපකරයේ හා අත්තිකාරම් ඇපකරයේ කාලය 2018 සැප්තැම්බර් 15 දින අවසන් වී තිබුණද ඒවායේ කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රු. 1,242,997 ක මුදලක් 2020 අගෝස්තු 17 දින වන විටත් අයකරගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රඹකැන්ඔය කලාපයේ කාමර 10 කින් සමන්විත සාද නිවාසයක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.13,837,634 කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර කාර්යසාධන ඇපකරයේ හා අත්තිකාරම් ඇපකරයේ කාලය 2019 පෙබරවාරි 28 දින අවසන් වී තිබුණද ඒවායේ කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ලබා දී තිබුණු වැඩ ආරම්භ කිරීමේ

අත්තිකාරම් මුදලින් රු. 1,311,158 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අංක: ICTAD/SBD/01 දරන ප්‍රකාශනයේ 59.2 වගන්තිය ප්‍රකාරව ඉංජිනේරුවරයාගේ අවසරයකින් තොරව දින 28 ක් පුරාවට වැඩ නවතා ඇති ඉදිකිරීමකට අදාලව කොන්ත්‍රාත්කරුගේ සේවය අවසන් කළයුතු වූවද අධිකාරිය විසින් 2020 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) වලව කලාපයේ මුරවැසිගේන කොට්ඨාශ කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ රු. 14,757,550 කට ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස රු.4,323,015 ක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2020 ජනවාරි 22 කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත නැවත සති 6 ක් කල් දී තිබුණි. 2020 අගෝස්තු 17 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරුගෙන් රු.3,150,256 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයවිය යුතුව පැවතුණි.

(ඉ) 2017 වර්ෂයේ රු. 8,550,788 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය සතු දොඹකර යන්ත්‍රයක් නිසි පරිදි අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් 2018 සිට 2020 මැයි දක්වා නිශ්කාර්යව පැවතුණි.

(ඊ) කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පැරණි වේලි ආදර්ශනය ඉවත්කර තිබුණු අතර නව වේලි ආදර්ශනයක් සැකසීම සහ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 වර්ෂයේ රු.6,990,000 කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණද රු.2,060,000 ක් වැය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු වේලි ආදර්ශනය 2020 මැයි වන විටත් අවසන් කර නොතිබුණි.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 35 න් 16 ක් පුරප්පාඩුව පැවතුන අතර ඉන් 12 දෙනෙකු වැඩ බැලීම් රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් කාර්යය පැවරුම් හා ද්විතීයන පදනම් මත පුරප්පාඩු තනතුරුවල රාජකාරී ඉටුකරගෙන තිබුණි. අධිකාරිය විසින් වරින් වර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණද බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැති බැවින්, පුරප්පාඩු දීර්ඝ කාලයක් පුරා සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණි. තවද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 148 ක් හා මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 349 ක් පැවතුණි.

(ඌ) අධිකාරිය සතු වාහන 11 ක් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. 2016 වර්ෂයෙන් පසු වාහන අපහරණය කිරීමක් සිදුකර නොතිබුණු අතර අපහරණය කළ යුතු වාහන නිසි අවස්ථාවේදී අපහරණය නොකිරීම නිසා වාහන 64 ක් රු.1,577,100 ක තක්සේරු මුදලකට සුන්බුන් ලෙස අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි.

(එ) අධිකාරියේ ගොවිපළවල්වල පවතින සංවර්ධනය නොකල උස් බිම් පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම උදෙසා දීර්ඝකාලීන බදු පදනමින් වෙන්දේසි කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2019 ජූනි 18 දින ලබා දී තිබුණි. ඒ අනුව එම ගොවිපළවල් සතු සංවර්ධනය නොකළ උස්බිම් ඉදිරි මහ කන්නයේදී වගා කළ හැකි පරිදි වෙන්දේසි කිරීමට කටයුතු කරන ලෙස අදාල නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත දන්වා තිබුණද නිරාවිය, නොච්චියාගම සහ කලංකුට්ටිය ගොවිපලවල් සතු එකතුව හෙක්ටයාර් 53.4 ක් වූ උස් බිම් 2020 පෙබරවාරි වන විටත් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) අධිකාරිය විසින් ජී.එස්.එම්.බී. තාක්ෂණ සේවා (පුද්) සමාගම සමඟ 2019 අප්‍රේල් මස මාස 6 ක් සඳහා ගිවිසුම් ගත වී කන්තලේ සූරියපුර තුම්මෝදර වැලි නිධියෙන් වැලි කියුබ් 103,128 ක් ඉවත්කර රු.61,876,800 ක ආදායමක් ඉපයීමට අපේක්ෂා කර තිබුණද 2019 දෙසැම්බර් 31 වන විට උපයා තිබුණේ රු.12,969,960 ක ආදායමක් පමණි. ගිවිසුමේ 4 වගන්තිය ප්‍රකාරව ලබාගෙන තිබුණු රු. 30,000,000 ක බැංකු ඇපකරය 2019 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණද 2020 අගෝස්තු 19 වූ විගණිත දිනය වනවිටත් ඇපකරයේ කාලය දීර්ඝකරවාගැනීමකින් තොරව ඒ වෙනුවට ඉදිරි මාසයේ වැලි කැනීම් කියුබ් 24,000 ක් සඳහා රු.14,400,000 ක මුදලක් ලබාගෙන ගිවිසුම් නැවත අළුත් කර තිබුණි.

(ඔ) 2018 වර්ෂයේ මැයි සිට විදුලි ජනනය සිදු කර තිබුණු මොරගහකන්ද ජල විදුලි බලාගාර තුනේ ආදායම් 2019 වර්ෂයේ අධිකාරියේ ආදායම් ඇස්තමේන්තුවලට ඇතුලත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල එම බලාගාර වලින් රු. මිලියන 647 ක් උපයා තිබුණි. විදුලි බලාගාරවල නඩත්තු වියදම් සඳහා අරමුදලක් ඇතිකර නොතිබුණු අතර ආදායමෙන් කිසිදු ප්‍රතිපාදනයක් හෝ සිදු කර නොතිබුණි. ඉන් රු. මිලියන 200 ක් 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අතැති බිල්පත් ගෙවීම සඳහා නැවත ලබාගැනීමේ පදනමින් රජයේ ආදායමට බැර කර තිබුණද සෙසු මුදල් අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි.

(ඕ) තලාව කඳවුරු භූමියෙන් 40 දෙනෙකුගෙන් යුත් තේරීම්ලාභී ලැයිස්තුවක් සඳහා ඉඩම් ලබාදීමට සැලසුම් කර තිබුණද 43 දෙනෙකු වෙනුවෙන් ඉඩම් මැනුම් කරවාගෙන තිබුණි. මුල් තේරීම්ලාභී ලැයිස්තුවේ නම් සඳහන් නොවූ පස් දෙනෙකු වෙත ඉඩම් මැනුම් කර තිබුණු අතර මුල් තේරීම්ලාභී ලැයිස්තුවේ 2 කු වෙත ඉඩම් මැනුම් කර නොතිබුණි. තලාව කඳවුරු භූමියේ මහවැලි අධිකාරියේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු සඳහා ඉඩම් කැබලි හාරදී තිබුණු අතර, විගණිත දිනය වූ 2020 ජූලි 07 දක්වාම එම ඉඩම් විධිමත්ව අදාල තේරීම්ලාභීන් වෙත බැහැර කර නොතිබුණි. ඉන් ඉඩම් කට්ටි 15 ක් අවිධිමත්ව අන්සතු කර තිබුණද අනවසර භුක්තිය ඉවත්කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඉඩම් තේරීමකර වර්ෂ 12 කට අධික කාලයක් ගත වී තිබුණද එක් ඉඩමක් හැර ඉතිරිය නේවාසික කටයුතු සඳහා භාවිතා කර නොතිබුණු අතර ඉඩම් වල් බිහි වී තිබුණි.

(ක) තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ බල ප්‍රදේශය තුල පිහිටි කළුගල් කැනීම් බලපත්‍ර 8 ක නියැදි පරීක්ෂාවේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කළුගල් කියුබ් 75,973.8 ක් සඳහා රාජ්‍ය භාගය ගෙවා තිබුණද මහවැලි අධිකාරියේ තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් ගාස්තු අයකර තිබුනේ කළුගල් කියුබ් 8,369.5 ක් සඳහා පමණි. ඒ අනුව ඉපයිය හැකිව තිබුණු රු.66,127,150 ක ආදායමක් අහිමි වී තිබුණි

(ග) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 6 සහ 7 වගන්ති ප්‍රකාරව අධිකාරිය විසින් ආදායම් බදු ගෙවිය යුතු වුවත් ආදායම් බදු ගෙවා නොතිබුණි. ආදායම් බද්දෙන් නිදහස් බව සනාථ කිරීමට අවශ්‍ය ලේඛණ විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තවද සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් උපයන රාජ්‍ය භාග ආදායම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.36,823,372 ක රඳවාගැනීමේ බද්දක් ගෙවා තිබුණද ඒ සඳහා වන බදු අඩුකිරීමේ සහතික පත් ලබාගෙන නොතිබීම හේතුවෙන් අනාගතයේදී ආදායම් බද්දට යටත් වුවහොත් බදු සහනය ලබා ගැනීමට නොහැකි වීමේ තත්ත්වයක් පැවතුණි.

(ච) මහවැලි ජනපදිකයින්ට ණය ලබාදීම සඳහා වක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2002 වර්ෂයේදී රු.මිලියන 48 ක් ද, 2009 වර්ෂයේදී රු. මිලියන 50 ක් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද 2020 වර්ෂය දක්වාම ණය ලබාදීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු. මිලියන 160.4 ක් වූ අතර සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අරමුදල් දීර්ඝකාලයක් බැංකුවේ රඳවා තැබීම අනාර්ථික කටයුත්තක්වී තිබුණි.

(ඡ) ජාවත්ත පරිශ්‍රයේ පිහිටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් සඳහා තක්සේරු වාර්තා අනුව අයකර ගතයුතු කුළිය අයකර ගන්නා ලෙස දන්වා තිබුණද, රු.70,224,000 ක් 2019 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. අධිකාරිය විසින් එම ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණු රු.27,027,871 ක් අදාල පාර්ශව වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඣ) අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බැවින්, එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙන මෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද එම ඉඩම් පැවැරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත්වී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම

IV කොටස

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක: 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.
இலங்கை மகாவலி அதிகாரசபை
இல : 500, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10.
Mahaweli Authority of Sri Lanka
No: 500, T.B. Jayah Mawatha, Colombo 10, Sri Lanka.

දුරකථනය தொலைபேசி Telephone 011-2687491-5
ෆැක්ස් අංකය பெக்ஸ் இல. Fax No. 011-2687391 011-2687240
විද්‍යුත් තැපෑල් மின்னஞ்சல் E-mail dgmasl@sltnet.lk dg@mahaweli.gov.lk
වෙබ් අඩවිය இணையத்தலம் Website www.mahaweli.gov.lk

IEN/B/MASL/01/19/21

2021.09. 14

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දූව පාර ,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම් වල 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද ඔබගේ අංක IEN/ B/ MASL/ 01/ 19 /21 හා 2020.11. 25 දිනැති 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ පිළිතුරු පහත සඳහන් පරිදිවේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ). පිළිගනිමි. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ආ). මෙම අවිනිශ්චිත ගිණුමේ ශේෂය 2004 වර්ෂයේ සිටම පැවත එන ශේෂයන් වන අතර මිලියන 33 ක පමණ ශේෂයෙන් වර්තමානය වන විට මිලියන 13 දක්වා නිවැරදි කර ගැනීමට හැකි වී ඇත. වර්තමානයේ මූල්‍යමය කටයුතු මෙන්ම මෙහෙයුම් හා පරිපාලනය ආදී සියලු කාර්යයන් ඉටු කිරීමට මෙම සමාගමේ සිටින එකම නිලධාරියා "ගණකාධිකාරීවරයා "පමණක් වන අතර වෙනත් කිසිදු නිලධාරියෙකු හෝ සහායක කාර්ය මණ්ඩලයක් සේවයේ නිරතව නොමැත. අනෙකුත් සියලුම කාර්යයන් කරන අතරතුර මෙම ශේෂය නිවැරදි කර ගැනීමේ කාර්යද ඔහු විසින් සිදු කරයි.

මෙම වර්ෂයේදී රුපියල් මිලියන 1 ක පමණ ශේෂයන් නිවැරදි කර ගැනිමට හැකිවී ඇත. ඉදිරියේදි මෙම ශේෂය නිවැරදි කර ගැනිමට කටයුතු කරමි.

(ඇ). මෙම සමාගම සඳහා 2020 වර්ෂයේ අග භාගය දක්වා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබු අතර රේඛිය අමාත්‍යාංශයේ ලේකම් විසින් සමාගමේ කටයුතු කරගෙන යාම සඳහා " නිසි බලධාරියෙකු" පත්කර ඇත. එහෙත් මහවැලි උපදේශක සේවා කාර්යංශය (පෞද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (අ) වගන්තිය ප්‍රකාරව 2020 ජුනි මස 24 වන දින " නිසි බලධාරියෙකු" ගේ අනුමැතිය යටතේ විගණනය වෙත මූල්‍ය වාර්තා ඉදිරිපත් කලද එම මූල්‍ය ප්‍රකාශන "නිසි බලධාරියාගේ" අනුමැතියෙන් හාරගැනීම විගණනය විසින් ප්‍රතික්ෂේප කර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය කළ හැක්කේ අධ්‍යක්ෂක මණ්ඩලයක් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන පමණක් බව 2020 ජූලි මස 17 වන දින සමාගම වෙත ලිඛිතව දන්වා ඇත. කෙසේ නමුත් මෙම සමාගම සඳහා 2021 වර්ෂයේ ජනවාරි මාසයේ දී නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කර සමාගමේ කටයුතු පවත්වාගෙන යන බව දන්වමි.

(ඈ). ප්‍රධාන ඇල වේලි, ඇල මාර්ග, සෙසු ඇල මාර්ග හා වැව් වල පිරිවැය රු.බිලි: 82.61 ක් වශයෙන් 2019 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති සටහන්වල **(Notes)** දක්වා ඇත. එම ස්ථාවර වත්කම් තක්සේරු කර ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන වල ගැලපිම් කිරිමට කටයුතු කරමි.

මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දි තිබු රු. 49,106,673,124 ක් වටිනා මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ වත්කම් හා ඊට අදාල ගැලපිය යුතු ක්ෂය සමඟ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර ඇත.

(ඉ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "එල් කලාපය " හා "බී කලාපය " තුල ඉදි කරන ලද රු .මිලි. 80 ක් වටිනා ජලපිරිපහදු යන්ත්‍ර 30, අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දි ඇති අතර 2020 වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වලට ගැලපිම් කර ඇත.

(ඊ). වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොල්ගොල්ල හා කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලවල ඉදිකරන ලද ගොඩනැගිලි වල වටිනාකම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපිම් කර ඇත.

(උ). පෙර වර්ෂයට වන ගැලපීම මත ලාභයට සිදුවන බලපෑම 2020 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනම පෙන්විමට කටයුතු කර ඇත.

(ඌ). සමාලෝචිත වර්ෂයට අදාල අවසන් ගිණුම් පිළියෙල කරන අවස්ථාවේ දී කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වලින් ලැබූ ආදායම් ලෙස රුපියල් 65,017,306.02 ක මුදලක් සටහන් කල අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවීම් කිරීමේ දී රුපියල් 81,836,484.32 ක මුදලක් ලැබී ඇත. එම වෙනස 2020 වර්ෂයේ දී ජර්නල් සටහනක් මගින් දැනටමත් නිවැරදි කර ඇත.

(එ). මුරවැසිහේන කොට්ඨාශ කාර්යාලය ඒ වන තෙක් ද ඉදිකර අවසන් වී නොතිබූ බැවින් එහි වියදම් "ප්‍රග්ධන නොනිමි වැඩ "ලෙස අදාල ගිණුම් සටහන් පිළියෙල කර 2020 වර්ෂයේ දී ගිණුම් සමග නිවැරදි කර ඇත.

(ඒ). ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කල ආකාරය "ගිණුම්කරණ සටහනක් " මගින් 2019 12.31.දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග ද හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ඔ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනෙකුත් කාර්යාලවලට සාපේක්ෂව ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය කාර්යභාර ඉංජිනේරු කාර්යාල දිස්ත්‍රික්ක කිහිපයකට ව්‍යාප්තව ඇති අතර, මෝටර් රථ ප්‍රත්‍යාගණනය සඳහා එම දිස්ත්‍රික්කවල මෝටර් රථ පරීක්ෂක මහතුන් සහභාගි කරවා ගත යුතුවේ. ඔවුන් සහභාගි කරවා ගැනීමට ඔවුන්ගේ රාජකාරි බහුලත්වය මත අපහසු විය. කෙසේ නමුත් මේ වන විට සියලුම කාර්යභාර ඉංජිනේරු කාර්යාලවල ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර ඇත.

(ඕ). 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ක). වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති වත්කම් වල “ණයභිමියන් "ලෙස දක්වා ඇති වටිනාකම රු. 398,346,892 ක වටිනාකම හා ප්‍රත්‍යාගණිත වටිනාකම වූ රු 478,699,000. අතර වෙනස වූ රු. 80,352,108 ක වටිනාකම අදාල කලාප වෙත දැනුවත් කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් විවිධ කොන්ත්‍රාත්වලින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ලබා දී ඇති රු. 4,369,384 ක වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත විධිමත් පරිදි වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මගින් භාර දී නොමැති බව දන්වමි.

(ග) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සි කලාපය , එච් කලාපය, තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල, වලව කලාපය, වික්ටෝරියා කලාපය, පරිසර හා වන සංරක්ෂණ අංශය යන කලාප හා අංශ 06 මෝටර් රථ ප්‍රත්‍යාගණනය සිදු කර එම වටිනාකමෙන් ක්ෂය වීම් අඩු නොකර වටිනාකම ගිණුම් ගත කර ඇති බැවින් එම දෝෂය නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇත.

(ඡ). <u>මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජන</u>

පිළිගනිමි. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මගින් අදාල නිවැරදි කිරීම් සිදු කර ඇත.

(ට). මේ පිළිබඳ සොයා බලා ඉදිරියේ දී ඉදිරිපත් කිරිමට කටයුතු කරමි.

(ඩ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වටිනාකම රු 64,320,853 කට මිල දී ගත් කොළඹ 10, ටී.බී.ජයා මාවතේ අංක, 500 හා අංක 493 දරණ ඉඩම් කට්ටි 02 හි තක්සේරු වටිනාකම ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එම තක්සේරු වටිනාකම් ලද පසු ගිණුම් ගත කිරිමට කටයුතු කරමි.

(ත). 2019.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ මේ පිළිබඳ හෙළිදරව් කර ඇති අතර එලෙස ගිණුම්ගත කිරිමට කලාපය /අංශ දැනුවත් කිරිමට ද කටයුතු කර ඇත.

<u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

(අ). එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරිමට මූලික කටයුතු කරමින් පවතී.

(ආ). මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතිය ආරම්භ වූ මුල් කාලයේදී එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් බැවින් අධිකාරියේ නිලධාරීන් නිදහස් කිරීමේදී එය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහනක් ලෙස සලකා නිලධාරීන් අනුයුක්ත කර ඇත. නමුත් පසුකාලීනව උක්ත ව්‍යාපෘතිය රේඛීය අමාත්‍යාංශය යටතේ සෘජුව ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් බැවින් ව්‍යාපෘතිය වෙත නිලධාරීන් නිදහස් කිරීමේදී කළමනාකරණ සේවා වක්‍රලේඛ 01/2019 හි විධිවිධානයන්ට අනුව අදාල නිලධාරීන් / සේවකයින් නිදහස් කිරීම සිදුකරන ලදී. එසේම මේ වන විට අවසන් අදියරේ ක්‍රියාත්මක වන මොරගහකන්ද-කළුගඟ සංවර්ධන

ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු අවසන් වීමේ ස්වභාවය අනුව සේවා අවශ්‍යතාවය ඉක්මවා පවතින අතිරික්ත කාර්ය මණ්ඩල නැවත ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථාන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

එසේම වසර 05 ඉක්මවා ඇති සෙසු ව්‍යාපෘති කාර්ය මණ්ඩල මේ වන විට නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයට කැඳවීම සිදු කර ඇති අතර ඒ අනුව ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කලමනාකරණ නව ව්‍යාපෘතියේ ප්‍රාරම්භක කටයුතු වෙනුවෙන් රැදී සිටින ලද කාර්ය මණ්ඩලයද නැවත අධිකාරි සේවයට කැඳවන ලදී. එමෙන්ම දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ සේවයේ නියුතු වසර 05 ඉක්මවා ඇති කාර්ය මණ්ඩල ද මේ වන විට නැවත අධිකාරියේ සේවයට කැඳවා ඇත.

(ඇ). මෙම ශේෂයන් පිළිබඳ කලාප / අංශ වෙතින් උපලේඛණ ලබා ගෙන ගිණුම්කරණ දෝෂ පැවති අගයන් නිවැරදි කිරීමටද ලැබිය යුතු ශේෂයන් පිළිබඳ අදාල ආයතන හා පුද්ගලයන්ට ලිපි මඟින් දන්වා අය කර / පියවීම් කර ගැනීමටද කටයුතු කර ඇත.

(ඈ). (i) මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුල මහවැලි කලාප තුල එවකට කටයුතු කරන ලද විදේශ ආයතන විසින් ව්‍යාපෘති සඳහා ගෙන්වන ලද තීරු බදු නිදහස් වාහන එම ව්‍යාපෘති අවසන් වූ පසු මහවැලි අධිකාරිය වෙත භාර දී ඇත. මෙම තීරුබදු නිදහස් වාහන අධිකාරිය වෙත පවරා ගැනීමේ දී ශ්‍රී ලංකා රේගුව වෙත තිරු බදු ගෙවිය යුතුවේ. එම බදු ගෙවා මෙම වාහන පවරා ගැනීම ආර්ථික වශයෙන් ලාභදායී නොමැති බව නිරීක්ෂණය කරමි.

(II.) මෙම වාහන අධිකාරිය වෙත පවරා ගැනීමේ දී විශාල තීරුබදු මුදලක් ගෙවීමට සිදුවන බැවින් මේ පිළිබඳ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කර කටයුතු සිදු කරමි.

(ඉ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සියලුම කලාප / අංශවලට අයත් ධාවනය කළ නොහැකි තත්වයේ පවතින වාහන මේවන විට අපහරණය කිරීම සඳහා විධිමත් කමිටුවක් මඟින් තක්සේරු කර ඇති අතර එම අපහරණය කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි.

(ඊ). මහවැලි එවි කලාපය තුල ක්‍රියාත්මක කළුගල් කැණීම් ව්‍යාපෘති භූමි වසර ගණනාවකට පෙර සිට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධිමත් අනුමැතිය සහිතව බදු පදනම යටතේ මෙන්ම විධිමත් අනුමැතියකින් තොරව ද ව්‍යාපෘතිකරුවන් වෙත ව්‍යාපෘති සිදු කිරීම සඳහා බැහැර කිරීම සිදු කර ඇත.

එබැවින් එම ව්‍යාපෘති භූමි අදාල ව්‍යාපෘතිකරුවන්ගේ පෞද්ගලික වියදමින් අනුරේඛන සකස් කර ඉදිරිපත් කරන ලෙස ව්‍යාපෘතිකරුවන් දැනුවත් කර ඇත . අදාල අනුරේඛන ලැබීමෙන් පසු අදාල ව්‍යාපෘති භූමි සඳහා රජයේ තක්සේරුව ලබා ගැනීම සඳහා අංක RPM / T/ L/පොදු 44/ (45,05,16-කලුගල්) හා 2020.03.10 ලිපි මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව අනුරාධපුරය වෙත යොමු කර ඇත. තක්සේරු දෙපාර්තමේන්තු වෙතින් අදාල තොරතුරු මේ වනතුරු ලැබී නොමැති අතර අදාල තක්සේරු වටිනාකම ලැබීමෙන් පසු ව්‍යාපෘතිවලට අදාල බදු මුදල් ගණනය කර හිඟ බදු මුදලක් වේ නම් ඒවා අය කර ගැනිම සඳහා කටයුතු සිදු කරමී.

(උ) (i) එවි කලාපය තුල ක්‍රියාත්මක කැනීම් ව්‍යාපෘතිවලට අදාල කැනීම් පරිමාවන් පිළිබඳව තොරතුරු ලබා දෙන මෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් අංක RPM/T/L/පොදු 01-01-හා 02-2019. 02.14 ,2020.07.02, 2020.08.17 , 02 හා 2020.09.21දිනැති ලිපි මඟින් ඉල්ලීම් කර ඇති අතර එම තොරතුරු ලද පසු එම හිඟ බදු මුදල් ගණනය කර ඉදිරි කටයුතු සිදු කරමී.

(ii) අභ්‍යන්තර වක්‍රලේඛ අංක LUP/01/01/2019 – (i) – 1.8 වගන්තිය අනුව ව්‍යාපෘති භූමි සම්බන්ධව කොට්ඨාස මට්ටමින් නිරීක්ෂණ වාර්තා මා වෙත ලබාදෙන ලෙස අදාල කොට්ඨාස කලමණාකරුවන් දැනුවත් කර ඇත .

මෙම කැනීම් කටයුතු සම්බන්ධ විද්‍යාත්මක හා විශේෂඥ දැනුම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතු වන අතර එවි කලාපය තුල ක්‍රියාත්මක කැනීම් ව්‍යාපෘතිවලට අදාල කැණීම් පරිමාවන් පිළිබඳව තොරතුරු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් උක්ත ලිපි මඟින් ඉල්ලා ඇති අතර අදාල තොරතුරු ලැබීමෙන් පසු නිස්සාරණය කරනු ලබන ඛනිජ ප්‍රමාණය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා සැලසුම්) වෙත යොමු කරන බව නේවාසික ව්‍යාපාර කළමණාකාර එවි කලාපය මා වෙත වාර්තා කර ඇත.

(ඌ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි ඊ කලාපය හා ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අදාල තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත මේ වන විටත් යොමුකර ඇත. අනෙකුත් කලාප 02 වන එවි කලාපය හා එල් කලාපය වෙතින් මෙම තොරතුරු කඩිනමින් ලබා ගෙන කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරිමට කටයුතු කරනු ලැබේ.

(එ). ඉඩම්, රජයේ ඉඩම් වන අතර කළමනාකරණය හා පරිපාලනය සඳහා පමණක් මහවැලි අධිකාරිය වෙත බලය පවරා ඇත. ඒ අනුව මහවැලි අධිකාරිය සඳහා ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කර ඇති බල ප්‍රදේශයේ පවතින ඉඩම් වල මහවැලි අධිකාරියේ කාර්යාල පරිශ්‍ර පවත්වාගෙන යාම, සේවා

සැපයීමට අවශ්‍ය ගොඩනැඟිලි ඉදිකිරීම සහ ප්‍රජාවගේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පරිහරණ අයිතිය පවතින අතර එම ඉඩම් වල පරම අයිතිය මහවැලි අධිකාරිය සතු නොවේ.

එමෙන්ම සංවර්ධන කාර්යයන් සඳහා යොදාගනු ලබන ඉඩම්, මහවැලි ජනපදිකයින් හා ව්‍යවසායකයින් වෙත බැහැර කරනු ලබයි. මෙහිදී ගොවි පංතියේ පුද්ගලයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොඩ, වාරි, කෘෂිකාර්මික හා වර්ෂාපෝෂිත ඉඩම් නොමිලේ ලබා දෙන අතර ව්‍යවසායකයින් හා වැඩි ආදායම් කාණ්ඩයේ පුද්ගලයින් වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ හා ආයෝජන ඉඩම් ලෙස රජයේ තක්සේරුව මත බදු මුදල් අය කර හා නිවාස ඉඩම් ලෙස රජයේ තක්සේරුව අයකර බැහැර කිරීම් සිදු කරයි.

බදු පදනම යටතේ බැහැර කරන ඉඩම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් යොමු කිරීමෙන් අනතුරුව එක් ඉඩම් කොටසක් තක්සේරු කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත කර ඇත.

(ඒ). තලාව කොට්ඨාස කාර්යාලයේ නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි සඳහා වෙන වෙනම ලිපිගොනු පවත්වා ගෙන යනු ලැබේ. පවතින ප්‍රතිපාදන සීමාවන් නිසා වර්ෂ ගණනාවක සිට නිල නිවාස අලුත්වැඩියාව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දීමට නොහැකිවීම හේතුවෙන් අලුත්වැඩියා කටයුතු කිරීමට නොහැකි වී ඇත. එබැවින් සමහර නිල නිවාස අබලන් තත්ත්වයට පත් වී ඇති බව පිළිගනිමි. භාණ්ඩාගාරය වෙතින් අධිකාරිය වෙත ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන ලබා දෙයි නම් මෙම නිල නිවාස අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි බව ද දන්වමි.

(ii). නිල නිවාස 05 ක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බව වත්කම් ලේඛනයේ සඳහන් වේ. විධිමත් අනුමැතියකින් තොරව තැපැල් දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ අලුත්වැඩියා කරමින් පැවති නිල නිවාස පිළිබඳව තලාව පොලිසිය වෙත පැමිණිලි කර ඇති අතර එම අලුත්වැඩියා කටයුතු මේ වන විට නවතා දමා ඇත. අනෙක් නිල නිවස මහවැලි අධිකාරිය සතු වන අතර එය පොලිස් ස්ථානාධිපති (තලාව) විසින් භාවිතා කල ද මේ සඳහා මුදල් අයවීමක් සිදු නොවන බවද දන්වමි. තවද බාහිර පාර්ශවයන් වෙත නිවාස ලබාදීමේදී විධිමත් ගිවිසුම් නොමැති ගොඩනැගිලි පැවති බව පිළිගන්නා අතර මේ වන විට විධිමත් ලෙස ගිවිසුම් ගත වීමට කටයුතු කර ඇත.

<u>අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවක් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව</u>

(අ). අදාල කොන්ත්‍රාත්තුව 2017.12.23දින "ඉන්ඩිපෙන්ඩන්ට් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කොන්ත්‍රාත් ආයතනය" වෙත රු 4,861,105.50 .මුදලකට ප්‍රදානය කර ඇත. මෙහි දී කොන්ත්‍රාත් කාලය දින 150 ක් වූ අතර මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු ඉහත නම සඳහන් කොන්ත්‍රාත් ආයතනය විසින් 2017.12.05 දින ආරම්භ කර ඇත. අදාල කොන්ත්‍රාත් සමාගම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් වශයෙන් රු 1,458,331.65 ක මුදලක් ඉල්ලා තිබුණ ද එයින් රු. 243,051.56 ක අත්තිකාරම් මුදලක් පමණක් 2017.12.27 දින ගෙවා ඇත.

ඉහත කොන්ත්‍රාත්තුවේ වැඩ ප්‍රමාද වීම සම්බන්ධව 2018.03.29 දිනැති ලිපිය මඟින් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දන්වා ඇත. කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2018.05.06 දී අවසන් වීමට ඇති බැවින් කොන්ත්‍රාත්තුවට අදාල "කාර්යසාධන ඇපකරය " හා "වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට දැනුම් දී ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2018.09.15 දක්වා දීර්ඝ කර ඇත.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු අදාල දිනයට නිම කිරීමට නොහැකි වීම නිසා 2018.10.10 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර දෙන මෙන් 2018.07.09 දිනැති ලිපිය මඟින් ඉල්ලීම් කර තිබුණ ද 2018.09.20 දින දක්වා පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී . 2018.07.23 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙම කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය 18 % ක් තරම් වීම නිසා කොන්ත්‍රාත්කරුට හැකි ඉක්මණින් මෙම කටයුතු නිම කිරීමට උපදෙස් දී ඇත.

මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින් 2018.12.14 දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත්කරුට සති දෙකක් ඇතුලත වැඩ, නැවත ආරම්භ කිරීමට උපදෙස් දෙන ලදි. එහෙත් කොන්ත්‍රාත්කරු වැඩ නැවත ආරම්භ කිරීමට කටයුතු නොකිරීම නිසා 2019.03.14 දිනැති ලිපිය මඟින් මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවලංගු කිරීම සිදු කර ඇත. අධිකාරියට අයවිය යුතු මුදල් අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත.

(ආ) මෙම කොන්ත්‍රාත්තුව 2017.11.14 දින "ස්පයිරල් කන්ස්ට්‍රක්ෂන් ආයතනය " වෙත රු.4,843,185.50 ක මුදලකට ප්‍රදානය කරන තිබුණි. මෙහි කොන්ත්‍රාත් කාලය දින 150 ක් වූ අතර කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු 2017.12.06 දින ආරම්භ කර තිබුණි . 2017.12.17 දිනැති ලිපිය

මඟින් අත්තිකාරම් මුදලක් වශයෙන් රු.1,417,556.00 මුදලක් ඉල්ලා තිබුණ ද එයින් රු.1,414,555.65 මුදලක් පමණක් ගෙවා ඇත.

මෙම කොන්ත්‍රාත්තුව 2018.04.27 දිනෙන් අවසන් වීමට නියමිතව තිබූ අතර එම දිනට කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වීම නිසා දින 50 කින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර දෙන මෙන් 2018.04.22 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම් අනුව 2018.08.01 දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත් කාලය 2018.09.20 දින දක්වා දීර්ඝ කර ඇත. මෙම කොන්ත්‍රාත්තුවට අදාලව 2018.07.23 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙහි භෞතික ප්‍රගතිය 17 %ක පමණ වන හෙයින් ඉතා කඩිනමින් කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවසන් කරන ලෙස දැනුම් දී ඇත. 2018.09.12 දිනැති ලිපිය මඟින් "ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල" වෙත කාර්ය සාධන ඇපකර මුදල් අයකර ගන්නා ලෙස ද දැනුම් දී ඇත.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු තවදුරටත් ප්‍රමාදවීම නිසා 2018.12.11 දිනැති ලිපිය මඟින් සති දෙකක් ඇතුලත මෙම කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු නැවත ආරම්භ කරන ලෙසත් එසේ ආරම්භ කිරීමට අපොහොසත් වුවහොත් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සිදු කරන බවද දන්වා තිබේ .නමුත් කොන්ත්‍රාත්කරු හට මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීම නිසා 2019.03.14 දිනැති ලිපිය මඟින් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කල බව අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දී ඇත. අධිකාරියට අයවිය යුතු මුදල් අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග සඳහා මේ වන විට යොමු කර ඇත.

(ඇ). මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් කාලය අවස්ථා 05 ක දී දීර්ඝ කර ඇති අතර 2019.01.31 දින දක්වා වලංගුව පැවතුණි

ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව අත්තිකාරම් ඇපකරය හා කාර්ය සාධන ඇපකරයේ වලංගු කාලය ද 2018.12.28 දක්වා දීර්ඝ කර ඇත.

මෙම කොන්ත්‍රාත්තුව සඳහා අදියර හතරක් යටතේ බිල්පත් ගෙවා ඇති අතර එම වටිනාකම රු. 8,179,315.00 ක් වේ. එම ගෙවීම් වලදී වැඩ ආරම්භක අත්තිකාරම් මුදල 2,788,842.00 ක මුදලක් පියවා ගෙන ඇති අතර තවදුරටත් රු. 1,311,158.00 ක් අය කර ගත යුතුව ඇත. මෙම ඉදිකිරීම් පිළිබඳව අදියර පරීක්ෂා කිරීමේදී ලබා දී ඇති අත්තිකාරමට අදාල පියවා ගැනීමට හැකිවන පරිදි වැඩ කොටසක් ඔවුන් විසින් නිමවා ඇති බවට ද වැඩිදුරටත් දන්වමි.

(ඈ). මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා 2019 අප්‍රේල් මස 11 වන දිනැති ලිපිය මගින් 2019.04.25 වන දින කොන්ත්‍රාත්කරුට පැමිණෙන ලෙස දන්වා තිබුණ ද එම ආයතනය විසින් ඒ සඳහා සහභාගිවී නොමැති අතර එහි දුර්වල ප්‍රගතිය සම්බන්ධව කොන්ත්‍රාත්කරු වෙත අංක DDG/TS/CON/W/B/07 2019.05.22 හා 2019.06.06 දිනැති ලිපි මගින් ද දැනුම් දී ඇත.

අවස්ථා 03 කදී ඉදිරිපත් කල සාධාරණ හේතූන් සලකා බලා 2019.11.30 වන දින දක්වා මෙම කොන්ත්‍රාත්තුවේ කාලය දිර්ඝ කර. 2019 සැප්තැම්බර් 20 වන දින ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල මගින් කාර්යසාධන බැඳුම්කරය 2019.12.31 වන දින දක්වා දිර්ඝ කර ඇත.

2020.02.19 වන දින කොළඹ ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ප්‍රධානත්වයෙන් පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල හා කොන්ත්‍රාක්කරු සමග සාකච්ඡා කරගත් පරිදි සති 06ක කාලයක් තුල වැඩ නිම කිරීමට එකග විය.

නමුත් 2020 මාර්තු මස මුල්භාගයේ ලොව පුරා පැතිර ගිය මාරාන්තික කොරෝනා වසංගතය (COVID 19) නිසාවෙන් සියලු ව්‍යාපෘතින්හි වැඩ කටයුතු සිදුකර කරගෙන යාමට නොහැකි වූ අතර එය යථා තත්වයට පත්වීමට මාස 03 කට අධික කාලයක් ගත වූ නිසා ව්‍යාපෘතියේ වැඩ කටයුතු අදාල දිනට නිම කිරීමට නොහැකි වී ඇති අතර 2020 මැයි 14 වන දින කාර්යය සාධක ඇපකරය හා අත්තිකාරම් ඇපකරය අලුත් කිරීම සඳහා කොන්ත්‍රාත් ආයතනය වෙත දන්වා යවා ඇත.

කොරෝනා වසංගතයෙන් පසු නැවත ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීක් සමගම මෙම ව්‍යාපෘතියට අදාල අත්තිකාරම් ඇපකර හා කාර්යය සාධන ඇපකරය 2020.12.31 වන දින දක්වා දිර්ඝ කර ඊට අදාල ලියවිලි ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල මගින් මේ වන විට ලබා දී ඇත.

(ඉ). අදාල හයිඩ්‍රොලික් පද්ධතිය අලුත්වැඩියාවන් කිරීමට බලාපොරොත්තුවෙන් අදාල වාර්තා ඇස්තමේන්තු ගත වැඩ සැලැස්මට ඇතුලත් කලද ප්‍රතිපාදන වෙන්කිරීමේ සීමාවන් නිසා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම කාර්යය සිදු කර ගැනීමට නොහැකි වී ඇත.

(ඊ). අදාල ඉදිකිරීම් අපේක්ෂිත මට්ටමට නොපවතින නිසා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට යොමු කර ඇත.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කලමනාකරණ මට්ටමේ තනතුරු 35 න් 16ක් පුරප්පාඩු පැවතියද එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණ ද මැතිවරණ

කාලසීමාව තුලදී බඳවා ගැනීම් කටයුතු සිදු කිරිමට නොහැකි වීම මත ඉන් තනතුරු 12 ක් සඳහා වැඩ බැලීම, රාජකාරි ආවරණය,කොන්ත්‍රාත් පදනම, මත කාර්යය පැවරුම් පදනම මත හා ද්විතීයන පදනම මත නිලධාරින් පත් කිරිමෙන් පුරප්පාඩු තනතුරුවල රාජකාරි අණුබණ්ඩව ඉටුකර ගැනීමට කටයුතු සිදු කර ඇත.

2020.09.11 දින නැවතත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමණාරණ මට්ටමේ මධ්‍යම කළමණාකරණ මට්ටමේ හා මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු පවතින තනතුරු 54 ක් සඳහා අභ්‍යන්තරින් අයදුම්පත් කැඳවා ඇත. අදාල පත් කිරිම් මේ වන විට සිදු කර ඇත.

(ඌ). මෙම වාහන සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

අධිකාරියේ සතු බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වාහන

වාහන අංකය	කලාපය	ගන්නා ලද ක්‍රියාමාර්ග
65-2514	ප්‍රධාන කාර්යාලය	මෙම වාහන නැවත ලබා දෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලිපි මගින් දැනුවත් කර ඇත.
32-3261		
65-1604	බකමුණ	නේවාසික ව්‍යාපාර කළමණාකාර මොරගහකන්ද කලාපයට භාර දී ඇත.
32-3297	මොරගහකන්ද ව්‍යාපෘතිය	වාරිමාර්ග දෙපාර්ථමේන්තුවට පවරා දී ඇත.
251-1388	මොරගහකන්ද ව්‍යාපෘතිය	ව්‍යාපෘතිය ආරම්භයේදීම අදාල ආයතන වෙත පවරා දී ඇත. ලිපිගොණු ලේඛණාගාරයෙන් ලබාගෙන තොරතුරු සැපයිමට කටයුතු කරණු ලැබේ.
PD-4482		
PD-4483		
32-3271		
32-3341		
JF-3105	වලව කලාපය	මෙම වාහනය 2010 වසරේ දී මහවැලි අමාත්‍යාංශය වෙත තාවකාලිකව මුදා හැර ඇති අතර මේ වන විට අස්ථානගත වී ඇත.

(එ). නොච්චියාගම ගොවිපල භූමියෙන් අක්කර 43 ක කොටසක් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය පරිදි නේවාසික ව්‍යාපාර කළමණාකරු (එච් කලාපය) ගේ අංක RPM/T/L/NOG/CLO/ඩා.ඉ 95/ හා 2020.08.26 දිනැති ලිපිය මගින් එස්.ඩබ්ලිව් ගයාන් දවුලගල යන අය වෙත භුක්තිය භාරදී ඇත. බැහැර කරන ලද ඉඩම් කොටස මිනුම් කිරීමට ජ්‍යෙෂ්ඨ මිනුම්දෝරු අධිකාරි අනුරාධපුර වෙත අංක RPM/T/L/NOG/CLO/ඩා.ඉ 95/හා 2020.09.16 ලිපිය මගින් යොමු කර ඇත.

කලංකුට්ටිය ගොවිපල භූමියෙන් අක්කර 25 ක බිම් කොටසක් "සන්මික් හුඩ් පුද්ගලික සමාගම" වෙත භාරදීමට කටයුතු කර ඇත.

නිරාවිය ගොවිපලේ භූමියේ සංවර්ධනය නොකරන ලද බිම් කොටස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් මේ වන විට සිය වගා කටයුතු ආරම්භ කර ඇත.

(ඒ). ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා ජී.එස්.එම්.බී තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම අතර උක්ත කරුණ සම්බන්ධයෙන් ඇති වූ ගිවිසුමේ එකඟතාවය අනුව 2019.12.31 දින වන විට ගිවිසුම් ප්‍රකාරව ඉවත් කිරීමට අපේක්ෂිත වැලි කියුබ් ප්‍රමාණය කියුබ් 103,128 වූ අතර ඒ සඳහා රු: 61,876,800.00 ආදායමක් අපේක්ෂා කරන ලදී.

නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා පැමිණි විරෝධතා හේතුවෙන් වැලි ඉවත් කිරීමේ කටයුතු වලට ප්‍රථමව ගංවතුර ආරක්ෂණ වේල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම සිදු කරන ලදී. එමෙන්ම ප්‍රාදේශීය වැලි ව්‍යාපාරිකයින් හා සිවිල් සංවිධාන හා ගොවි සංවිධාන මගින් ඇති කළ විරෝධතා හේතුවෙන් 2019.07.08 වන දිනය වන විටත් වැලි කැණීම ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

ඒ අනුව, නේවාසික ව්‍යාපාර කළමනාකාරගේ අංක DDG/TS/GEN/04-2019 දරණ තාක්ෂණ සේවා අංශයේ වාර්තාව අනුව මුළු ව්‍යාපෘති කාලය තුල ඉවත් කරන ලද වැලි කියුබ් 39,206.04 ක ප්‍රමාණය ඉවත් කර ඇති අතර ඒ සඳහා රු: 23,523,624.00 ගාස්තුව අයකර ඇත.

ගිවිසුමේ අංක 04 ප්‍රකාරව වැලි නිධිය කැණීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉදිරියේදී කැණීම් කරනු ලබන වැලි කැණීම් සඳහා ඉඩම් පරිහරණ ගාස්තු වශයෙන් ගෙවිය යුතු ගාස්තුවට සුරක්ෂාවක් ලෙස රු: මිලියන 300.00 ක 04/2019 දරණ බැංකු ඇපකරය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තැන්පත් කරන ලද අතර, ඉවත් කර ඇති වැලි කියුබ් ප්‍රමාණය සඳහා ගාස්තු නිවැරදිව ගෙවීම් කරන ලද බවට

නේවාසික ව්‍යාපාර කළමනාකාරගේ RPM/D/L/CLO/91 දරණ ලිපියේ තහවුරුව අනුව හා බැංකු ඇපකරය නිදහස් කර ලබා දෙන ලදී.

භූමියේ පුනරුත්තාපනය වෙනුවෙන් ඇපකරයක් තබා ගැනීම පිළිබඳව ගිවිසුම්ගතව නොමැති අතර, භූමියේ පුනරුත්තනාපනය ව්‍යාපෘතිය අවසානයේ දී උපදේශන කමිටුවේ අනුමැතියට යටත්ව සිදුකල යුතු බව ගිවිසුම් අංක 14 යටතේ දක්වා ඇත.

(ඔ). 2018 වර්ෂයේ මැයි සිට විදුලිය ජනනය කලද 2019 වර්ෂයට අදාල 2018 දෙසැම්බර් මාසයේ ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරයි. ඒ වන විට මේ සම්බන්ධ අදාල විස්තර අප වෙත වාර්තා වී නොතිබුණ බැවින් එම ආදායම් ඇස්තමේන්තුව කිරීමට නොහැකි විය.

විදුලිබලාගාර නඩත්තු සඳහා මෙම අරමුදලින් කොටසක් වෙන් කිරීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබු බැවින් ඉදිරියේ දී අදාල අංශ දැනුවත් කර ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කරමි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා අධිකාරියේ ආදායම භාවිතා කල හැකි බැවින් ඒ අනුව අදාල වියදම් සිදු කර ඇත.

(ඕ). තලාව කොට්ඨාසයේ 420/421 ඒකකයේ තලාව මහවැලි කඳවුරු භූමිය තුල මහවැලි අධිකාරියේ සේවය කරන ලද නිලධාරි 44 දෙනෙකු H/EX/33 හා H/171 යන අනුරේඛනයට හා H/EX/45 යන අනුරේඛනයට අනුව 44 දෙනෙකු සඳහා 2009 වර්ෂයේ දී භාර දී ඇත. මුල් තේරීම් ලේඛනයේ නම සටහන් නොවූ 05 දෙනෙකු සඳහා ඉඩම් භාර දී ඇති බවට ලිපියේ සටහනට අනුව එම 05 දෙනාව ද 2003 වර්ෂයේ පවත්වා ඇති තේරීම් ලේඛනය පදනම් කරගෙන භාර දී ඇත. කැ.සි. 110135 පත්‍ර අංක 26 හි මූලික සිතියමට අනුව බිම් කැබලි 51 ක් වෙන් කර ඇති අතර, එම 44 දෙනාට එම කැබලි භාර දී ඇත. තවද මෙම ඉඩම් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දී ඇති බැවින් සම්පූර්ණ තක්සේරු මුදල් ගෙවා අවසන් වන තුරු ඔවුන් වෙත නිදහස් දීමනා පත්‍ර ලබාදීමට හැකියාවක් නොමැති බව දන්වමි.

සටහනට අනුව ඉඩම් කට්ටි වලින් 1571, 1582, 1588, 1598, 1600, 1572, 1591, 1573, 1606, 1554, 1549, 1548,1578 හා 1545 යන ඉඩම් කට්ටි අවිධිමත් ලෙස අන්සතු කර ඇති අතර එම ඉඩම්වල මුල් ඉඩම් ලාභියාගෙන් අවලංගු කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි.

ඉහත සඳහන් ලිපියේ සටහනට අනුව මෙම ඉඩම් ලාභීන් වෙනත් කලාපවල සේවය කරන බැවින් තවද මෙම ඉඩම් ලාභීන් වෙනත් ප්‍රදේශවල පදිංචිව සිටින නිසාත් ඔවුන් මෙම ඉඩම් සංවර්ධනය

කර නොමැති නිසාත් මෙම ඉඩම් සංවර්ධනය කරන ලෙසට හා හිඟ බදු මුදල් ගෙවන ලෙසත් ලිඛිතව දන්වා ඇත.

(ක). තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකාර බලප්‍රදේශය තුල පිහිටි කලුගල් කැණීමේ ව්‍යාපෘති සඳහා බැහැර කර ඇති ඉඩම් අතරින් කැණීම් බලපත්‍ර 08කට අදාල ව්‍යාපෘති වලින් ඉඩම් පරිහරණ ගාස්තු අයකර ඇති කියුබ් ප්‍රමාණය 8369.5ක් බව දක්වා ඇත . අදාල නියැදින් ගණනය කිරීම සිදුකර ඇත්තේ එම ව්‍යාපෘති කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධිමත් අනුමැතිය ලද වර්ෂවල සිට වේ. නමුත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඉඩම් පරිහරණ ගාස්තු අයකිරීම භූ විද්‍යා සමීක්ෂණ කාර්යංශය වෙත ගෙවනු ලබන කැණීම් පරිමාව මත පදනම්ව සිදුකල යුතු බව LUP/01/01/2019 චක්‍රලේඛය මගින් දක්වා ඇති අතර ඊට පෙර භාවිතා කරන ලද චක්‍රලේඛවල මෙම කරුණු දක්වා නොමැත . ඒ අනුව වරින් වර නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ අනුව හා එම කියුබ් ප්‍රමාණයන් ගණනය කරනු ලැබ ඇත්තේ 4/cs/3/10/පොදු යන චක්‍රලේඛය පදනම් කර ගෙන වන අතර ,ඒ අනුව චෝටර් ජෙල් කි.ග්‍රෑ 01 .කින් කලුගල් කියුබ් 2.5 ක් නිස්සාරණය කරනු ලබන බව නිගමනය කෙරේ.

LUP/01/01/2019 චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව මහවැලි එව් කලාපයේ කලුගල් කැණීමේ බලපත්‍ර ලබාදී ඇති ඉඩම් වලින් ඉඩම් පරිහරණ ගාස්තු අයකල යුතු කියුබ් ප්‍රමාණය පිළිබඳව තොරතුරු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙතින් ලබාගත යුතු බව දක්වා ඇති අතර ඒ අනුව මෙම ව්‍යාපෘති පිළිබඳ වරින් වර පැන නැගුන ගැටලු මත හා LUP/01/01/2019 චක්‍රලේඛය අනුව අදාල තොරතුරු ලබාගැනීම සඳහා චක්‍රලේඛය නිකුත් වීමට පෙර හා චක්‍රලේඛය නිකුත් වූ පසුවද RPM/T/L/පොදු,2019.02.14 ,2019.02.08 - 1,2-1-44/ ,2020.07.02 , 2020. 08. 17, 2020.09.21 ලිපි මගින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙතින් අදාල කියුබ් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඉල්ලා ඇත.

මේ වන තුරු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙතින් අදාල තොරතුරු මා වෙත ලැබී නොමැති අතර තොරතුරු ලද පසු එම හිඟ කියුබ් ප්‍රමාණයන්ට අදාලව ව්‍යාපෘතිකරුවන් වෙතින් අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදුකරනු ලැබේ.

(ග). කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය වලට අදාල රාජ්‍ය භාග ආදායම සම්බන්ධයෙන් වූ රදවා ගැනීමේ බදු සහනික (withholding tax) ලංකා විදුලි බලමණ්ඩලය මගින් ලබාගෙන ඇත.

(ව). මෙම අරමුදල බී හා සී කලාපවල ජනපදිකයන් හා වෙන් කල අරමුදලක් බැවින් එම කලාපවල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහනදායී පොලි අනුපාතයක් යටතේ ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් තීරණය කර තිබුණ ද පසුව එම අරමුදල් මහවැලි කලාපවල ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩ සටහන සඳහා එම අරමුදල් භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

(ශ). අදාල ආයතන වෙත ප්‍රතිපූර්ණය කිරීමට වරින් වර දන්වා ඇත. මෙම වටිනාකම්න් රුපියල් 3,472,883.18 ක මුදලක් 2020 වර්ෂයේ දී ලැබී ඇත.

(ට). ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කලාපවල පදිංචි කරන ලද ඉඩම් ලාභින් වෙත ලෝක ආහාර වැඩසටහන යටතේ ලබා දුන් ආහාර ගබඩා කිරීම සඳහා ඉදි කරන ලද ගබඩා ,එම වැඩසටහන අවසාන වීමෙන් පසු එම ගබඩා, වී ගබඩා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත ලබා දී ඇත. ඒ අනුව වී අලෙවි මණ්ඩලය විසින් ඔවුන් භාවිතා කරන මෙම ගබඩා විධිමත් පරිදි ඔවුන් වෙත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව වී අලෙවි මණ්ඩලය විසින් ඉල්ලනු ලබන වී ගබඩා සම්බන්ධ තොරතුරු අදාල කලාප වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එම තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තක්සේරු කර එම තක්සේරු වටිනාකම අය කර ගැනීමේ පදනම මත වී අලෙවි මණ්ඩලය වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කරනු ලැබේ.

කීර්ති බී. කොටගම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

පිටපත:- ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

ලේකම් - මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි

හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2019

V - කොටස

2019 වසර තුළ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

1.1 මූල්‍ය ප්‍රගතිය

දේශීය ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ඇස්තමේන්තු ගත වියදම - රු. මී	ව්‍යාපෘති කාල සීමාව
මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය	දේශීය අරමුදල	4910.00	2007-2020
රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය අරමුදල	1,100.00	2012-2021
වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය -එල් කලාපය	දේශීය අරමුදල	3,957.10	2012-2021
රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය අරමුදල	1,086.00	2012-2021
කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	දේශීය අරමුදල	225.00	වාර්ෂික (2019.01.01-2019.12.31)
බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)	දේශීය අරමුදල	935.49	2014-2020
හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම	දේශීය අරමුදල	825.00	2015- 2020

1.2 මහවැලි ව්‍යාපෘති

1.2.1 මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි 4,910
ව්‍යාපෘති කාලසීමාව : 2007-2020

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතට 1982 - 1986 කාලයේ ඉදිකරන ලද වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. (අ) මාදුරු ඔය දකුණු ඉවුර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ යටතේ කි. මී. 52 ක් වන ප්‍රධාන ඇල, කි. මී. 65 ක් වන ශාඛා ඇලවල්, කි. මී. 459 ක් වන බෙදාහැරීමේ ඇලවල්, කි. මී. 1,138 ක් වන කෙත් ඇලවල්, කි. මී. 54 ක් වන පරිවහන ඇලවල්, කි. මී. 80 ක් ග්‍රාමීය මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු, හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1981 – 1986 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය කිරීම. (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැපයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සහය ලබා දීම මෙන්ම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා (ඈ) යෝග්‍ය පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි 230 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට රු. මි 120 මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12.2019**
01	බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංසකරණය	8.5 කි.මී
02	කෙත් ඇල ඉදි කිරීම/ප්‍රතිසංසකරණය	68.20 කි.මී
03	සහභාගිත්ව කෙත් ඇල ප්‍රතිසංස්කරණ	4 කි.මී
04	ගොඩනැගිලි අළුත්වැඩියාව	4



1.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)

මූල්‍ය ප්‍රතිපාදන	: දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය	: රු.මි.935.49
ව්‍යාපෘති කාලසීමාව	: 2014-2020

පොලොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයන්හි මහවැලි බී කලාපය ආවරණය කරන සිංහපුර ඉහළ කොටසේ මහවැලිතැන්න සහ මල්වැන්න මහවැලි කලාප පිහිටා ඇති අතර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලැබේ. මෙම ප්‍රදේශයන්හි ඉකුත් දශක කිහිපයේ පැවති අභ්‍යන්තර අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් නැවත පදිංචි කරුවන් බොහෝමයක් අභ්‍යන්තරික වශයෙන් අවතැන් විය. එහි ප්‍රතිපලයක් ලෙස දල වශයෙන් නැවත පදිංචි කරවූ පවුල් 1200 ක් පමණ නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වෙත ගියහ.

අර්බුදකාරී වාතාවරණය සමනය වීමත් සමගම 2014 වර්ෂයේදී මෙම විෂේශ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859 ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) අවතැන් වූ පවුල් 859 ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය නැවත ස්ථාපිත කිරීම (ආ) දැනට පවත්නා වාරි පදනම් වූ හෙක්ටයාර 521 ක් කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම හා හෙක්ටයාර 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය නිරීම සහ (ඇ) මහවැලිතැන්න වැව හා අනෙකුත් වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත.

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි 45 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට රු. මි. 40 ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12.2019**
01	කෙත් ඇල ඉදි කිරීම	1.8 කිමී
02	බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම	1.3 කිමී
03	සපත්තුපාලම් ඉදි කිරීම	1



1.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි. 1,100
ව්‍යාපෘති කාලසීමාව : 2012-2021

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මෙම ප්‍රදේශයේ වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කෙරේ.

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 76 (සංශෝධිත) ක් වේ. 2019 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 53 ක් ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12.2019**
01	වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම	3.74 කි.මී වාරි ඇල මාර්ග
02	මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	09 මාර්ග අවසන් 01 මාර්ග සිදු කරමින්පවති 300 මී.කොන්ක්‍රීට් මාර්ග 04 කල්වර්ට් සම්පූර්ණ කර ඇත
03	පොදු ගොඩනැගිලි ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය	7 ගොඩනැගිලි
04	ආයතනික සංවර්ධන වැඩසටහන	39 වැඩසටහන් සිදුකර ඇත
05	කෘෂිකර්ම හා පශුසම්පත් සංවර්ධන වැඩසටහන	පවුල් 2500 සඳහා කෘෂිකර්ම ප්‍රවර්ධන වැඩසටහන





1.2.4 රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි. 1,086

ව්‍යාපෘති කාලසීමාව : 2012-2021

රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ මහ ඔය සහ පදියතලාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජලාශ සහ වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ මූලික අවධානය යොමු කෙරේ.මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වනුයේ (අ) කුඩා හා මධ්‍යම වැව් හා අමුණු පුනරුත්ථාපනය කිරීම (ආ) ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම (ඇ)කෘෂිකාර්මික නිෂ්පාදනය *50 %* වැඩි කිරීම (ඈ) පානීය ජල ළිං ඉදි කිරීම තුළින් ජල සැපයුම (ඉ) ළිං සහ සනීපාරක්ෂක සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙල (වැසිකිලි ඉදිකිරීම).

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 90 (සංශෝධිත) ක් වේ . 2019 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි 71 ක් ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12. 2019**
01	මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	5 මාර්ග ප්‍රතිසංස්කරණය
02	ගොඩනැගිලි ඉදිකිරීම	11
03	ඉඩම් සහ ඉඩම් සංවර්ධනය (වන්දි ගෙවීම්)	• 30 දළ මට්ටමේ කැබලි • 924 සමීක්ෂණ • අත්පත් කර ගැනීම කැබලි 08
04	කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන	පවුල් 3550 සඳහා ප්‍රවර්ධන
05	ආයතනික සංවර්ධන වැඩසටහන	70 වැඩසටහන්
06	ව්‍යාපාර සංවර්ධන වැඩසටහාන්	08 වැඩසටහන්
07	පරිසර	28 වැඩසටහන්

1.2.5 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි. 3,957
ව්‍යාපෘති කාලසීමාව : 2012-2021

අනුරාධපුරය , වව්නියාව,මුලතිව් හා ත්‍රිකුණාමලය යන පරිපාලන දිස්ත්‍රික්ක ආවර්ණය වන පරිදි මහවැලි කලාපයේ සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.අවතැන් පවුල් 6,788 ක් සඳහා ගෙවතු වගාව, වාරි ඉඩම් හා අවශ්‍ය භෞතික හා සමාජ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මේ යටතේ (අ) ගම්මාන 11 ක් තුල ගොවි පවුල් 6,788 ක් නැවත පදිංචි කරවීම (ආ) හෙ.4,187 කෘෂිකාර්ම ඉඩම් සංවර්ධනය කිරීම (ඇ) වෙළඳ පොල හා ගම්මාන මාර්ග ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම (ඈ) සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි.220 (සංශෝධිත) ක් වේ. 2019 වසර අවසන් වන විට රු. මි 179 ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12.2019**
01	ඉඩම් ලකුණු කිරීම හා මැනීම	1413 කට්ටි
01	වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම	46 නිර්මිත සහ කල්වර්ට්
02	ගොඩනැගලි ඉදි කිරීම	09 ගොඩනැගිලි
07	කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන	පවුල් 3,000 සඳහා ප්‍රවර්ධන වැඩසටහන



1.2.6 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි 825
ව්‍යාපෘති කාලසීමාව : වාර්ෂික

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන හුරුලුවැව, උඩවලව, මහවැලි කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර මාර්ග ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මී. 100 (සංශෝධිත) ක් වේ. 2019 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මී 82.46 ක් ඵලදායී ලෙස යොදවා ඇත.

අංකය.	විස්තරය	භෞතික ප්‍රගතිය **31.12.2019**
01	මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	90 % ප්‍රධාන ජලාශ 8න්

1.2.7 කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.180

ව්‍යාපෘති කාලසීමාව : වාර්ෂික (01.01.2019 – 31.12.2019)

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දේශීය කෘෂි ආනයනය අඩු කිරීමට හේතු වන දේශීය ආහාර බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පාදනය පූර්ණ වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

2019 වර්ෂය සඳහා කෘෂිකාර්මික ප්‍රමුඛතා වනුයේ ජාතික වී නිෂ්පාදනයට සියයට *20-23* අතර දායකත්වයක් සහතික කිරීම , වාරිමාර්ග ඉඩම්වල බෝග තීව්‍රතාව සියයට *190* දක්වා වැඩි කිරීම , උද්‍යාන විද්‍යාත්මක හා වෙනත් ක්ෂේත්‍ර භෝග සහිත වාරිමාර්ග ඉඩම්වල සියයට *25* ක බෝග විවිධත්වයක් ලබා ගැනීම , මහවැලි ගොවිපල අති නවීන තාක්ෂණයෙන් හා සංචාරක සිත්ගන්නා ස්ථාන ලෙස පවත්වාගෙන යාම , කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, රසායනික පොහොරවල කාර්යක්ෂමතාව වැඩි කිරීම , ගොවීන්ට වඩා හොඳ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම වේ. වැඩි දියුණු කරන ලද පශු සංවර්ධන වැඩපිළිවෙල, දියර කිරි නිෂ්පාදනය, කුකුළු නිෂ්පාදන, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 180 ක් වන අතර එයින් රු.මි 163.45 ක් මෙම කාලය වන විට උපයෝජනය කර ඇත.

කෘෂිකාර්මික භෝග වගාව

2018/2019 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 93,336 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දල වශයෙන් මෙ. ටො. 537,533 ක් විය 2019 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්63,358 වන අතර වාරතා වන වී නිෂ්පාදනය මෙ. ටො. 352,240 වේ. 2018/2019 මහ සහ 2019 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ. ටො. 889,773 වේ.

අනෙකුත් බෝග වගා කිරීම (අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පළතුරු,එළවළු සහ නිත්‍ය භෝග) අනෙකුත් ක්ෂේත්‍ර භෝග 14,142 හෙක් , පලතුරු 13,641 හෙක් සහ අනෙකුත් නිත්‍ය භෝග 5,157 හෙක් ලෙස වගා කර ඇත.

පශු සම්පත් සංවර්ධනය

2019 වර්ෂය පශුසම්පත් ප්‍රමුඛතා වනුයේ ,

- වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 25 දක්වා වැඩි කිරීම සහ ඉටු කිරීම සඳහා වන දායකත්වය වැඩි කිරීම ජාතික කිරි අවශ්‍යතාවය (ජාතික දායකත්වය 5%)
- වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් **8000** දක්වා වැඩි කිරීම සහ ජාතික දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය ඉහළ නැංවීම සිට **27%** දක්වා
- වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන **35** දක්වා වැඩි කිරීම
- වාර්ෂික විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය යුගල මිලියන **29** දක්වා වැඩි කිරීම
- පාසල් ළමුන් හා ප්‍රජාව අතර නැවුම් කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- සත්ව ජාන සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ලදායිතාව වැඩි කිරීම
- කාර්යක්ෂම හා පලදායී තාක්ෂණික ව්‍යාප්තිය සහ යෙදුම සහතික කිරීම

ඒ අනුව 2019 වර්ෂයේදී ,

නිෂ්පාදනය	ඉලක්ක	ප්‍රගතිය 31.12.2019
දියර කිරි	**32 ලි. මි**	25.51 ලි. මි
කුකුල්මස්	20 මෙ.ටො '000	12.31 මෙ.ටො '000
මිරිදිය මත්ස්‍ය	17 මෙ.ටො '000	36 මෙ.ටො '000
විසිතුරු මත්ස්‍ය	17 ජෝඩු මි.	29.83 ජෝඩු මි.

1.3 විශේෂ, ජයග්‍රහන හා ප්‍රගතිය 2019

1.3.1 මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය මහවැලි අධිකාරියේ පරිපාලනය යටතට පැවරීම.



මෙරට නව වාරි ශිෂ්ටාචාරයක පසුබිම සැකසූ මහවැලි මහ සංවර්ධන සැලැස්මේ අවසන් අදියර වශයෙන් ඉදිවූ විශාලතම බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වන මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය පරාක්‍රම සමුද්‍රය මෙන් හය ගුණයක් විශාල වන අතර අක්කර අඩි 666,000 ක ධාරිතාවකින් යුත් ජලාශ 02 කින් සමන්විත මොරගහකන්ද – කළුගඟ බහුකාර්ය ව්‍යාපෘතිය යටතේ උතුරු මහ ඇළ, වයඹ ඇළ, මිණිපේ ඇළ, ව්‍යාපෘති ඇතුළු වාරි ව්‍යාපෘති රැසක් කි්‍රයාත්මක වන අතර වයඹ, උතුරු මැද, මධ්‍යම හා නැගෙනහිර පළාත්වල විශාල ගොවි ජනතාවකට එමගින් ප්‍රතිලාභ හිමිවනවා මෙන්ම පානීය ජල අවශ්‍යතා ද සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

මොරගහකන්ද – කළුගඟ ව්‍යාපෘතියෙන් මෙගාවොට් 25 ක විදුලිබල ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කෙරෙන අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය මෙන්ම, සෘජු හා වක්‍ර රැකියා උත්පාදන අවස්ථා ඉහළ නැංවීම ද මෙම ව්‍යාපෘතියේ සුවිශේෂී ප්‍රතිලාභ වෙයි.

මෙම ජලාශ 02 , ජල විදුලි බලාගාරය, ලග්ගල හරිත නගරය සහ අඹන් නගරය ඇතුළු ජනාවාස ප්‍රදේශයන්හි පරිපාලන හා සංවර්ධන කටයුතු මෙම වසරේ සිට මහවැලි අධිකාරිය යටතේ පවත්වාගෙන යාම සඳහා පවරා දෙන ලදී.

1.3.2 කෘෂිකර්මාන්තය සඳහා මහවැලි දායකත්වය





කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව, දේශීය කෘෂිකර්මාන්තය සඳහා මහවැලි කලාප ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. 2019 වර්ෂයේදී වී නිෂ්පාදනයෙන් 23% ක් ද, සෝයා බෝංචි වලින් 96% ක් ද රටකජු නිෂ්පාදනයෙන් 5% ක් ද සහ මිරිස් සඳහා 7% ද බඩඉරිඟු සඳහා 6% ක් සහ ලොකු ලූනු නිෂ්පාදනයෙන් 40%ක් වශයෙන් ජාතික ආහාර සුරක්ෂිතතාවය සඳහා මහවැලි කලාප විසින් දායකත්වය ලබාදෙයි.

1.3.3 2019 වර්ෂයට අදාළ මහවැලි ක්‍රීඩා උළෙල මහවැලි ඩී කලාපයේ පැවැත්වීම සහ එයට සමගාමීව ඩී කලාපයේ මහවැලි ක්‍රීඩාංගනය විවෘත කිරීම






ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක්ම ඉකුත් දශක 03 කට අධික කාලය තුළදී මෙරටට දායාද කිරීමට සමත් වූ ක්‍රීඩා උළෙළක් වන මහවැලි ක්‍රීඩා උළෙළ 1986 දී ආරම්භ කරන ලද මහවැලි බල ප්‍රදේශයේ ජීවත්වන ගොවීන්ගේ දරුවන් අතර ක්‍රීඩාව නංවාලීම සඳහා අවශ්‍ය වන මහවැලි ක්‍රීඩා උළෙල 31 වන වරටත් 2019 සැප්තැම්බර් 09 දින තුළ මහවැලි ඩී (මැදිරිගිරිය) කලාපයේදී මහවැලි ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.

ජාතික ක්‍රීඩා උළෙළට පසුව මෙරට පැවැත්වෙන විශාලතම ක්‍රීඩා උළෙළ ලෙසටත් මහවැලි ක්‍රීඩා උළෙළ හැඳින්විය හැකි අතර මෙවර මෙම ක්‍රීඩා උළෙල සඳහා කලාප 10 ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වන අතර ඉසව් 41 ක් යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 3000කට අධික පිරිසක් තරග වදින ලදි.

අන්තර්ජාතික මලල ක්‍රීඩා පිටියේදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විශිෂ්ට දස්කම් දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කිහිප දෙනෙකුම බිහි වූයේත් මහවැලි ක්‍රීඩා උළෙළ තුළින්ය. එම පිරිස අතරට ශ්‍රියානි කුලවංශ, සුමේධ රණසිංහ, ශ්‍යාමලී ලක්මිණි, කසුන් කල්හාර, දිනුෂා සෙනෙවිරත්න, ගයාන් සමීර, සොනාලි වීරසේකර, ඉසුරු සඳරුවන්, ප්‍රේමසිරි රත්නායක, සමන් කුමාර, ඩී. ඒ. ඉනෝකා, දිනිඳු චතුරංග සහ ගයන්තිකා තුෂාරි අයත්ය.

මීට අමතරව වෙනත් ක්‍රීඩා මගින් අන්තර්ජාතිකව ශ්‍රී ලංකාව නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් ද මහවැලි ක්‍රීඩා උළෙළේදී දස්කම් දක්වා තිබේ. දිල්රුක්ෂි රූපසිංහ (මලල ක්‍රීඩා / කබඩි), ඉන්ද්‍රාණි සමරරත්න (දැල්පන්දු), ජයන්ති මල්කාන්ති (වොලිබෝල්), යූ.ඩී. ශ්‍රියාලතා (පාපැදි), රේණුකා අබේගුණවර්ධන යාපා (වොලිබෝල්), ලලනි ප්‍රියංගා (දැල්පන්දු), තරංගා සෙව්වන්දි (වොලිබෝල්), ජනක ප්‍රසන්න, අශේන් දිල්ෂාන්, ටී.බී. එන්. සඳරේණු, එස්. එම්. අත්තනායක (කබඩි), ඩී.කේ. ඉන්දික, ශ්‍රියන්ත ගුණවර්ධන (කෝ.කෝ), පී.ජී. ලක්ෂ්මි, විමල් රෝහණ, ප්‍රභාත් නිශාන්ත, ඒ.ඩී.බී.චරිත්, වාසනා දිල්රුක්ෂි, කෝකිලා දිසානායක, නදිකා කුමාරි, එම්. කේ. බණ්ඩාර, ඉනෝකා වීරසිංහ සහ එස්. ලුපා දිල්හානි (කබඩි).

1.3.4 මහවැලි ව්‍යවසායකත්ව සම්මාන උළෙල සාර්ථකව පැවැත්වීම





මහවැලි ව්‍යාපාරය යටතේ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර්මාන්ත මඟින් රටේ සංවර්ධන ක්‍රියාවලියට ලබාදී ඇති සුවිශේෂී දායකත්වය අගය කිරීම සඳහා ‘මහවැලි ව්‍යවසායකත්ව ජනාධිපති සම්මාන උළෙල 2019’ 2019 ඔක්තෝබර් 01 දින BMICH හිදී පැවැත්විණි. එහිදී කාණ්ඩ 09 යටතේ සම්මාන ලබා දෙන ලදී. ඒ අනුව මහවැලි බල ප්‍රදේශයේ තම ආයෝජන කටයුතු සිදුකරන ව්‍යාපාරිකයින් අතරින් හොඳම ව්‍යාපාරිකයින් තිදෙනාට රන්, රිදී සහ ලෝකඩ පදක්කම් ප්‍රදානය කරන ලද අතර තවත් ව්‍යාපාරිකයින් 34 දෙනෙක් සඳහා සම්මාන ප්‍රධානය කරන ලදී .

1.3.5 මහවැලි හෙළ බොජුන් හල් මහවැලි බී කලාපයේ ආරම්භ කිරීම

මොරගහකන්ද, වැලිකන්ද සහදෙහියත්තකන්ඩිය වෙළඳ භාණ්ඩ අලෙවිසැල් සමඟ ‘‘මහවැලි හෙළ බොජුන් හල්’’ 03 පිහිටුවන ලදී. නව අලෙවිසැල් දෙකක් නිම කර ඇති අතර තවත් යෝජිත අලෙවිසැල් තුනෙන් එකක් ඉදිවෙමින් පවතී.





1.3.6 සී කලාපයී " මංසල " සහ ඩී කලාපයේ බිසෝපුර යන සංචාරක බංගලා විවෘත කිරීම.

සංචාරක බංගලා අලුත්වැඩියා කිරීම් යටතේ මහවැලි සී කලාපයේ " මංසල " සහ ඩී කලාපයී බිසෝපුර යන සංචාරක බංගලා මේ වසරෙදි විවෘතවී කරන ලදී. ඒ අනුව නවීන ගෘහ භාණ්ඩ සහිත සංචාරක බංගලා 09 ක් අලුත්වැඩියා කිරීම මේ වන විට අවසන් කර ඇති අතර තවත් සංචාරක බංගලා 03 ක් ප්‍රතිසංස්කරණය වෙමින් පවතින අතර සංචාරක බංගලා 5 ක් අලුත්වැඩියා කිරීමකින් තොරව නිම කර ඇත. අන්තර්ජාල වෙන්කරවා ගැනීම සඳහා බංගලා 08 ක් දැනටමත් ලබා ගත හැකි විය.

1.3.7 මහවැලි ජාන පදිකයින් සඳහා ඉඩම් ඔප්පු ලබාදීම

කලාපය	ඉලක්කය	අවසරපත්‍ර	ප්‍රදානපත්‍ර	දීර්ඝ කාලීන බදුකර	විහාරස්ථාන	වෙනත් (නිවාස දීමනාපත්‍ර/ රාජ්‍ය ආයතන)	එකතුව
බී	7500	6130	683	6	8	2	6829
සී	9500	5433	3851	-	13	22	9319
ඩී	1600	965	621	-	2	-	1588
එච්	6500	627	890	2	3	204	1726
එල්	3600	303	1841	-	-	-	2144
මොරගහකන්ද	1500	490	581	2	2	1	1076
වික්ටෝරියා	600	-	35	1	1	3	40
හුරුළුවැව	1000	306	350	90	3	47	796
වලව	6500	1394	3500	8	-	3	4905
රඹකැන්ඔය	1700	1489	-	-	2	7	1498
එකතුව	**40,000**	**17,137**	**12,352**	**109**	**34**	**289**	**29,921**

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

2.2.1 ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති

1. මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය
2. කිවුල්ඔය එකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය
3. වලව දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය
4. කැළණි ගඟ මහවැලි ගඟට හැරවීමේ ව්‍යාපෘතිය
5. කොත්මලේ ජලාශ වේල්ල ඉස්සීමේ ව්‍යාපෘතිය

2.2.2 අභියෝග

1. භාහිර පරිසරය

ගෝලීයකරණය බොහෝ රටවල වෙනසෙහි ප්‍රධාන උත්ප්‍රේරකය බවට පත්ව ඇත. එමගින් නව අවස්ථා, නව වෙළඳපල සහ නව ධනය ලබා දෙයි. එහිදී විශේෂයෙන් ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම කෙරෙහි රජයේ අවධානය යොමුවීම ප්‍රධාන වේ.. ග්‍රාමීය අංශයේ ජීවත්වන බහුතරයක් කෘෂිකර්මාන්තයේ නියැලී සිටින සංවර්ධනය වෙමින් පවතින රටවල ජලය ප්‍රධාන සාධකයක් වන වතර සීග්‍ර නාගරීකරණය මගින් වැඩි ජල සැපයුමක් සඳහා ප්‍රවේශය ඉල්ලා සිටී.

ගෝලීය අවධානය ආරක්ෂිත ජලය කෙරෙහි අවධානය යොමු කර ඇත අතර ජල සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංසදයේ දී, ප්‍රතිපාදන වෙන් කිරීම සහ කළමනාකරණය ආඩම්බරයට කරුණක් වී ඇති අතර එය වැදගත් ප්‍රමුඛතාවයක් ලෙස විනිශ්චය කරනු ලැබේ. බොහෝ ආසියානු රටවල් දැනටමත් ජල කළමනාකරණය හා ප්‍රතිපාදන සම්බන්ධයෙන් නව රෙගුලාසි හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාව ද එවැනි නීති හඳුන්වාදීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර එහිදී මහවැලි අධිකාරිය ප්‍රධාන කොටස් කරුවෙකු වේ.

2. නව තාක්ෂනය

මෑත වසරවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්හි වේගවත් සංවර්ධනයත්ක් ඇති උවත් ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා විශේෂයෙන් ජල කළමනාකරණය, ගංවතුර පාලනය සහ නියහ කළමනාකරණය සඳහා තවමත් එය ප්‍රසස්ථ ලෙස යොදා ගෙන නොමැත. යාවත්කාලීන හා උසස් තත්ත්වයේ දත්ත සුදානම් වීම ස්වාභාවික සම්පත් කළමනාකරණයට සෘජුවම සහාය වන අතර නිදසුනක් ලෙස සූදානම් සන්නිවේදනයක් සහ එවැනි දත්ත වලට ප්‍රවේශ වීම මගින් වෙළඳපල මත පදනම් වූ භෝග වගා කිරීම , ප්‍රවර්ධනය කරන ප්‍රශස්ථ ඉඩම් පරිහරණ පද්ධති සංවර්ධනය කිරීමට උපකාරී වන අතර එමඟින් ජලය ඉතිරි වේ.

3. පර්යේෂණ හා සංවර්ධන

ජල සම්පත් කළමනාකරණයේ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය මෑත අතීතයේ දී බොහෝ සන්ධිස්ථාන කරා ළඟා වී තිබේ. අධිකාරියේ වර්තමාන මෙහෙවර ඉදිකිරීම් අංශවලට පමණක් සීමා වී ඇති අතර ස්වාභාවික සම්පත් කළමනාකරණයට පමණක් සීමා නොවන අතර, එබැවින් අයවැය අවහිරතා වැඩි වන සන්දර්භයක් තුළ ස්වාභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ නව සංවර්ධන මෙවලම් භාවිතා කිරීමේ විෂය පථය මහවැලි අධිකාරිය තුළ සීමිතය.

4. ජන විකාශ වෙනස

වර්තමාන ප්‍රවණතා අනුව නාගරික ප්‍රදේශවලට සහ කලාපීය වර්ධන මධ්‍යස්ථාන වෙත සංක්‍රමණය වීමත් සමඟ ජනගහන සංඛ්‍යාලේඛන ව්‍යාප්තිය ද වෙනස් වෙමින් පවතී. මේ අනුව ජන ගහනයෙන් විශාල පිරිසක් නාගරික ප්‍රදේශවල සිටිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජනගහනයේ තවත් කොටසක් විශාල වශයෙන් අඩු ආදායම්ලාභීන් අතර වන අතර එමගින් ස්වාභාවික සංරක්ෂණය සඳහා ප්‍රධාන වශයෙන් වෙන් කර ඇති රජයේ වෙන් කිරීම් භාවිතය සහ ජලයේ ගුණාත්මකභාවය සංරක්ෂණය කිරීම විශාල ගැටලුවක් ලෙස සලකනු ලබන්නේ ඒ සඳහා ඔවුන් දක්වන සෘජු බලපෑම සැලකිල්ලට ගනිමිනි. එහි ප්‍රතිලයක් වශයෙන්, රටේ ජල සැපයුම් සඳහා වැඩිවෙමින් පවතින බහු-පරිශීලක ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ජල

ප්‍රමාණයක්, පිළිගත හැකි ගුණාත්මකභාවයකින් යුත් ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් වී තිබේ.

5. දේශගුණික විපර්යාස සහ ආපදා කළමනාකරණය

දේශගුණික විපර්යාස මධ්‍යම මට්ටමේ සංවර්ධිත රටවලට අභියෝගයකි, විශේෂයෙන් 70% කට වඩා ග්‍රාමීය ප්‍රජාවක් සිටින කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වලින් හෙබි කුඩා දූපතක් දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට බෙහෙවින් ගොදුරු වේ. මෑත අත්දැකීම් සමඟ අධික ගංවතුර හේතුවෙන් බොහෝ ජල මාර්ග, ජල කඳ සහ වාරිමාර්ග යටිතල පහසුකම් වලට හානි සිදුවිය. මේ අතර නියඟය නියත වශයෙන්ම දැඩි ලෙස බලපා ඇති අතර එමඟින් බොහෝ ප්‍රදේශයන්හිබෝග පාඩු සිදු වේ. මේ අනුව, දේශගුණික විපර්යාසයේ බලපෑම සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න කෘෂිකාර්මික අංශය විශාල අභියෝගයකට මුහුණ දෙයි

6. විමධ්‍යගත සංවර්ධන තීරණ ගැනීම

කළමනාකරණ ව්‍යුහයන් හා කාර්යයන් තාර්කිකව වෙනස් කිරීමේ ක්‍රියාවලියක් 1980 දශකයේ සිට ජාතික මට්ටමින් සිදු වෙමින් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයත් සමඟ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කි්‍රයාත්මක කිරීමත් සමඟ සංවර්ධන කළමනාකරණ තීරණ ගැනීමේදී විමධ්‍යගත කිරීමේ යාන්ත්‍රණ ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රදේශ සභා පිහිටුවීම හා ශක්තිමත් කිරීමත් සමඟ රට පුරා වෙනස්කම් අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. මහවැලි අධිකාරිය මේ වන විට රේඛීය ආයතන වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල / ප්‍රදේශ් සභා වැනි විශේෂිත රේඛීය ආයතන විසින් සිදු කරනු ලබන සේවාවන්ට සමානව සේවා සැපයීමේ කටයුතු මේ වන විට සිදු කරන නමුත් සම්බන්ධීකරණයේ අඩුපාඩු, කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් නොමැතිකම හේතුවෙන් සේවා මට්ටම සෑහීමකට පත්විය නොහැකි බව පෙනේ.

03. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

විස්තරය	අය වැය ප්‍රතිපාදන 2019	වියදම (2019.12.31)	භෞතික ප්‍රගතිය
මහවැලි ව්‍යාපෘති	**940.00**	**708.92**	
මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (ඒ.අ)	230.00	120.00	95%
බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ)	45.00	40.00	80%
රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ)	75.00	53.00	75%
රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ)	90.00	71.00	91%
වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - එල් කලාපය (ඒ.අ)	220.00	179.00	75%
හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම (ඒ.අ)	100.00	82.46	90%
කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ)	180.00	163.45	90%
පරිපාලන හා නඩත්තු (ඒ.අ)	**1,370.00**	**1,277.84**	
එකතුව	**2,310.00**	**1,986.76**	